

වාර්ෂික වාර්තාව 2022

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

වාර්ෂික වාර්තාව

2022

සැලසුම් හා ප්‍රගති කොට්ඨාශය

සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02

+94 11 232 7500 / 2 389 502

planning.nhda@gmail.com

www.nhda.gov.lk

පටුන

සභාපති පණිවිඩය i

සාමාන්‍යාධිකාරී පණිවිඩය III

හැඳින්වීම 1

දැක්ම 1

මෙහෙවර 1

අරමුණු 1

පරමාර්ථ 1

සංස්ථාපිත තොරතුරු 2

අධ්‍යක්ෂ මණ්ඩලය 3

සංස්ථාපිත කළමනාකරණය 4

සංස්ථාපිත පාලනය 6

අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම 6

විගණන කළමනාකරණ කමිටුව 6

මාසික ප්‍රගති සමාලෝචනය 6

අභ්‍යන්තර පාලනය 7

විධායක කළමනාකරණය 7

අවදානම් කළමනාකරණය 7

පාරිසරික ගැටළු 9

ආයතනයේ සංවිධාන ව්‍යුහය 10

ප්‍රධාන ක්‍රියාකාරකම් 11

මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය 13

නිවාස සංවර්ධන කොට්ඨාශය 13

“ සැමට නිවහන් ” නිවාස ආධාර වැඩසටහන 13

“ සැමට නිවහන් ” විසිරි නිවාස ණය වැඩසටහන 13

වැඩි දියුණු නිවාස වැඩ සටහන 14

ඉන්දියානු ආධාර ආදර්ශ ගම්මාන වැඩ සටහන 14

දේපළ කළමනාකරණ කොට්ඨාශය 14

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත දීමනාපත්‍ර ලබා ගත් ඉඩම් - 2022 15

වර්ෂය තුළ පවරා දුන් ඉඩම් විස්තරය 16

ඉඩම් වන්දි ගෙවීම 16
ජනවාරි සිට දෙසැම්බර් දක්වා මැනුම් 16
ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය 17
නගමු පුරවර - 2022 (මුදල් වෙන් කිරීම - රු. මිලි. 100 17
නගමු පුරවර (අවිච්ඡේද) 17
විශේෂ ව්‍යාපෘති - 2022 (අභ්‍යන්තර උත්පාදන යටතේ සිදු කර ඇති) 18
පෙර විකුණුම් මහල් නිවාස ව්‍යාපෘති 19
රාජ්‍ය පෞද්ගලික ඒකාබද්ධ නිවාස ව්‍යාපෘති 19
මධ්‍යම පාන්තික නිවාස වැඩසටහන 20
ප්‍රසම්පාදන කටයුතු 20
ව්‍යාපෘති සඳහා සැළසුම් ඇඳීම 21
සහාධිපත්‍ය දේපළ 22
පොම්පාගාර හා විදුලි නඩත්තු කටයුතු 22
මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශය 22
2022.12.31 දිනට භෞතික කාර්ය මණ්ඩල සාරාංශය 23
කාල සීමාවට අදාලව සිදුකරන ලද බඳවාගැනීම් 23
මානව සම්පත් කළමනාකරණ අංශයේ සාමාන්‍ය කාර්යභාරය 24
දෛනික කාර්යයන්ට අමතරව සිදුකරන ලද විශේෂ කාර්යයන් 25
මානව සම්පත් කළමනාකරණයට අදාල කාර්යයන් ඉටුකිරීමේදී මුහුණ දීමට සිදුවූ අභියෝග 25
අභියෝග වලට මුහුණ දීම සඳහා ක්‍රියාත්මක කලයුතු යෝජනා 25
පාලන අංශය 26
පාලන අංශය යටතේ ක්‍රියාත්මක සේවාවන් 26
මාණ්ඩලික නිවාස ණය අංශය 28
නිවාස ණය දෙනු ලබන අරමුණු 29
මාණ්ඩලික නිවාස ණය විෂයට අදාල තොරතුරු 29
ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග 29
ඉලක්ක කරා ළඟාවීමේදී මුහුනපෑමට සිදුවූ ගැටළු 29
පුහුණු අංශය 30
විනය අංශය 31

ආරක්ෂක අංශය 32
සම්පාදනය කල ඉලක්කඃ 32
ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග හා ප්‍රතිඵල 32
ජා. නි. සං. අධිකාරියේ පුස්තකාලය 33
මුදල් කොට්ඨාශය 34
මුදල් කොට්ඨාශයේ කාර්යභාරය 34
නීති කොට්ඨාශය 34
ඔප්පු නිකුත් කිරීමේ ප්‍රගතිය 35
සැලසුම් හා ප්‍රගති කොට්ඨාශය 35
සැලසුම් හා ප්‍රගති අංශය 35
ප්‍රගති සමාලෝචනය හා මෙහෙයවීම 35
පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න හා පිළිතුරු 35
සෙවණ ලොතරැයි අලෙවි ප්‍රවර්ධනය 36
ව්‍යාපෘති යෝජනා 36
1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය 36
ජනතාවගේ තොරතුරු ලබාගැනීමේ අයිතිය තහවුරු කිරීම 36
සංචාරක බංගලා වෙන් කිරීම හා පරිපාලන කටයුතු 36
සැමට නිවහන සංවර්ධන වැඩසටහන -2022/12/31 දිනට කාර්යසාධනය 37
ප්‍රවාහන අංශය 38
2022 - 12 -31 දිනට ප්‍රවාහන සංචිතය 38
සැපයුම් අංශය 39
අභ්‍යන්තර විගණක කොට්ඨාශය 41
තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය 42
සෙවණ මාධ්‍ය ඒකකය 42
2022 ආදායම් සහ ලාභ 42
මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය 44
නිවාස සංවර්ධනය 44
අයකිරීම් ක්‍රියාකාරිත්වය 45
නිවාස ණය - උපහාර ණය හා විසිරි ණය-2022 45
ග්‍රාමීය කුලී/ නාගරික කුලී/ දේපල ආදායම් - 2022 46

මූල්‍යමය ප්‍රකාශන 47
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 47
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය 48
ගිණුම් ප්‍රතිපත්ති 49
මූල්‍ය ප්‍රකාශන වල සටහන් 57
විගණකාධිපති වාර්තාව 88

සභාපති පණිවිඩය



ගෝලීය වශයෙන් ව්‍යාප්තවූ කොවිඩ් 19 වසංගතය හා එහි ප්‍රතිඵලයක් ලෙස පසුව රටතුල ඇතිවූ ආර්ථික හා පරිපාලන අර්බුද හමුවේ ආයතනයක් ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඉතිහාසයේ තීරණාත්මක හා අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් පසු කරමින් සිටින මොහොතක 2022 වර්ෂය ආයතනයේ අදුරු කාල පරිච්ඡේදය අවසන් කර මූල්‍ය ස්ථාවරත්වයක් සහිතව ස්ථීර අඩිතාලමක් දැමූ වර්ෂයක් ලෙස නිහතමානීව සියළු දෙනාට සතුටුවිය හැකි වසරකි.

ශ්‍රී ලාංකික ජන සමාජයේ සෑම පුරවැසියෙකුටම නිවසක් හිමිකර දීමේ උදාර අරමුණ යථාර්ථයක් බවට පත් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී පුරෝගාමී රාජ්‍ය ආයතනය වශයෙන් කටයුතු කරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය "සැමට නිවහන" වැඩසටහන තුලින් 2022 වර්ෂය තුල නිවාස 6,490 ක වැඩ අවසන් කර අඩු ආදායම්ලාභී පවුල් 6,490 කට ස්ථීර නිවාස වල පදිංචි වීමට අවස්ථාව උදාකර දීමට හැකිවිය.

අසීරු අවස්ථාවේ වුවද මහා භාණ්ඩාගාරය මගින් ලබාදුන් රුපියල් මිලියන 1740.0 ක ප්‍රතිපාදන සැලසුම් කල පරිදි දුගී දුප්පත් හා අඩු ආදායම්ලාභී පවුල් වල නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා 100% ක්ම යෙදවීමට හැකිවීම සුවිශේෂී ජයග්‍රහණයකි. රාජ්‍ය භාණ්ඩාගාරය මගින් ලාබාදෙනු ලබන ප්‍රතිපාදන වලට පමණක් සීමා නොවී වර්ෂය තුල ණය ආපසු අයකිරීම් හා දේපළ අළෙවි ආදායම් වලින් රු.මි. 3004.4 ක් උපයාගැනීමට හැකිවීමද මෑත ඉතිහාසයේ ලැබූ විශාල ජයග්‍රහණයකි. ආයතනයේ පුනරාවර්තන වියදම් සියල්ල අභ්‍යන්තරිකව එකතු කල අරමුදලින් යෙදවීමෙන් අනතුරුව සංවර්ධන වැඩසටහන් සඳහා වර්ෂය තුල රු.මි. 436.8 ක් ආයෝජනය කිරීමට හැකිවිය. එමෙන්ම ආයතනය මුහුණදී සිටි මූල්‍ය අස්ථාවරත්වයට හා සේවක වැටුප් ගෙවීමට පවා නොහැකි වේයැයි පැවති අවිනිශ්චිතභාවයට පිළියම් යෙදීම මගින් මූල්‍ය ස්ථාවරත්වයක් ඇති කිරීමත් වසර ගණනාවක් තිස්සේ විසඳුම් නොමැතිව පැවති සේවක ගැටළු වලට ධනාත්මක විසඳුම් ලබාදීමේ වැඩපිළිවෙලකට යොමු වීමට හැකි වීමත් ගරු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාතුමා හා ගරු රාජ්‍ය අමාත්‍යවරුන් දෙපලගේ නායකත්වය හා මගපෙන්වීමේ ප්‍රතිඵලයකි. එමෙන්ම නිවාස සංවර්ධන ක්‍රියාවලිය හා සමගාමීව ප්‍රතිලාභී පවුල් වල දේපළ අයිතිය තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වැඩසටහන තුලින් සින්නක්කර ඔප්පු 1,657 ක් පිරිනැමීමට හැකිවිය.

මෙම අභියෝගාත්මක අවස්ථාවේ නොයෙකුත් අසීරුතා මැද ආයතනයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවී කටයුතු කල කාර්යය මණ්ඩලයේ සියළු දෙනාටත් නිරතුරුවම අභියෝගාත්මක තීරණ ගනිමින් ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් කැපවී කටයුතු කල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ටද මාගේ අවංක ස්තුතිය පුදකරමි. අවසාන වශයෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාතුමා, අමාත්‍යාංශයේ ලේකම් සහ අමාත්‍යාංශයේ අනෙකුත් සියළුම නිලධාරීන් හට ඔවුන්ගේ මෙහෙයවීම, මගපෙන්වීම සහ සහයෝගීතාවය සඳහා ස්තුති කිරීමට කැමැත්තෙමි.

රජීවිසිරි සූරියආරච්චි
සභාපති

සාමාන්‍යාධිකාරී පණිවිඩය



ගෝලීයව සෑම රටක්ම වෙලාගත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ආර්ථික දුෂ්කරතාවයට පත් ශ්‍රී ලංකාව මෙම වර්ෂය මැද රට තුළ ඇති වූ මූල්‍ය හා පරිපාලන අර්බුද හමුවේ තවදුරටත් අසීරුතාවයට පත්වීම තුළ 2022 වර්ෂය ආරම්භයේ දී සැලසුම් කල වැඩසටහන උපාය මාර්ගිකව සංශෝධනය කර ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනයේ අරමුණු ලඟා කරගත් වර්ෂයක් ලෙස හඳුන්වාදිය හැකිවේ.

ඒ අනුව ආරම්භ කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති අවසන් කිරීමට ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කළ අතර පවතින ප්‍රතිපාදන සීමාව තුළ අලුතින් නිවාස වැඩසටහන් හා ව්‍යාපෘති ආරම්භ කිරීම සීමා කර, ආරම්භ කරන ලද වැඩසටහන් වර්ෂය තුළ අවසන් කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් ක්‍රියාවට නංවන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2022 වර්ෂය සඳහා ලැබුණු භාණ්ඩාගාර ප්‍රතිපාදන 100% සැලසුම් කළ වැඩසටහන සඳහා යෙදවීමට හැකි වීම ජයග්‍රහණයකි. බොහොමයක් රාජ්‍ය හා පෞද්ගලික ආයතන පවත්වාගෙන යාමේ අවධානමක පවතින මොහොතක ජාතික නිවාස සංවර්ධන අධිකාරිය රාජ්‍ය භාණ්ඩාගාරයෙන් වෙන් වූ ප්‍රතිපාදන වලට පමණක් සීමා නොවී අභ්‍යන්තර ණය ආපසු අයකිරීම් වලින් රුපියල් මිලියන 2705.4 ක් හා කුලී , දේපළ අලෙවි ආදායම් වලින් රුපියල් මිලියන 299.0 ක් ද ඇතුළුව සමස්ථ අයකිරීම් රුපියල් මිලියන 3004.4 ක් එකතු කර ගැනීමට සමත් විය. එසේ එකතු කරගත් අභ්‍යන්තර අරමුදල් මඟින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ස්ථිර හා අනෙකුත් කාර්යය මණ්ඩලය 1719 ක් සඳහා වැටුප් හා චේතන ඇතුළු ආයතනයේ සියලුම පුනරාවර්ථන වියදම් දැරීමෙන් අනතුරුව සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රතිපාදන යෙදවීමට හැකිවිය. එමෙන්ම රුපියල් මිලියන 339.0ක් අඩු ආදායම්ලාභී නිවාස වැඩසටහන් සඳහාත්, මධ්‍යම පාංතික නිවාස වැඩසටහනේ මූලික ප්‍රාග්ධන වියදම් වශයෙන් රුපියල් මිලියන 97.8 ක් ද ප්‍රතිලාභීගෙන් මුදල් ලැබෙන තෙක් තාවකාලිකව ආයෝජනය කිරීමට හැකිවීම, විශේෂයෙන් කළමණාකාරීත්වය විසින් ගත් අභියෝගාත්මක තීරණවල කාර්යක්ෂමතාව හා ඵලදායී බවෙහි ප්‍රතිඵලයකි.

ආයතන අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී අභියෝග රාශියක් මැද කැපවීමෙන් ක්‍රියාකල සමස්ථ කාර්යය මණ්ඩලය වෙත සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මා කෘතවේදී ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



ඉංජි. කේ.ඒ.ජානක
සාමාන්‍යාධිකාරී (වැ.බ)
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

හැඳින්වීම

01

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත මගින් ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන කටයුතු කරගෙනයාම සඳහා ස්ථාපිත කර ඇති මෙම අධිකාරිය එහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ උප කාර්යාල 09 ක් මගින් දිවයින පුරා කටයුතු කරගෙන යනු ලබයි.

දැක්ම

ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුවපහසු නිවසක් හිමිකර දීම.

මෙහෙවර

ශ්‍රී ලාංකීය ජනතාවගේ විශේෂයෙන්ම නිවසක් සතුකර ගැනීමට මාර්ගයක් නොමැති අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ජාතික වශයෙන් උනන්දු කරවීම, පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම මෙන්ම නිවසක් නොමැති මධ්‍යම පාන්තික පවුල් සඳහා සහන මිලට නිවසක් ඉදිකර ලබාදීම සඳහා අවශ්‍ය මැදිහත්වීම. එමගින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපත් කරලීම හා ආර්ථික සමෘද්ධිය ළඟාකරදීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කටයුතු කරයි.

අරමුණු

1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත අනුව අපගේ අරමුණු වන්නේ ....

- මහල් නිවාස හා වෙනත් වාසස්ථාන හෝ ගොඩනැගිලි ඉදිකිරීමෙහිලා කෙළින්ම නියුක්තවීම.
- නිවාස හිඟය අඩු කිරීම පිණිස නිවාස සංවර්ධන යෝජනා ක්‍රම පිහිටුවීමට සැලසුම් සකස් කිරීම.
- මුඩුක්කු හා පැල්පත් සහිත ප්‍රදේශවලින් එම මුඩුක්කු සහ පැල්පත් ඉවත්කිරීම සහ ඒ ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරීම.
- නිවාස සංවර්ධනයට රුකුල්දීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවක් ක්‍රියාවේ යෙදවීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංවර්ධනය කිරීම.
- නිවාස සංවර්ධනය සඳහා යම් තැනත්තකුට ඉඩම් ලබාදීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවකට සමානවන යම් ක්‍රියාකාරකමක නියුක්ත තැනැත්තන්ට මුදල් හෝ වෙනත් පහසුකම් සැපයීම.
- නිවාස සංවර්ධනයෙහි සියළු අංශවලට අදාළවන ක්‍රියාකාරකම්වල නිරතවීම, ඒවාට අනුබලදීම සහ ඒ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
- ඉහත දැක්වෙන අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියළුම ක්‍රියාකාරකම්වල යෙදීම.

පරමාර්ථ

- අඩු ආදායම්ලාභී පවුල් වලට නිවාස ඉදිකර ගැනීම සඳහා පහසුකම් සැලසීම.
- අන්ත දුගී පවුල් වලට නිවාස ඉදිකරගැනීම සඳහා සහාය ලබාදීම.
- මුඩුක්කු සහ පැල්පත්වාසීන්ට නිවාස පහසුකම් සැලසීම සඳහා ඍජුව සම්බන්ධවීම හා සම්බන්ධීකරණය කිරීම.
- මධ්‍යම ආදායම් ඇති පවුල් සඳහා දූරිය හැකි මිලකට නිවාස ඉදිකිරීම පිණිස අදාළ ඉදිකිරීමේ කටයුතු සිදුකරන්නන්හට පහසුකම් සැපයීම.
- නිවාස ඉදිකිරීමේ අරමුණු සඳහා ඉඩම් කැබලි ඍජුව ලබාදීම හෝ පහසුකම් සැලසීම.
- නිවසක ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම.
- පැරණි නිවාස සංකීර්ණවල ජීවත් වන පවුල් සඳහා එම නිවාස සංකීර්ණ ප්‍රතිසංස්කරණය කිරීම මගින් සුදුසු ප්‍රසන්න පරිසරයක් සහිත නිවාස ක්‍රම බවට පත් කිරීම.
- නාගරික අඩු ආදායම්ලාභී පවුල්වලට ස්ථීර නිවාස සපයාදීම.
- කාර්යක්ෂම ගුණාත්මක සහ ස්ථීරසාර සේවාවක් සැපයීම.
- කුලී සින්න නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කරීම

සංස්ථාපිත තොරතුරු

නම	:	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
නීතිමය භාවය	:	1979 අංක 17 දරණ පනත
සංස්ථාපිත වර්ෂය	:	1979
ලියාපදිංචි කාර්යාලය	:	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මහලේකම් කාර්යාලය, අංක 34 , සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.
දුරකථන අංකය	:	2421606, 2431707, 2430410, 2431722, 2421748, 2380874
ෆැක්ස්	:	2434892
විද්‍යුත් තැපෑල	:	chairman@nhda.lk
වෙබ් අඩවිය	:	www.nhda.gov.lk
විගණකවරු	:	විගණකාධිපති විගණකාධිපති දෙපාර්තමේන්තුව
උපදේශන නීතිඥවරු	:	නීතිපති නීතිපති දෙපාර්තමේන්තුව, හල්ස්ඩෝෆ් , කොළඹ 12.
බැංකුකරුවෝ	:	ලංකා බැංකුව, ආයතනික ශාඛාව, ඇව්ලන් චතුරශ්‍රය, කොළඹ 01.
	:	මහජන බැංකුව , මූලස්ථාන ශාඛාව, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලය



සභාපති

රජිවසිරි සූරියආරච්චි මහතා

නො 55/එෆ්, 4 වන පටුමග, පිටකෝට්ටේ.

(2022.06.15 - 2022.12.31)



සභාපති

ආර්. දුමින්ද සිල්වා

40/8, පෙරේරා ලේන්, පැලවත්ත, බත්තරමුල්ල

(2021.08.10 - 2022.05.30)



උප සභාපති

බී. ඒ. පී. ලක්ෂ්මන් ගුණවර්ධන මහතා

103, නුවර පාර, අලුත්ගම, බෝගමුව, යක්කල

(2022.08.01 - 2022.12.31)

උප සභාපති

නීතිඥ ඩී. එම්. අරුණ කීර්ති දසනායක මහතා

අංක 79/14 , කොළඹ පාර, කුරුණෑගල.

(2022.01.01 - 2022.06.16)

උප සභාපති

ආර්. එම්. එස්. පී. කේ. රත්නායක මහතා

365, කහන්තොට පාර, අරංගල, මාලඹේ

(2022.06.16 - 2022.07.31)



අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඉංජි. විමලසිරි වන්නිආරච්චි මහතා

''ශ්‍රියාණි'', ගල්පොත්තයාය, ජූලම්පිටිය, වීරකැටිය.

(2020.01.02 - 2022.12.31)

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ජනාධිපති නීතීඥ

ඩී ඇලෙක්සැන්ඩර් පියසේන වීරත්න මහතා

සමනල, කටුලන්ද, දෙකටන.

(2022.06.21 - 2022.12.31)





අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

කේ.කේ. ගවේෂ සනිරත්න මහතා

අංක 158/120, මඩවල, මිනුවන්ගොඩ

(2021.01.29 - 2022.12.31)

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

එච්.ඩී. තිස්ස ගුණවර්ධන මහතා

134/1, අලුත්ගම, ගම්පහ

(2022.06.16 - 2022.12.31)



අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඩබ්. ඒ. සරත් කුමාර මහතා

නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්,
කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව,
(මුදල්) කාමර අංක 343, 3 වන මහල, කොළඹ 01.

(2022.11.30 - 2022.12.31)

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

සුදත් අබේවර්ධන මහතා

අංක බී-5/1/4 , හිඹුටු උයන නිවාස සංකීර්ණය,
මූල්ලේරියාව නව නගරය , මූල්ලේරියාව

(2020.01.02 - 2022.06.15)

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඩී. මදාරා සෙව්වන්දි ද සිල්වා මිය

සහකාර අධ්‍යක්ෂක,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
(මුදල්) කාමර අංක 343, 3 වන මහල, කොළඹ 01.

(2020.01.13 - 2022.11.29)

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

නීතිඥ මනෝරි ටී. ඔලබොඩුව මිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
කොළඹ 02



සංස්ථාපිත කළමනාකරණය



ඉංජි. කේ.ඒ. ජානක මහතා

සාමාන්‍යාධිකාරී (වැ.බ.)



පී. ටී. එස්. ප්‍රියදර්ශනී මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වැ. බ.

පී. එම්. එල්. පී. එදිරිසිංහ මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ හා පාලන)





ආර්. පී. කේ. පල්ලේවෙල මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා ප්‍රගති) වැ. බ.

ඉංජි. කේ.ඒ. ජානක මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිවාස සංවර්ධන)



පී.ඒ.එස්.පී. ආරියවංශ මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දේපල කළමනාකරණ හා අලෙවි) වැ.බ.

එල්. ආර්. බණ්ඩාර මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දේපල කළමනාකරණ හා අලෙවි) වැ.බ.

පී. ඒ. එස්. පී. ආරියවංශ මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිවාස සංවර්ධන)

කේ. එච්. සී. ජයලත් මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) සේ. ගි.

ධර්ම ශ්‍රී කාරියවසම් මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු හා ප්‍රචාරණ)

අජන්ත ද සිල්වා මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක වැ.බ.



දිස්ත්‍රික් කාර්යාල ජාලය



වන සංරක්ෂණ කාර්යාල පටුමග, චුන්ඩික්කුලි , යාපනය. 021-2222039 dmjaffna@nhda.lk	බලාගාරය පාර, ත්‍රිකුණාමලය. 026-2222503 dmtrinco@nhda.lk	
155 වැනි සැතපුම් කණුව (ඒ-9 නුවර පාර) කිලිනොච්චිය 021-2285757 dmkilinochchi@nhda.lk	අංක 390 , බණ්ඩාරනායක මාවත, නව නගරය, අනුරාධපුර. 025-2222649 dmanuradhapura@nhda.lk	
ඒ-9 නුවර පාර, මාන්කුලම් (මුලතිව්) 021-2060033 dmmullaitivu@nhda.lk	පුලතිසිපුර ,හිඟුරක්ගොඩ (පොලොන්නරුව) 027-2246362 dmpolonnaruwa@nhda.lk	
පල්ලිමුණේ පාර, මන්නාරම. 023-2222315 dmmannar@nhda.lk	තම්මැන්නාගම , ආණමඩුව (පුත්තලම) 032-2263425 dmputtalam@nhda.lk	
උද්‍යාන පාර , වවුනියාව. 024-2222214 dmvavuniya@nhda.lk	05, මිහිඳු මාවත , කුරුණෑගල. 037-2222014 dmkurunegala@nhda.lk	
	833/ඒ , අළුවිහාරේ , මාතලේ. 066-2222134 dmmatale@nhda.lk	
	සරවනා පාර , කල්ලඩි , මඩකලපුව. 065-2224473 dmbatticaloa@nhda.lk	
	වලව් වත්ත, ගම්පහ. 033-2226017 dmgampaha@nhda.lk	
	අඹන්පිටිය, ගලිගමුව නගරය (කෑගල්ල) 035-2229737 dmkegalle@nhda.lk	
	කච්චේරි සංකීර්ණය , යටිනුවර විදිය, මහනුවර. 081-2223139 dmkandy@nhda.lk	
	උඩුපුස්සැල්ලාව පාර, හාවාඑළිය (නුවරඑළිය) 052-2222925 dmneliya@nhda.lk	
	ක්ලිනික් පාර, බදුල්ල. 055-2222113 dmbadulla@nhda.lk	
	වැල්ලවාය පාර, මොණරාගල . 055-2276202 dmmonaragala@nhda.lk	
	පොලිස් නිවාස පාර , අම්පාර. 063-2222045 dmampara@nhda.lk	

246 බී , හයිලෙවල් පාර, කොට්ටාව. 011-2178224 dmcolombo@nhda.lk	3 වන මහල, කච්චේරි සංකීර්ණය , කළුතර. 034-2221299 dmkalutara@nhda.lk	නව නගරය , රත්නපුර. 045-2228996 dmrathnapura@nhda.lk
ඒ-කෝට් බිල්ඩින්, පෙල්ඩර් විදිය, කොටුව , ගාල්ල. 091-2234232 dmgalle@nhda.lk	දුම්රියපල පාර, මාතර. 041-2222986 dmmatara@nhda.lk	නගරසභා පුස්ථකාල ගොඩනැගිල්ල, 1 වන මහල, හම්බන්තොට. 047-2256023 56

සංස්ථාපිත පාලනය

02

ආයතනික පාලනයේ උසස් මට්ටම් දක්වා ගමන් කිරීම සඳහා දැඩි නොනවතින කැපවීමක් අප සතුව ඇත. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනයේ ප්‍රමිතීන් මෙන්ම රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය ආදී ආයතන අමාත්‍යාංශ මගින් යෝජනා කරන ලද සුදුසුම කටයුතු අනුගමනය කිරීමට සැමවිටම උත්සාහ කරන අතර, ගරු අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන තීරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා වර්තමානයේදී අමාත්‍යාංශය මගින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම.

අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම

අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මාසයකම රැස්වෙන අතර අවශ්‍යතාවය අනුව මසකට රැස්වීම් කිහිපයක් වුවද පැවැත්වීමට සිදුවේ. අයවැයට සාපේක්ෂකව ප්‍රගතිය සෑම මසකම එමගින් සමාලෝචනය කරයි. විචලනයන් හඳුනාගෙන ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා සුදුසු ප්‍රතිකර්ම යොදයි. 2022 වසර තුල රැස්වීම් වාර 22 ක් පවත්වන ලදී.

විගණන කළමනාකරණ කමිටුව

සාමාන්‍යාධිකාරිවරයා සහ අධ්‍යක්ෂවරු 03 දෙනකුගෙන් සමන්විත විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමට අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හා රජයේ විගණක අධිකාරි සමගින් ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සහභාගී වේ.

විගණන හා කළමනාකරණ කමිටු මගින් ගිණුම් හා මූල්‍ය කළමනාකරණ ක්‍රමයේ මනා පැවැත්ම සහතික කෙරෙන අතර ගිණුම් ප්‍රමිතීන්ට අදාළ නීති රීති අනුව අභ්‍යන්තර පාලනයේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කෙරේ. 2022 වසර තුල විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් වාර 06 ක් පවත්වා ඇත.

විගණන හා කළමනාකරණ කමිටු විසින් ගිණුම් හා මූල්‍ය කළමනාකරණ ක්‍රමයේ මනා පැවැත්ම සහතික කරන අතර ගිණුම් ප්‍රමිතීන්ට අදාළ නීති රීති අනුව අභ්‍යන්තර පාලනය, ක්‍රියාකාරිත්වය සමාලෝචනය කෙරේ.

2022 වර්ෂයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂවරුන් හා මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, රජයේ විගණක, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ උප සභාපතිතුමා හා සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් කළමනාකරණ කමිටු සාමාජිකයින් ලෙස සහභාගී වී ඇත.

මාසික ප්‍රගති සමාලෝචනය

ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ලේකම්, සභාපති, උප සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරි හා සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, දිස්ත්‍රික් කළමනාකරුවන්, අමාත්‍යාංශයට සම්බන්ධිත ආයතන වල ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සතිපතා හා මාසිකව ආයතනයේ කටයුතු පිළිබඳව ප්‍රගතිය සමාලෝචනය කරනු ලැබීය.

අභ්‍යන්තර පාලනය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම ආයතනයේ වත්කම් වල සුරක්ෂිතභාවය සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ උපදේශනයන් ක්‍රියාත්මක කර ඇත. නියෝජ්‍ය සමාන්‍යාධිකාරි කොට්ඨාශ අනුව එම කොට්ඨාශයන්හි අංශ අනුව ධුරාවලියවකට වගකීම් ඉහළ සිට පහලට බෙදා හැර ඇත. එසේම එක් අයෙකුගේ රාජකාරිය තවත් අයෙකුගේ රාජකාරිය තුලින් ස්වයංක්‍රියව පරීක්ෂාවකට භාජනය වන පරිදි රාජකාරි බෙදා හැර තිබේ.

ඒ හා සමානව අධ්‍යක්ෂ මණ්ඩලය මනාව සැකසුනු මාසික වාර්තාකරන ක්‍රමයක් තුලින් අභ්‍යන්තර පාලනය සහතික කරන අතර, වත්කම් හා බැරකම් අතර සමබරතාවය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තීරණ ගනු ලැබේ.

සතිපතා සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන අතර, සියළු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කොට්ඨාශවල කටයුතු පිළිබඳ සාකච්ඡා කරනු ලබයි. මිල කමිටු, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු, දේපල අනු කමිටු හා අභියාචනා කමිටු, විනය කමිටු පත් කිරීම සඳහා ද පියවර ගෙන ඇත. අවශ්‍යතාවය පරිදි එම කමිටුවලද රැස්වීම් පවත්වා තීරණ ගනු ලැබේ.

විධායක කළමනාකරණය

- ප්‍රධාන කාර්යාලයේ සෑම අංශයකම ප්‍රධානත්වය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු හෝ සහකාර සාමාන්‍යාධිකාරිවරයෙකු, කළමණාකරුවකු දරණ අතර, දිස්ත්‍රික් කාර්යාල 25 ක් සමග කලාප හා උප කාර්යාල 09 ක වගකීම ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු / දිස්ත්‍රික් කළමනාකරු හා කළමනාකරු සතු වේ.
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරින් සහ ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු/ දිස්ත්‍රික් කළමනාකරුවන් සාමාන්‍යාධිකාරි වෙත රාජකාරී වාර්තා කල යුතු අතර, ප්‍රධාන විධායක නිලධාරි වන සාමාන්‍යාධිකාරි විසින් සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ රාජකාරි වාර්තා කිරීම හා අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබේ.

අවදානම් කළමනාකරණය

විශාල සේවාදායකයන් සමූහයකට සියලුම පහසුකම් සහිත නිවාස පහසුකම් සපයන සහ දිවයින පුරා ව්‍යාප්ත වූ ප්‍රාදේශීය කාර්යාල 25 කින් සමන්විත ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය ආයතනය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය එහි විවිධ හවුල් කරුවන්ගේ අවශ්‍යතා රැක ගැනීම සඳහා මූල්‍යමය සහ මූල්‍යමය නොවන අවධානම් රාශියකට මුහුණ දීමට සිදුවන අතර, එය පූර්ව කළමනාකරණය කරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම අරමුණු ළඟාකර ගැනීමට, එහි සංස්ථාපිත කළමනාකාරිත්වයේ උපදෙස් මත ප්‍රතිපත්තීන් , ක්‍රියාමාර්ග සහ අවධානම් කළමනාකරණය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහයන් ගොඩනැගීම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරයි. එමගින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සියළුම ව්‍යාපාරික මෙන්ම ජනතාවට සේවා සපයන ආයතනයක් ලෙස අරමුණු ලගාකර ගැනීම සිදු කරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආපදාවට ලක්වීම කෙරෙහි බලපාන ක්‍රියාදාමයන් හා පාලනය කළහැකි පද්ධතීන් වල දුර්වලතා හඳුනාගැනීම සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාදාමය අධිකාරියේ විගණන අංශය සමග සම්බන්ධ වී කටයුතු කරයි. කාර්යක්ෂමතාවය සහ පාලනමය තත්වයේ ප්‍රමාණත්මතාවය පිළිබඳව ස්වාධීන අදහස් කාලානුරූපීව කළමනාකරණය වෙත පළකිරීම විගණන අංශය මගින් සිදුකරනු ලබයි.

ද්‍රවශීලී අවදානම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගිවිසුම් සඳහා වූ බැඳීම් නියමිත කාලය තුළ දී ඉටුකිරීමට නොහැකිවූවිට මෙම අවධානමට ගොදුරුවේ. ඒවායේ කාලය ඉකුත් අවස්ථාවලදි මූල්‍යමය වගකීම් ඉෂ්ඨ කිරීම සඳහා අරමුදල් තිබීම සහ අවශ්‍යතා පැන නැගුණ අවස්ථාවලදි ඒවායෙහි ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන තිබෙන බව තහවුරු කිරීම මෙහි ඇතුලත් වේ.

සැලසුම්කරණය සඳහා මගපෙන්වීම, ක්‍රමවත් අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම, ගිවිසුම් බැඳීම් සහ වර්ධන අපේක්ෂාවන් සඳහා මුහුණ දීමට අවශ්‍ය ප්‍රමාණවත් ද්‍රවශීලි බවක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වන බව තහවුරු කිරීම ආදි ප්‍රධාන කරුණු අධ්‍යක්ෂක මණ්ඩලයට සහ සංස්ථාපිත කළමනාකරණයේ සාමාජිකයින් වෙත කළමනාකරණය සඳහා පවරා දී ඇත.

ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය හා ඒ සතු ප්‍රධාන අරමුණු ලගාකර ගැනීම සඳහා ඇති වගකීම,

- රාජ්‍ය ප්‍රතිපත්ති හා ආයතනික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදි සමබරතාවයකින් ද්‍රවශීලතාවයට බාධාවක් නොවන අයුරින් ක්‍රියාත්මක කිරීම.
- මුදල් ඉපයීම සම්බන්ධ විකල්ප මාර්ගප්‍රමාණවත් ලෙස තහවුරු කිරීම.
- පවත්නා ණය ආයෝජන සහ මුදල් ඉපයීමේ ක්‍රියාමාර්ග කාලානුරූපීව නැවත සලකා බැලීම.
- පවතින මිල ගණන් සමාලෝචනයට ලක් කරන අතරම, තරඟකරුවන්ගේ මිල ගණන් විශ්ලේෂනයක් සිදු කිරීම.
- සංස්ථාපිත නිර්ණායකයන්ට අනුකූලව ද්‍රවශීලි අනුපාත සඳහා මග පෙන්වීම.
- ප්‍රදානයන්, අභ්‍යන්තර උපයන අරමුදල් හා මුදල් බවට පත්කළ හැකි කෙටිකාලීන ආයෝජන පාලනය කිරීම තුළින් ද්‍රවශීලිතාවය පවත්වාගෙන යාම දෛනිකව කරනු ලැබේ.

වෙළඳපොල අවදානම

මිල සංවේදි වත්කම් හා බැරකම් පවත්වාගෙන යෑමේ දී පැනනගින පාඩු හා සම්බන්ධව මෙම අවධානම ප්‍රධාන වශයෙන් පොලී අනුපාතයන්ගේ වෙනස්වීම සහ කාලයත් සමග ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල දෝලනය වීම, පුහුණු ශ්‍රමික ගාස්තු ඉහළ යාම හේතුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත මෙය බලපානු ලැබේ. විශේෂයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදි මෙම තත්වය තදින් බලපානු ලබයි.

වෙළඳ පොලේ නිවාස සඳහා පවතින අධික ඉල්ලුම හේතුවෙන් නිවාසයන්හි මිල ඉහලයාමේ අවදානම පාලනය කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන වල මැදිහත්වීම අවශ්‍යවේ.

රුපියල අවප්‍රමාණය වීමත් සමග ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල ඉහල යාම විශේෂයෙන් වහල සෙවිලි ද්‍රව්‍ය, ටයිල් වර්ග හා නාන කාමර අයිතම වල සිදුව ඇති අධික මිල ඉහල යාමේ අවධානම හා ශ්‍රමය සඳහා වන වියදම් වල ඉහල යාම වෙළඳ පොල මිල ගණන් වලට නිවසක් අවශ්‍ය සෑම පුද්ගලයෙකුටම නිවසක් සතු කිරීමට රජය මගින් ලබා දෙන මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙළඳ පොල අවධානමට මුහුණදීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සිදුවේ.

සංස්ථාපිත කළමනාකරණ අරමුණු ලඟාකර ගැනීමට දායකව කටයුතු කරන අනෙකුත් ප්‍රධාන හවුල්කාර ආයතනයන්ගේ අවශ්‍යතාවයන් සහ සේවාදායකයන්ගේ මුදලට සරිලන සේවාවක් සඳහා වටිනාකමක් සපයා දෙමින් නිවාස වෙළඳ පොලට එල්ල වී ඇති තර්ජනයන් උපරිමයෙන් පාලනය කරගැනීම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් සිදු කරනු ලැබේ.

මෙහෙයුම් අවදානම

භාහිර තරඟකාරී බලවේගයන්ට මුහුණදීමට අපහසු හෝ ක්‍රියාකාරකම්වලට බාධාවන් පමුණුවන අභ්‍යන්තර දුර්වලතා නිසා ප්‍රමාණවත් නොවන හෝ අභ්‍යන්තර ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මෙම අවදානම් ඇතිවේ.

සංවිධානය තුල යහපත් සහ මනා ලෙස පාලනය කරන ලද ක්‍රියාකාරී පරිසරයක් ලබාදීම සඳහා සැකසුණු ව්‍යුහයන්ගෙන් සහ පුළුල් ප්‍රතිපත්තීන් සහිත පද්ධතියකින් සැකසුන කාලීනව සිදුවන අවධානම් පාලනය කරමින් පවත්වාගෙන යන ආයතනයක් ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වේ.

උද්ධමනය ඉහල යාමත් සමග පාරිභෝජන වියදම් ඉහලයාම හේතුවෙන් පුද්ගල ඉතිරිකරීම් පහල යාම හේතුවෙන් ණය ආපසු ගෙවීම අඩුවීමත් ඒ තුලින් සංවර්ධන වැඩසටහන් වලට කරන අහිතකර බලපෑම් හා නිවාස ඉදිකිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභී දායකත්වය නොලැබීමේ අවධානම.

කොවිඩ් වසංගතය වැනි විශේෂ ලෙඩ රෝග හා උවදුරු වලින් ඇතිවිය හැකි අවදානම් ගැන සැලකිල්ලට ගැනීම. එසේම රට තුල හෝ ගෝලීය වශයෙන් ඇතිවිය හැකි මූල්‍ය හා / හෝ ආර්ථික අර්බුද හමුවේ ආයතනය එකී කටයුතු පවත්වාගෙන යාමේදී මුහුණ දෙන අවදානම

ඵලදායි ක්‍රියාකාරී අවධානම් කළමනාකරණය සඳහා විශේෂ පියවර කීපයක් ගෙන ඇත.

- තොරතුරුවල සුරක්ෂිතභාවය ආරක්ෂා කරමින් සියළුම දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගත් කාලානුරූප දත්ත විශ්ලේෂණය හා වාර්තාකරණය
- තොරතුරු ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තීන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
- නිවාස වැඩසටහන් නිරතුරුවම සමාලෝචනය සහ වැඩිදියුණු කිරීම.
- ණය නැවත අයකිරීමේ වැඩ සටහන් වල ක්‍රියාකාරීත්වය
- ආයතනියක මූල්‍ය දායකත්වය සහිතව ක්‍රියාත්මක නිවාස වැඩ සටහන් වල උපරිම ඵලදායිකත්වය හා කාර්යක්ෂමතාවය ලබාගැනීමට වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

මෙහෙයුම් අවධානම් පාලනය කිරීම මධ්‍යම කළමනාකරණයේ ප්‍රධානම වගකීම වේ. පාලිත පරිසරයන්හි අනන්‍යභාවය පවත්වා ගැනීම සඳහා මුදල්, විගණන හා අනෙකුත් සහායක සේවා අංශ මගින් මහගු කාර්යයක් ඉටු කරයි.

වටිනා දේපල ප්‍රමාණයක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව ඇති හෙයින් යෝග්‍ය උපක්‍රම භාවිතා කිරීම සහ නිරන්තර සමාලෝචනය සහ කාර්යය මණ්ඩලයේ කැපවීම මගින් තරඟකාරී පරිසරයතුල ආයතනයේ සාර්ථකත්වය සඳහා ආයතනික අරමුණු වලට අනුව එම දේපළ ඵලදායිව හා කාර්යක්ෂමව යොදා ගත හැකිය.

පාරිසරික ගැටළු


මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති, අනෙකුත් නිවාස ව්‍යාපෘති ඉදිකිරීමට ප්‍රථම රාජ්‍ය ආයතන, මධ්‍යම පරිසර අධිකාරිය, ගොඩනැගිලි පර්යේෂණ අදාළ පළාත් පාලන ආයතන වැඩ නිර්දේශ වලට අනුව පරිසර සංවර්ධන වැඩ පිලිවෙල ක්‍රියාත්මක කරමින් පරිසරයට අවම හානියක් වන ආකාරයට හා පරිසරයට ගැලපෙන ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ජනතාවට සුරක්ෂිත හා යහපත් පරිසරයක් සපයා දෙනු ලැබේ. ඒ අතරම පානීය ජලය, ප්‍රමාණවත් පිවිසුම් මාර්ග, අඛණ්ඩ විදුලි සැපයුම, වැසි ජලය අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධති, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් වැනි යටිතල පහසුකම් ද සපයනු ලැබේ.

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නීති රීති මගින් සභාධිපත්‍ය දේපලවල පදිංචිකරුවන්ට වඩා යහපත් පරිසරයක් සහතික කිරීම.

නිවාස වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම් කිරීමේදී පාරිසරික සංවේදී කලාපවල හා ස්වභාවික විපත් විශේෂයෙන් නාය යාමේ අවධානම සහිත ප්‍රදේශ , ගංවතුරෙන් හා සුනාමි අවධානම් ඇති ප්‍රදේශ මෙන්ම උග්‍ර ජල හිඟ ඇති කඳුකර ප්‍රදේශවල නිවාස ඉදිකිරීමේදී ඇති අවධානම.

ආයතනයේ සංවිධාන ව්‍යුහය



ප්‍රධාන ක්‍රියාකාරකම්

03

✓ **" සැමට නිවහන් " ණය වැඩසටහන**

- අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ණය පහසුකම් ලබාදීම තුලින් නිවාස ඉදිකර ගැනීමට සහායවීම
- සහනදායී වාර්ෂික පොලියක් යටතේ ජීවත්වන නිවස වැඩිදියුණු කර ගැනීමට හෝ නව නිවසක් ඉදිකර ගැනීමට ණය පහසුකම් ලබාදීම.

✓ **" සැමට නිවහන් " ආධාර වැඩසටහන**

- මූල්‍යාධාර ලබාදීම තුලින් නිවාස ඉදිකර ගැනීමට සහායවීම
- දිළිඳු, ආබාධිත හා අසරණ පවුල් මෙන්ම රටට වැඩදායී සේවාවක් ඉටුකල විශේෂ සාමාජිකයන් සිටින පවුල් වෙනුවෙන් සෙවණ ආධාර ලබාදීම තුලින් නව නිවාස ඉදිකිරීම.

✓ **ඉන්දියානු ආධාර වැඩසටහන**

- ඉඩමක් හෝ නිවසක් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා ඉන්දියානු රජයේ මූල්‍යාධාර තුලින් උතුර හා දකුණ පළාත්වල නව නිවාස ව්‍යාපෘති ඉදිකිරීම.

✓ **විරු සුමිතුරු නිවාස වැඩසටහන**

- රට දැය වෙනුවෙන් දිවිපිදූ හා පූර්ණ ආබාධිත තත්වයට පත්වූ රණවිරු සාමාජිකයින් වෙනුවෙන් ආධාර ලබාදීම තුලින් නිවාස අවශ්‍යතා සපුරාලීම.

✓ **මධ්‍ය ආදායම්ලාභී පවුල් සඳහා නව නිවාස**

- ස්ථීර මාසික ආදායම් ලබන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින් හා මැදි අදායම්ලාභී හා ඉහල ආදායම්ලාභී ව්‍යාපාරිකයින් සඳහා රාජ්‍ය හා පෞද්ගලික දායකත්වය තුලින් නව නිවාස ලබාදීමට සියලු පහසුකම් සහිත මහල් නිවාස ඉදිකිරීම.

✓ **පැරණි නිවාස ක්‍රම නවීකරණය**

- පැරණි මහල් නිවාස ක්‍රමවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- මහල් නිවාස අළුත් වැඩියා කිරීම.
- කළමණාකරණ සංස්ථා පිහිටුවීම

✓ **නිවාස ඉදිකිරීම් හා සහාය සේවා සැපයීම**

- නිවාස යෝග්‍යතා අධ්‍යනය කිරීම.
- ප්‍රජාව දැනුවත් කිරීම සහ සංවිධානය කිරීම.
- ග්‍රාමීය නිවාස කමිටු පිහිටුවීම.
- නිවාස ඉදිකිරීම් සඳහා අවශ්‍ය තාක්ෂණ සහාය ලබාදීම.
- අඩු පිරිවැය ඉදිකිරීම් තාක්ෂණ ක්‍රමවේදයන් ගැන තොරතුරු ව්‍යාප්ත කිරීම.
- අවශ්‍යතාවය මත මුල්‍යමය සහාය සැපයීම.
- ඉදිකිරීම් වල තත්වය/ අනුකූලතාවය සහතික කිරීම සඳහා අධීක්ෂණය කිරීම.
- යටිතල පහසුකම් ඇති කිරීම/ සම්බන්ධතාවය පැවැත්වීම.

✓ **නාගරික සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම (නිවාස ව්‍යාපෘති)**

- යෝග්‍ය ස්ථාන හඳුනා ගැනීම.
- මැනුම් කටයුතු සිදුකිරීම.
- මුල්‍යමය හැකියා මට්ටම් තීරණය කිරීම.
- සැලසුම් පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- කළමනාකරණ සංස්ථා ස්ථාපිත කිරීම.
- අයිතිය පැවරීම.

✓ **ඉඩම් කට්ටි ලබාදීම.**

- යෝග්‍ය භූමි හඳුනා ගැනීම.
- යෝග්‍යතා අධ්‍යනය කිරීම.
- කැබැලි සැලසුම් පිළියෙල කිරීම.
- අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- ඉඩම්ලාභීන් හඳුනා ගැනීම සහ තෝරා ගැනීම.
- අවශ්‍යනම් ණය දෙන ආයතන සමග සම්බන්ධතාවය ඇති කරගැනීම.
- තෝරාගත් ඉඩම් ලාභීන්ට ඉඩම් කට්ටි පැවරීම.
- නිශ්චිත කාල පරාසයක් තුල එම ඉඩම් වල ප්‍රතිලාභීන්ට නිවාස ඉදිකර ගැනීමට මග පෙන්වීම.

✓ **ණය අයකිරීම් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම**

- වාර්ෂික ඉලක්ක ලබා දීම, ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම, ඊට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- ණය හා කුලී ආදායම් ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- මාසික ප්‍රගති සමාලෝචනය කිරීමට හා ඒවායේ දුර්වලතා හඳුනාගෙන පිළියම් යෙදීම.
- ණයකරුවන්ට තම ණය වාරික ආපසු ගෙවීමේ වගකීම හා ණය ගෙවීමේ වැදගත්කම තුලින් නැවත නිවාස සංවර්ධනයට එම මුදල් යෙදවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අයකිරීම් නියෝජිතයින් හා අයකිරීම් නිලධාරින් සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- ආදායම් ප්‍රවර්ධන වැඩසටහන තුල දක්වන දායකත්වය ඇගයීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.





✓ **නිවාස ක්‍රමවල පොදු ප්‍රදේශ, එහි යටිතල පහසුකම් සහ සේවාවන් සහිතව පළාත් පාලන ආයතන වෙත පැවරීම.**

- පොදු ප්‍රදේශ / විවෘත ස්ථාන වල මායිම් සලකුණු කිරීම.
- මිනින්දෝරු සැලසුම් පිලියෙල කිරීම.
- පළාත් පාලන ආයතනයෙන් එකඟතාවය ලබා ගැනීම.
- ඔප්පුවක් මගින් දේපල පැවරීම.
- නිවාස හිමියන්ට දැනුම් දීම.





✓ **නිවාස තොග හා නිවාස අවශ්‍යතාව පිළිබඳව දත්ත පවත්වාගෙන යාම.**

- ග්‍රාම නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සම්බන්ධීකරණය සහ දත්ත රැස් කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ උපදේශන මධ්‍යස්ථාන සමග සම්බන්ධීකරණය සහ දත්ත ඒකරාශී කිරීම.
- පළාත් අධිකාරි සමග සම්බන්ධීකරණය සහ දත්ත රැස්කිරීම.
- දිස්ත්‍රික් නිවාස කමිටුව වෙත දත්ත ඉදිරිපත් කිරීම.
- කමිටුව භාර ගත් දත්ත පෙල ගැස්වීම.
- දත්ත, අර්ධ වාර්ෂිකව දත්ත බැංකුව වෙත ඉදිරිපත් කිරීම.
- අනාගත සැලසුම් සඳහා දත්ත භාවිතයට ගැනීම.





මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය 04

නිවාස සංවර්ධන කොට්ඨාශය

" සැමට නිවහන් " නිවාස ආධාර වැඩසටහන

පරමාර්ථය

දිවයින පුරා නිවසක් නොමැතිව ජීවත්වන, තමාට කියා ඉඩමක් හිමි, ස්ථිර නිවසක් නොමැති සෑම පවුලකටම සුව පහසු නිවසක් අත්කර දීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමේ අරමුණට ලගාවීමේ පළමු පියවර ලෙස දිවයිනේ අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස ගැටලුව විසඳීම නිවාස ඒකක 14,022 ක් වාර්ෂිකව ඉදිකරදීමේ අරමුණින් ක්‍රියාත්මක වන ආධාර ව්‍යාපෘතියකි.

කාර්යයභාරය

ඉහත වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සකස් කල අත්වැලෙහි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායකයන්ට අනුව ප්‍රමුඛතාවය ලබාදිය යුතු පරිදි තෝරාගත් ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය කමිටුවේ පොදු එකගතාවය පරිදි නිසි ප්‍රමුඛතාවයද සටහන් කරමින් ප්‍රාදේශීය සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කිරීම ග්‍රාම නිලධාරි විසින් සිදුකර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදීම පිණිස ප්‍රාදේශීය නිවාස කමිටු රැස්වීම පවත්වා ප්‍රමුඛතා ගත කරන නාම ලේඛනය සඳහා අනුමැතිය ලබාගැනීම සිදුකරනු ලබයි.

අනුමත කරනු ලබන ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය වැඩ සටහන ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම පිණිස නොපමාව දිස්ත්‍රික් ලේකම් වෙත සහ නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු වෙත ඉදිරිපත් කරනු ලබයි.

වැඩසටහන ජාතික මට්ටම සමග සම්බන්ධීකරණය කරමින්, සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරයාගේ එකගතාවය මත දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් නිවාස කමිටුව හරහා ක්‍රියාත්මක කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු විසින් පියවර ගනු ලැබේ.

වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බනධීකරණ කමිටුවේදි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදි සහ දිස්ත්‍රික් නිවාස කමිටුවේදි ප්‍රගතිය සමාලෝචනය කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු විසින් කටයුතු කරනු ලබන අතර, ජාතික මට්ටම වෙත නියමිත පරිදි ප්‍රගතිය වාර්තා කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වැරන් සහ ආදාළ නිළධාරින්ගේ සහයෝගය ලබාගෙන සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ කටයුත්ත අදාළ දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් කළමනාකරුවන් විසින් සිදු කරනු ලබයි.

2022.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය

2022 වර්ෂයේ නිවාස ඒකක 1465 ක වැඩ ආරම්භ කර 2022.12.31 දිනට ඉන් නිවාස ඒකක 19 ක වැඩ අවසන් කර ඇත. 2022 වර්ෂයේ ආරම්භ කරන ලද නිවාස ඒකක වලට අදාළ ඇස්තමේන්තු මුදල රු. මිලි. 946.720 ක් වන අතර ඉන් රු. මිලි. 205.870ක් වැයකර ඇත.

" සැමට නිවහන් " විසිරි නිවාස ණය වැඩසටහන

පරමාර්ථය

ස්ථිර නිවසක් නොමැති පවුල් ඒකක සඳහා නව නිවසක් ඉදිකිරීම හා ස්ථිර නිවසක් ඉදිකර ඇතත් වැඩ අවසන් නොවූ ඉදිකිරීම්වල වැඩ අවසන් කර ගැනීම, අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාසවල අලුත් වැඩියා කටයුතු කිරීම හා අලුතින් කොටසක් එකතු කිරීම සඳහා සහායවීම මූලික පරමාර්ථය වන අතර, ණය මුදලක් සමඟ තාක්ෂණික සහාය ලබාදීම.

මෙම සංවර්ධන කාර්යයයේ උපාය හා මූලික පරමාර්ථ වනුයේ

- නිවසක් නොමැති ඉඩමක් හිමි ආර්ථික හැකියාවක් ඇති අය වෙනුවෙන් ඔවුන්ගේම නිවසක අවශ්‍යතාවය සඳහා දිරි ගැන්වීම.
- එකම කුටුම්භයක පවුල් ඒකක කිහිපයක් ජීවත් වන, තමන්ගේම නිවසක ජීවත්වීමේ අභිලාශය ඇති, නමුත් දැනුම නොතිබීම, ඉඩමක හිමිකම තිබුනද, ආරක්ෂිත නිවසක් ඉදිකර ගැනීමට හැකියාවක් නොතිබීම වැනි අවස්තාවලදී ඔවුන්ගේ නිවාස සිහිනය මුදුන්පත් කිරීම.
- ප්‍රජා සහභාගීත්වය දායකකර ගනිමින් ප්‍රජා පාදක ක්‍රමවේද ගුරු කොට ගෙන ශ්‍රී ලංකාවේ නිවාස ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කිරීම.
- නිවාසලාභි පවුල් වෙත තම නිවාස ඉදිකර ගැනීම සඳහා තාක්ෂණික උපදෙස් ලබා දීම හා ඉදිකිරීම් සුපරීක්ෂාකාරීත්වය තුළින් ප්‍රතිලාභීන්

වෙත සහාය ලබාදීම හා එමගින් ප්‍රමිතිගත නිවාස ඉදිකරවීම.

- නිවාසලාභි ප්‍රජාවගේ කැපවීම හා නිර්මාණශීලිත්වයන්ට අවශ්‍ය කරන දිරිගැන්වීම් ලබාදීම, මගපෙන්වීම හා සහායදීම.
- නිවාස ඉදිකිරීම් ක්ෂේත්‍රයේ හවුල්කාර ආයතනවල දායකත්වයෙන් ඒකාබද්ධ වැඩ සටහනක් ලෙස මෙම වැඩ සටහන සැලසුම් කිරීම හා ක්‍රියාවට නැංවීම.
- දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ගම් මට්ටම දක්වා විමධ්‍යගත ක්‍රමවේදය මත ක්‍රියාත්මක කිරීම.

වැඩසටහනේ කාර්යයභාරය

වර්ථමාන, සමාජ ආර්ථික ජීවන රටාව තුළ පදිංචිය සඳහා සුදුසු නිවසක් ඉදිකරගැනීම සඳහා සත්‍ය වශයෙන්ම ආර්ථික හැකියාව ඉතා අවම, එහෙත් ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවසේ වැඩ අවසන් නැති හෝ අබලන් නිවස අලුත් වැඩියා කර ගැනීම සඳහා හෝ දැනට ඇති නිවසට කොටසක් එක්කරගැනීමේ අවශ්‍යතාවය ඇති පවුල් මේ සඳහා තෝරා ගැනේ. මෙම වැඩ සටහන දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පාදක කොටගනිමින් ක්‍රියාත්මක කෙරේ.

වැඩි දියුණු නිවාස වැඩ සටහන

උපරිම මාසික ආදායම රු. 75,000/- ක් හෝ ඊට අඩු ආදායම් සහිත ප්‍රතිලාභින් හට වැඩිදියුණු නිවසක් ඉදිකර ගැනීමේ අවශ්‍යතාවය මත රු. 300,000/- දක්වා උපරිම ණය මුදලක් වසර 5 හා 10 ක කාල සීමාවක් තුළ 6% සිට 7% ක වාර්ෂික පොළී ප්‍රතිශතයක් යටතේ ලබා දෙනු ලබයි.

ණය මුදල අනුමත කිරීමට පෙර නිවසේ වැඩ නිම කරගැනීමට ඇති හැකියාව පිළිබඳ තාක්ෂණික නිළධාරී විසින් වාර්තාවක් ලබාදෙනු ලබයි.

ඉන්දියානු ආධාර ආදර්ශ ගම්මාන වැඩ සටහන

මෙම වැඩ සටහන යටතේ ඉන්දියානු රජයේ අරමුදල් භාවිතයෙන් අඩු ආදායම්ලාභී පවුල් 2400 ක් සඳහා එක් පවුලකට එක් නිවසක් බැගින් නිවාස ඉදිකිරීම වෙනුවෙන් රු. ලක්ෂ 5 ක නිවාස ආධාරයක් ලබාදීම සිදුවේ.

ඒ යටතේ 2019 වසරේ අවිච්ඡේද වූ නිවාස 1775 ක් සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මි. 428.725 ක් වන අතර, ඉන් රු. මිලි. 36.220 ක ආධාර මුදලක් ප්‍රතිලාභින් වෙත නිදහස් කර ඇත. ඒ අනුව නිම කර ඇති නිවාස සංඛ්‍යාව 439කි.

දේපළ කළමනාකරණ කොට්ඨාශය

මෙම අධිකාරියට අයත් නිවාස ක්‍රමවල නිවාස හා ඉඩම් බැහැර කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 8-1 වගන්තියට අනුව අනුමැතිය ලබා ගැනීමට දිස්ත්‍රික් කාර්යාල යොමු කරන ලද ප්‍රතිලාභීන්ගේ ලිපිගොණු සංඛ්‍යාව 2549 කි. ඒ අතරින් පරීක්ෂාවට ලක්කර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන දිස්ත්‍රික් කාර්යාල වෙත ඔප්පු සකස් කිරීම සඳහා යොමු කල ලිපි ගොණු සංඛ්‍යාව 1759 කි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත නිවාස සංවර්ධන කටයුතු සඳහා ඉඩම් පවරා ගැනීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

- රජයේ ඉඩම් පවරා ගැනීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් පවරා ගැනීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඇති බලතල ප්‍රකාරව ටෙන්ඩර් පටිපාටියට අනුව පුද්ගලික ඉඩම් පවරා ගැනීම.
- වෙනත් රාජ්‍ය ආයතන සතු පෞද්ගලික ඉඩම් පවරා ගැනීම.

2022 වර්ෂයේදී ඉඩම් 3 ක හිමිකම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන ඇත.

ඉලක්ක සපුරා ගැනීම

- රජයේ ඉඩම් අඥා පනත යටතේ දීමනා පත්‍ර මගින් පවරා ගත යුතු ඉඩම් 301 ක කටයුතු දැනටමත් නිම වෙමින් පවතී.
- 2022 වර්ෂය තුල ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුව 44 වන වගන්තිය යටතේ සහතිකය මගින් ඉඩම් 02 ක් පවරා ගෙන ඇත
- 44 වගන්තිය ලබා ගැනීම සඳහා සම්පූර්ණයෙන් වන්දි හා පොලි ගෙවා අවසන් කරන ලද, ඉඩම් ගණන 02 කි.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් සඳහා වන්දි ගෙවීමෙන් අනතුරුව ඉඩම් 18 ක අයිතිය ලබා ගැනීම සඳහා අවසන් අදියරට පැමිණ ඇත.
- පෞද්ගලික ඉඩම් 05ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට අදාලව ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.
- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවලට අදාල ලබා දී ඇති ඉඩම් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත වන්දි ලබාගැනීම සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.

	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ඉඩමේ නම හා නිවාස ක්‍රමය	පිඹුරු අංකය	කැබලි අංකය	ඉඩම් ප්‍රමාණය			දීමනා පත්‍රයේ අංකය	දීමනා පත්‍රයේ දිනය
						අක්කර	රූඩ්	පර්චස්		
1	කොළඹ	කොළඹ	ශ්‍රී සංඝරාජ මාවත (සභාධිපත්‍ය)	මුපිකො 6723	1-12 2/2 සහ 13-46	-	2	26.51	4/7/7544	2021.11.22
2	කොළඹ	කොළඹ	මාලිගාවත්ත පාර වරිපනම් අංක 97	මු.පි.කො.9710	1	-	1	9.46	4/7/7556	2022.03.08
3	කොළඹ	තිඹිරිගස්යාය	රොඩ්නිවීදිය (අගලබඩකුඹුර)	මු.පි.කො.7236	1,2,4-29	2	2	27	4/7/7236	2021.12.06
4	කොළඹ	මොරටුව	වැටකෙයියාගහවත්ත, බහිනතොටවත්ත	කැ.සි. අංක 520212 කලාප 05	8-17,21-81,283-288,290-293	1	2	35.93	4/7/7330	2021.09.06
5	කළුතර	හොරණ	කනේවල ඇල්හේනවත්ත	මු.පි.ක.2049	3	8	2	12	4/7/7483	2022.04.22
6	ගාල්ල	ගාල්ල කඩවත්සතර	මොහිදීන්වත්ත	මුපිගා 3167	1	1		11.52	4/7/7487	2021.09.06
7	ගාල්ල	හික්කඩුව	පරගහවත්ත	මුපිගා 1994	1	5	1	17.72	4/7/7354	2021.10.06
8	ගාල්ල	බලපිටිය	පොකුණවත්ත , බෝගහවත්ත,කුකුලලවත්ත	මුපිගා 1975	3-Jan	-	3	12.14	4/7/7360	2021.12.06
9	ගාල්ල	බලපිටිය	කරලුකන්කානම්ගෙ වත්ත (පියගම කාර්යාල ගොඩනැගිල්ල)	මුපිගා 2034	1	-	1	22.4	4/7/7350	2021.12.06
10	මහනුවර	කුණ්ඩසාලේ	ගොවිපලවත්ත (පොලිස් සේවක නිවාස ක්‍රමය)	මු.පි.මහ. 6981	01,05	3	3	0.58	4/7/5381-1	2022.09.22
11	කෑගල්ල	කෑගල්ල	කොරාකොටු හේන මධ්‍යම පාන්තික නිවාස ක්‍රමය	මුපිකෑ 3444	1	-	2	8	4/7/7407	2022.03.08
12	රත්නපුර	කිරිඇල්ල	දිග්ගලහේනවත්ත	අ.ග.පි.158 අති 22	761,762	6	1	2.67	4/7/7361	2021.12.06
13	රත්නපුර	ගොඩකවෙල	නොතාරිස්වත්ත	අ.ග.පි.695 අති 02	2613, 2614	44	1	4.74	4/7/7624	2022.06.10
14	වව්නියාව	වව්නියාව දකුණ	සාම්පල්තෝට්ම්කාඩු රජයේ සේවක නිවාස ක්‍රමය	අගපි. 4602 අති. 29	356	2	0	38.4	4/7/7250	2022.05.06
				අගපි 4602 අති 40	736	16	-	24		
15	වව්නියාව	වව්නියාව දකුණ	සොලයිකාඩු (වෙප්පන්කුලම්)	F.S.P.4877 Sup 11 Sheet 11	29	234	2	11.03	4/7/7577	2022.11.15
16	පුත්තලම	කරුවලගස්වැව	තබ්බෝව කැලේ ආණමඩුව මැති 5, 10	මුපිපු 3288	1	3	-	5.3	4/7/5734	2022.05.06
17	කිලිනොච්චිය	කරච්චි	කනගම්පි කායිකුලම් මැති 20	අභුපි 1 අති 64	2889	5	-	31.87	4/7/5369	2020.08.14

වර්ෂය තුළ පවරා දුන් ඉඩම් විස්තරය

(ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත)

	දිස්ත්‍රික්කය	ඉඩමේ නම	සැලසුම් අංකය	කැබලි අංකය	ඔප්පු අංකය
1	කෑගල්ල	ගුළුවත්ත	අ.ග.පි.109 අති 3	15	13866
2	කෑගල්ල	කංකිරියහේන	අ.ග.පි. 2414	1,2	13867
3	කෑගල්ල	කොට්ටන්ගෙවත්ත	අ.ග.පි. 108 අති 30	149	13868

ඉඩම් වන්දි ගෙවීම

	දිස්ත්‍රික්කය	ඉඩමේ නම	වන්දි/පොළී මුදල (රු)
1	කොළඹ	මොරගස්මුල්ල වෙල්යාය	627,274.97
2	කොළඹ	කුණ්ඩඩිවලව්	680,565.26
3	කොළඹ	සෙපලන්කන්ද වත්ත	20,616.00
4	යාපනය	පැරඩයිස්තොටුපල	3,308,291.2
5	කළුතර	ඉනර් ෆෙයාර් ලයින්	25,031,252.57
		එකතුව	*29,668,000.00*

ජනවාරි සිට දෙසැම්බර් දක්වා මැනුම්

	ඉඩමේ නම	ප්‍රමාණය (හෙක්ටයාර්)	මැනුම් කරන ලද මිනින්දෝරු මහතාගේ නම
1	නාවක්කුලි යාපනය කට්ටි කැඩීම	11.4776	බලයලත් මිනින්දෝරු එස්.කේ. ගෞරීසන් මහතා
2	වුඩ්ලන්ඩ් (දෙහිවල)	0.4426	
3	ඇන්ඩර්සන්	0.0101	
4	රන්පොකුණුගම	0.9519	
5	රන්පොකුණුගම	0.8093	
6	ජයමුතුගම	0.3525	
7	කම්මල්වත්ත (සභාධිපත්‍ය)	0.1424	
8	ඩැනිස්ටර් ද සිල්වා මාවත	0.0552	
9	මහවත්ත	0.0677	ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ මිල ගණන් කැඳවා තෝරා ගත් බලයලත් මිනින්දෝරු ඒ. එල්. ලක්ෂ්මන් අමරසිංහ මහතා
10	117 වත්ත සභාධිපත්‍ය	0.0219	
11	වැවේගොඩැල්ල සභාධිපත්‍ය	0.3262	
12	මාදිවෙල ප්‍රගතිපුර	0.022	
13	හන්තාන පතන	3.9078	
14	හන්තාන	0.0148	
15	හන්තාන	0.0121	
16	පල්ලේකැලේ	1.0679	
17	ප්‍රොවිඩන්ස් වත්ත	5.4806	
	එකතුව	*25.1627*	

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය පහත අංශ වලින් සමන්විත වේ.

- ඉංජිනේරු අංශය
- වාස්තු විද්‍යා අංශය
- ප්‍රමාණ සමීක්ෂණ අංශය
- සැලසුම් අංශය
- විදුලි අංශය
- නඩත්තු අංශය
- ව්‍යාපෘති අංශය
- පාලන අංශය
- පරිශ්‍ර අංශය

2022 වර්ෂය තුලදී පහත සඳහන් වැඩසටහන් මගින් සියළු ජන කොටස් වල නිවාස අරමුණු හා ඒ සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමට කටයුතු කර ඇත.

නගමු පුරවර - 2022 (මුදල් වෙන් කිරීම - රු. මිලි. 100

	ව්‍යාපෘතිය	ඇස්තමේන්තු ගත මුදල රු.මිලි.	වෙනත්
1	ලුවිසාවත්ත මල පෙරහන් ටැංකි 2 හි නවීකරණ කටයුතු (මුදල් වෙන් කිරීම - රු. මිලි. 100)	148.9	2022 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී නොමැති බැවින් ක්‍රියාත්මක කර නොමැත

නගමු පුරවර (අවිච්ඡේද)

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව	ප්‍රගතිය		වෙනත්
1	සාංචිආරච්චිවත්ත නිවාස ක්‍රමයේ නවීකරණ කටයුතු	224	100%	99%	අවසාන බිල්පත ගෙවීමට ඇත
2	ඇලපිටිවල නිවාස ක්‍රමයේ ජල ටැංකිය, මළ නල හා කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම	160	100%	100%	බිල්පත ගෙවා අවසන්
3	හිඹුටු උයන නිවාස ක්‍රමයේ මළ පිරිපහදු පද්ධතිය අළුත්වැඩියාව	-	-	-	ඇස්තමේන්තු වටිනාකම රු.මි. 67 කි. රු.මි. 26 ක් ගෙවා ඇත. ඉතිරි මුදල මේ වන විට භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් ලැබී ඇති අතර ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය වෙත ගෙවීමට කටයුතු කරමින් පවතී. අනතුරුව එම ආයතනය විසින් ටෙන්ඩර් කැඳවා ඉදිරි කටයුතු කිරීමට නියමිතය.
4	ඌරාවත්ත දියවරපුර නිවාස ව්‍යාපෘතියේ අළුත්වැඩියා කටයුතු	64	100%	85%	ධීවර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් සිදු කර ඇත. අවසන් බිල්පත ගෙවීමට ඇත.

විශේෂ ව්‍යාපෘති - 2022 (අභ්‍යන්තර උත්පාදන යටතේ සිදු කර ඇති)

	කොන්ත්‍රාත්තුව	කොන්ත්‍රාත් මුදල රු.	කොන්ත්‍රාත්තුව ආරම්භ කල දිනය	කොන්ත්‍රාත්තුව අවසන් කල දිනය	වෙනත්
1	පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ විදුලි නවීකරණ කටයුතු	1,832,095.00	2022.04.06	2022.06.20	අවසන් බිල්පත ගෙවීමට ඇත.
2	යෝජිත අනුරාධපුර දහයියාගම නිවාස ව්‍යාපෘතියේ පාංශු පරීක්ෂාව	251,000.00	2022.03.11	2022.05.10	බිල්පත ගෙවීමට ඇත.
3	අනුරාධපුර සංචාරක බංගලාවේ විදුලි නවීකරණ කටයුතු	1,849,228.00	2022.04.09	2022.06.24	අවසන් බිල්පත ගෙවා ඇත.
4	අනුරාධපුර සංචාරක බංගලාවේ නවීකරණ කටයුතු (අදියර 02)	1,955,767.50	2022.04.05	2022.05.18	අවසන් බිල්පත ගෙවා නැත.
5	අනුරාධපුර සංචාරක බංගලාවේ බාහිර නවීකරණ කටයුතු	1,377,500.00	2022.04.05	2022.05.18	අවසන් බිල්පත ගෙවා ඇත.
6	ප්‍රධාන කාර්යාලයේ මෝටර් කාමරයේ, ලේඛණාගාරයේ, සහ ක්‍රීඩාගාරයේ ඇලුමිනියම් තහඩුවක් මඟින් ආවරණයක් යෙදීම	682,250.00	2022.10.20	2022.10.28	අවසන් බිල්පත ගෙවා ඇත.
7	මාළිගාවත්ත මොහිදීන් මස්ජීඩ් නිවාස ක්‍රමයේ පොම්පාගාරයේ නවීකරණ කටයුතු	464,000.00	2022.10.20	2022.11.08	අවසන් බිල්පත ගෙවා ඇත.
8	ප්‍රධාන කාර්යාලයේ බිම් මහල කැලි කසල එකතු කිරීමේ ස්ථානයේ නවීකරණ කටයුතු	547,217.00	2022.09.02	2022.09.08	අවසන් බිල්පත ගෙවා ඇත.
9	ජාතික නිවාස සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ලේ 3 වන මහලේ මලාපවාහන මාර්ග අලුත්වැඩියා කිරීමේ කටයුතු	409,970.00	2022.11.26	2022.11.27	අවසන් බිල්පත ගෙවා ඇත.
11	අනුරාධපුර සංචාරක බංගලාව අලුත්වැඩියා කිරීම	4,917,215.62	2021.11.22	2022.03.17	අවසන් බිල්පත ගෙවීමට ඇත.
12	පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය අලුත්වැඩියා කටයුතු	7,912,765.00	2021.12.13	2022.06.20	අවසන් බිල්පත ගෙවීමට ඇත.
13	ප්‍රධාන කාර්යාලයේ 5 වන මහලේ ශ්‍රවණාගාරයේ cut & polish wooden flooring	246,500.00	2022.10.27	2022.11.12	අවසන් බිල්පත ගෙවා ඇත.

පෙර විකුණුම් මහල් නිවාස ව්‍යාපෘති

(i) මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති.

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	භෞතික ප්‍රගතිය	වෙනත්
1	තංගල්ල නිවාස ව්‍යාපෘතිය	30	99%	ඉදිකිරීම් සිදු කරමින් පවතී
2	සොයිසාපුර නිවාස ව්‍යාපෘතිය	30	52%	ඉදිකිරීම් සිදු කරමින් පවතී
3	කොහොලන්කල අඩු ආදායම් හා මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය	330		ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී

(ii) සියපත නිවාස ව්‍යාපෘති

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	භෞතික ප්‍රගතිය	වෙනත්
1	රන්පොකුණුගම නිවාස ව්‍යාපෘතිය	72	8%	මූලික පරිසර පරීක්ෂණ වාර්තාව (IEE Report) මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කර ඇත. එහි තීරණය ලබන සතියේ ලැබීමට නියමිතය.
2	වැරැල්ලවත්ත නිවාස ව්‍යාපෘතිය	154	6%	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය මත ඉදිකිරීම් නතර කර ඇත.
3	ගම්පහ වැවේගොඩැල්ලවත්ත නිවාස ව්‍යාපෘතිය	40	15%	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය මත ඉදිකිරීම් ප්‍රමාද වී ඇත. මෙහි මහල් ගණන 4 කට සීමා කිරීමට තීරණය කර ඇත. අදාළ සැළසුම් අනුමැතිය ලබා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඇත. තවද අභිලාෂයන් කැදවීමට සකසා ඇති (කෙටුම්පත්) Documents ඇගයීමට ලක් කිරීම සඳහා කමිටුව නම් කර අමාත්‍යාංශ ලේකම් විසින් එවා ඇත

රාජ්‍ය පෞද්ගලික ඒකාබද්ධ නිවාස ව්‍යාපෘති

මෙම වැඩසටහන මධ්‍යම පාන්තික නිවාසලාභීන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා පිහිටුවන ලද්දකි. දේශීය/ විදේශීය පුද්ගලික ආයතනය සමඟ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය රාජ්‍ය හා පෞද්ගලික ඒකාබද්ධ ගිවිසුමකට එළඹ පෙර විකුණුම් පදනම යටතේ මෙම නිවාස ඉදිකරනු ලැබේ.

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	ප්‍රගතිය
1	හන්තාන - අදියර II	82	ප්‍රදේශයේ පවතින පාරිසරික හේතූන් මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට එරෙහිව ගොණු කර තිබූ නඩුවේ තීන්දුව ලැබී ඇති අතර ඒ අනුව පෙත්සම් පාර්ශවයේ චෝදනාව නිශ්ප්‍රභා කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. මිල විචලනය සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.
2	හන්තාන - අදියර III	20	
3	යක්කල, සියනෑ උයන සොබා උයන නිවාස ව්‍යාපෘතිය	42	99%
4	කළුගල පල්ලෙකැලේ රීජන්සි උද්‍යාන නිවාස ව්‍යාපෘතිය		
	අදියර I	11	92%
	අදියර II	10	

මධ්‍යම පාන්තික නිවාස වැඩසටහන.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම් වල ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය මඟින් කරන ලද ව්‍යාපෘති සඳහා දායකත්වය ලබා දීම.

	ව්‍යාපෘතිය	නිවාස ගණන	ප්‍රගතිය	වෙනත්
1	මවුන්ට් ක්ලිෆර්ඩ්	82	100%	ජනතා අයිතියට පවරා ඇත
2	නුගගහකනත්තවත්ත - වාද්දුව පානදුර	20	66%	සංවර්ධන ආයතනය උසාවි නියෝගයක් මඟින් wind –up කර ඇත. බේරුම්කරණ නිළධාරියෙකු පත් කලද ඔහු ඉල්ලා අස්වීම මත නව බේරුම්කරණ නිළධාරියෙකු පත් කිරීමට නියමිතය.
3	දඹුවවත්ත - රාගම	124	55%	
4	ජල්තර අදියර II – හෝමාගම	252	100%	ජනතා අයිතියට පවරා ඇත.

ප්‍රසම්පාදන කටයුතු

2022 වර්ෂය තුල නිවාස ක්‍රම වල අත්‍යාවශ්‍ය කටයුතු, සංචාරක බංගලා සහ ප්‍රධාන කාර්යාලය තුල නවීකරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවා ඇති ගණන 16 කි. ව්‍යාපෘති 12 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපි නිකුත් කර ඇත.

	ව්‍යාපෘතිය	කොන්ත්‍රාත් අංකය	ව්‍යාපෘතිය ප්‍රදානය කර ඇත/ නැත
1	මුල්ලේරියාව හිඹුටු උයන නිවාස ක්‍රමයේ මලාපවාහන පද්ධතියේ ක්‍රියාකාරීත්වය සහ නඩත්තු කොන්ත්‍රාත්තුව	1427/21	ඇත
2	මුල්ලේරියාව හිඹුටු උයන නිවාස ක්‍රමයේ දැල් කම්බි වැට නවීකරණය	1396/21	නැත
3	මාළිගාවත්ත ආදර්ශ නිවාස පරිශ්‍රයේ පවතින වැට නවීකරණය	1424/21	නැත
4	රජපිහිල්ල සංචාරක බංගලාව නවීකරණය හා එහි භාරකරුගේ කාමරයේ අළුත්වැඩියාවන්	1426/21	ඇත
5	පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ විදුලි නවීකරණයන්	1430/22	ඇත
6	අනුරාධපුර දහයියාගම නිවාස ව්‍යාපෘතියේ පාංශු පරීක්ෂාව	1435/21	ඇත
7	අනුරාධපුර සංචාරක බංගලාවේ විදුලි නවීකරණ කටයුතු	1433/22	ඇත
8	අනුරාධපුර සංචාරක බංගලාවේ නවීකරණ කටයුතු අදියර II	1437/22	ඇත
9	අනුරාධපුර සංචාරක බංගලාවේ භාහිර නවීකරණ කටයුතු	1438/22	ඇත
10	නිවාස කොමසාරිස් කාර්යාලයේ 2 වන මහල පාර්ටිෂන් කිරීම හා වැසිකිළිය ඉදිකිරීම	1442/22	නැත
11	ප්‍රධාන කාර්යාලයේ මෝටර් කාමරයේ , ලේඛණාගාරයේ සහ ක්‍රීඩාගාරයේ Flashing සවී කිරීම	1447/22	ඇත
12	මාළිගාවත්ත මොහිදීන් මස්ජීඩ් නිවාස ක්‍රමයේ පොම්පාගාරය ඉදිකිරීම	1458/22	ඇත
13	බිම් මහලේ කසල එකතු කිරීමේ මධ්‍යස්ථානය අසල මලාපවාහන මාර්ගය අළුත්වැඩියාව	1460/22	ඇත
14	ප්‍රධාන කාර්යාලයේ 5 වන මහලේ ශ්‍රවණාගාරයේ cut & polish wooden flooring	1462/22	නැත
15	පොළොන්නරුව සංචාරක බංගලාවේ ඉදිකිරීම් හා නවීකරණයන්	1463/22	ඇත
16	ප්‍රධාන කාර්යාලයේ 3 වන මහලේ මලාපවාහන මාර්ග නවීකරණයන්	1471/22	ඇත

ව්‍යාපෘති සඳහා සැළසුම් ඇඳීම

(i) සොයිසාපුර කාර්යාල පරිශ්‍රයේ ඉදිකිරීමට යෝජිත මහල් 6 කින් යුත් ගොඩනැගිල්ල.
(ii) කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ යෝජිත partition Design
(iii) මොහිදීන් මස්ජිඩ් නිවාස ක්‍රමයේ යොජිත පොම්පාගාරය (pump house)
(iv) රජපිහිල්ල සංචාරක බංගලාවේ රියදුරු නේවාසිකාගාරයේ Details සැළසුම්
(v) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ යෝජිත ආරක්ෂක කුටිය (දුම්රිය මාර්ගය අසල)
(vi) මාළිගාවත්ත ප්‍රදීපාගාරයේ - Landscape layout හා details සැළසුම්
(vii) බදුල්ල, පොළොන්නරුව හා නුවරඑළිය සංචාරක බංගලා වල යෝජිත අතිරේක අංග සහ වැඩිදියුණු කිරීම් වලට අදාළ සැළසුම්
(viii) සොයිසාපුර නව ව්‍යාපෘතියේ balcony guard wall සැළසුම

(ix) බදුල්ල, පොළොන්නරුව, කතරගම හා නුවරඑළිය සංචාරක බංගලාවන්හි Electrical layout සහ details සැළසුම

(x) නුවරඑළිය සංචාරක බංගලාවේ ජල ටැංකියට අදාළ details, Roof plans සහ details සැළසුම

(xi) නවීකරණ කරනු ලබන නිවාස ව්‍යාපෘති සඳහා වැසිකිළි හා නාන කාමර වල ජලරෝධන (Water proofing Details) පොදු සැළසුම

(xii) ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සැළසුම් හා සමරු ඵලකයට අදාළ සැළසුම්

(xiii) ප්‍රධාන කාර්යාලයේ නීති අංශයට වානේ රාක්ක සැළසුම

මෙයට අමතරව පැරණි නිවාස ක්‍රමයන්හි පදිංචිලාභීන්ගේ අවශ්‍යතාවය අනුව ගොඩනැගිලි සැළසුම් මුද්‍රණය කර ලබා දීම එයට අදාළ ලිපි ආදිය නිකුත් කිරීමේ කටයුතුද සිදු කෙරේ

සභාධිපත්‍ය දේපළ

- 2009.12.31 දිනට පෙර පලාත් පාලන ආයතන වල අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති සඳහා 2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ ඔප්පු ලබා දීමට ක්‍රියා කල හැකි අතර ඒ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිවාස පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගොඩනැගිලි තත්ව පිළිබඳව නිකුත් කරන සහතිකය පදනම් කර ගනු ලැබේ.
- ඒ අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු නිළධාරීන් සමඟ සම්බන්ධීකරණය වී නිවාස පරීක්ෂා කිරීම් හා ඉදිරි කටයුතු සිදු කෙරේ.
- 2023.04.30 දින වන විට නිවාස ක්‍රම 25 කට අදාළ සභාධිපත්‍ය පිඹුරු 61 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට යවා ඇති අතර සභාධිපත්‍ය පිඹුරු 59 කට අදාළව නිවාස 1868 ක් එහි නිළධාරීන් විසින් පරීක්ෂා කර ඇත. නිවාස ක්‍රම 17 කට වාර්තා එවා ඇත. එයින් නිර්දේශය ලැබී ඇති නිවාස ක්‍රම 09 කට අදාළ සහතික, ඔප්පු ලබා දීමේ ඉදිරි කටයුතු සඳහා නීති අංශයට යොමු කර ඇත.

පොම්පාගාර හා විදුලි නඩත්තු කටයුතු

හිඹුටු උයන හා මුල්ලේරියාව නිවාස ක්‍රම වල මලාපවාහන නඩත්තු කටයුතු කොන්ත්‍රාත්කරුවෙකු ලවා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කර ඇත. එසේම සේවා අවශ්‍යතාවය අනුව ප්‍රධාන කාර්යාලයේ සහ නිවාස ක්‍රම වල පොම්ප නඩත්තු කටයුතු සිදු කරනු ලබයි.

මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශය

ආයතනයේ මිනිස් බල සැලැස්ම ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන මෙහෙයුම් ඒකකය මානව සම්පත් කළමනාකරණ අංශයයි. මේ මගින් ආයතනික මානව සම්පත් කළමනාකරණයට අදාළ නීතිරීති හා රෙගුලාසි සම්පාදනය කිරීමට සහය දැක්වීම මෙන්ම අධිකාරියේ පනතේ සඳහන් නියමයන්ට අනුව ආයතන ඵලදායි ඉලක්ක ගත නිවාස සංවර්ධන වැඩසටහන කරා මෙහෙය වීමට අවශ්‍ය මානව සම්පත කළමනාකරණය කිරීම මෙම අංශය මගින් සිදු වේ. ඒ අනුව බදවා ගැනීම්, උසස්වීම්, ස්ථාන මාරුකිරීම්, සේවක ආරවුල් විසඳීම්, කම්කරු ආරවුල් සඳහා පෙනී සිටීම, සේවක අභියාචනාවන්ට ප්‍රතිචාර දැක්වීම යනාදී මානව සම්පත් කළමනාකරණය තුල සියලු රාජකාරී මෙම අංශය මගින් සිදුකෙරේ.

2022 වර්ෂය තුල මානව සම්පත් අංශය තුල සිදු වූ වෙනස්වීම් පහත පරිදි වේ.

2022.12.31 දිනට භෞතික කාර්ය මණ්ඩල සාරාංශය

සේවා මට්ටම	අනුමත කාර්ය මණ්ඩල		භෞතික කාර්ය මණ්ඩලය (2022.12.31 දිනට)				
	ස්ථිර	කෙටිකල් දරන්නාට වෙන්දේශික අනුමත	ස්ථිර	කෙටිකල් දරන්නාට වෙන්දේශික	කොන්ත්‍රාත්	දෛනික	සේවා ගිවිසුම්
ජ්‍යෙෂ්ඨ	206	2	81	-	-	-	-
තෘතීය	252	101	262	-	-	-	-
ද්විතීය	893	387	576	332	-	-	-
ප්‍රාථමික	219	104	104	90	-	-	-
එකතුව	1570	594	1023	422	-	-	-
එකතුව	2164		1445		236	35	03

කාල සීමාවට අදාලව සිදුකරන ලද බඳවාගැනීම්

සෘජු බඳවා ගැනීම්			විශ්‍රාම ගැන්වීමෙන් පසු නැවත සේවය බඳවා ගැනීම්			එකතුව
විධායක	ස්ථිර විධායක නොවන	කොන්ත්‍රාත්	දෛනික	සේවා ගිවිසුම්	දෛනික	
-	-	-	05	02	-	07

- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා 2022 වර්ෂය තුල අභ්‍යන්තර උසස්වීම් මගින් උසස්වීම් ලබා දීම් 02 ක් සිදුකර ඇත.

- 2022 වර්ෂය තුල විශ්‍රාම ගැන්වීම්, සේවය අවසන් වීම්, ධූරය අතහැර යෑම් හා ඉල්ලා අස්වූ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

සේවා මට්ටම	විශ්‍රාම ගැන්වීම්	සේවය අවසන් කිරීම්	ඉල්ලා අස්වීම්	ධූරය අතහැර යෑම්	සේවයෙන් පහ කිරීම්
ජ්‍යෙෂ්ඨ	07	-	02	01	01
තෘතීය	45	-	11	-	-
ද්විතීය	18	04	14	02	01
ප්‍රාථමික	15	-	06	04	-
එකතුව	85	04	33	07	02

- මෙම අධිකාරියේ සේවයේ නියුතුව සිටිය දී 2022 වර්ෂය තුල මරණයට පත් වූ සේවක සංඛ්‍යාව 04 කි.

- මෙම අධිකාරියේ ප්‍රායෝගික පුහුණුව හා උපාධිධාරී පුහුණු ලාභීන් පහත පරිදි වේ.
  - ප්‍රායෝගික පුහුණුලාභීන් සංඛ්‍යාව - 05
  - උපාධිධාරී පුහුණුලාභීන් සංඛ්‍යාව - 01

මානව සම්පත් කළමනාකරණ අංශයේ සාමාන්‍ය කාර්යභාරය

- ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල සඳහා සේවක අවශ්‍යතා/ පුරප්පාඩු හඳුනා ගැනීම, ඒ අනුව වාර්ෂික මිනිස්බල අයවැය සකස් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර අනුමැතිය ලබා ගැනීම හා කාර්ය මණ්ඩලය යාවත්කාලීන කිරීම.
- බඳවා ගැනීම් පරිපාටිය සකස් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර අනුමැතිය ලබා ගැනීම.
- පුරප්පාඩු පිරවීම සඳහා අදාල අනුමැතීන් ලබා ගැනීම, අයදුම්පත් කැඳවීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය දැන්වීම් පළ කිරීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, සුදුස්සන් හඳුනා ගැනීම, පත්වීම් ලබාදීම සහ පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීම.
- මෙම අධිකාරියේ ස්ථිර, කොන්ත්‍රාත්, දෛනික පුද්ගලික ලිපිගොනු පවත්වා ගෙන යාම. (මුල් පත්වීම් දින සිට සේවය අවසන් වන දින දක්වා වූ රාජකාරි)
- අභ්‍යන්තර උසස්වීම් සඳහා අයදුම්පත් කැඳවීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, සුදුස්සන් හඳුනා ගැනීම, උසස්වීම් ලබාදීම සහ පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීම.
- වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා ස්ථාන මාරුවීම කමිටු පත් කිරීම හා ඒවායේ නිර්දේශ ලබා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම / විශේෂ හේතු මත ස්ථාන මාරුවීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- විධායක ශ්‍රේණියේ නිළධාරීන්ගෙන් වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීම හා ඒ සම්බන්ධ ලේඛන පවත්වාගෙන යාම හා සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීම සම්බන්ධ කටයුතු.
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් සංශෝධන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සියළු රාජකාරී.
- පරිපාලන රාමුව තුළ විසඳුම් ලබා දිය හැකි සේවක දුක් ගැනවිලි විසඳීම සඳහා ඉදිරි කටයුතු සිදු කිරීම.
- අධිකාරියේ ස්ථාපනය කර ඇති සේවක අභියාචනා කමිටුව වෙත සේවක දුක් ගැනවිලි (ඉහල කළමනාකාරීත්වයේ නිර්දේශ සහිතව ලැබෙන) යොමු කිරීම, එම දුක්ගැනවිලි විසඳීමට අදාළ කාර්යයන් ඉටුකිරීම.
- කාර්මික ආරවුල් (මානව හිමිකම් / කම්කරු කොමසාරිස්/ කම්කරු විනිශ්චය සභා/ පාර්ලිමේන්තු උපදේශක කාරක සභා/ කම්කරු අධිකරණ) පිළිබඳ කටයුතු.
- සේවකයින්ගේ විශ්‍රාම ගැන්වීම්, ඉල්ලා අස්වීම්, වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම් ආදී කටයුතු ඉටුකිරීම.
- සේවය අවසන් කල සේවකයින් හට හිමි සේවක අර්ථ සාධක අරමුදල්/ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්/පාරිතෝෂික දීමනා ගෙවීම් පිළිබඳ කටයුතු කිරීම හා සේවකයින්ගෙන් අධිකාරිය වෙත අයවීමට ඇති මුදල් අයකර ගැනීමේ කටයුතු.
- චක්‍රලේඛ ප්‍රකාරව වගකිව යුතු තනතුරු දරණ නිලධාරීන්/ සේවකයන් (ආරක්ෂක, මුදල් අයකැමි වැනි) විසින් තැන්පත් කල යුතු ඇප තැන්පතු අයකර ගැනීම හා ඔවුන් විශ්‍රාම යාම/ ඉල්ලා අස්වීමත් සමග එම ඇප තැන්පතු නිදහස් කිරීම.
- මානව සම්පත් කළමනාකරණ විෂය පථයට අදාලව අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සකස් කර යොමු කිරීම හා ආදාල තීරණ ක්‍රියාත්මක කිරීම.
- ගරු ඇමතිතුමා/ රේඛීය අමාත්‍යාංශය/ අමාත්‍ය කාර්යාලයට හා ඉහළ

කළමනාකාරීත්වය වෙත ලැබෙන සේවක ඉල්ලීම් සඳහා විසඳුම් ලබාදීම/ පිළිතුරු ලබාදීම.

- මානව සම්පත් කළමනාකරණ විෂය පථයට අදාලව රජයේ විගණන විමසුම් හා අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම.
- රේඛීය අමාත්‍යාංශයේ පැවැත්වෙන ගරු අමාත්‍යතුමාගේ හා ආයතන ප්‍රධානීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම්, කළමනාකරණ කමිටු රැස්වීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වැනි වෙනත් විවිධ අභ්‍යන්තර රැස්වීම් නියෝජනය.
- මානව සම්පත් කළමනාකරණ විෂය පථයට අදාලව පොදු ව්‍යාපාර කාරක සභාව, ජනාධිපති විමර්ෂන කොමිෂන් සභාව, මූල්‍ය අපරාධ විමර්ෂන කොට්ඨාශය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා අදාළ තොරතුරු ලබා දීම හා නියෝජනය.
- මුදල් අමාත්‍යාංශය වෙත කාර්තුමය වශයෙන් ඉදිරිපත් කල යුතු වාර්තා හා ලිපි සකස් කිරීමේ කටයුතු හා රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු මාසික හා කාර්තුමය වාර්තා සකස් කිරීම.

දෛනික කාර්යයන්ට අමතරව සිදුකරන ලද විශේෂ කාර්යයන්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත 2018 මිනිස්බල ඇස්තමේන්තුවට අදාලව සේවා අවශ්‍යතාවය පවතින තනතුරු අනුමත නව කාර්ය මණ්ඩලයේ පවතින ගැටළු හා අතිරික්ත කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කිරීම.

මානව සම්පත් කළමනාකරණයට අදාල කාර්යයන් ඉටුකිරීමේදී මුහුණ දීමට සිදුවූ අභියෝග

- කාර්ය මණ්ඩලය තුල පවතින පරිගණක දැනුම අඩුකම හා නව තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳ පළපුරුද්ද අඩුවීම හේතුවෙන් අරමුණු කරා ලගාවීමේදී ගැටලුකාරී තත්වයන්ට මුහුණ දීමට සිදු වුවද පෙර වර්ෂයන්ට සාපේක්ෂව අදාල කටයුතු කාර්යක්ෂමව සිදු කරගෙන ඇත.
- මානව සම්පත පිළිබඳ නිවැරදි තොරතුරු නියමිත වේලාවට ලබාගත හැකිවන පරිදි ක්‍රමවේද වැඩිදියුණු වී නොතිබීම.
- මානව සම්පත් කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට අදාල කාර්යයන් විවිධ හේතූන් මත නියමිත ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක නොවීම තුල සේවක ගැටළු මතුවීම හා ඒ තුළින් සේවක තෘප්තිය හීනවීම හා කම්කරු ආරවුල් සඳහා වැඩි නැඹුරුතාවයක් දැක්වීම.

අභියෝග වලට මුහුණ දීම සඳහා ක්‍රියාත්මක කලයුතු යෝජනා

මානව සම්පත් කළමනාකරණයට අදාල කාර්යයන් ප්‍රශස්ථව ඉටුකරමින් සමස්ථ ආයතනික අරමුණු ලගාකර ගැනීමේදී මෙම අංශයට මුහුණ දීමට සිදුවන අභියෝග වලට මුහුණ දීම සඳහා ක්‍රියාත්මක කලයුතු යෝජනා පහත පරිදි වේ.

- මානව සම්පත් කළමනාකරණ විෂයට අදාල තීරණ ගැනීමේදී පවතින චක්‍රලේඛ , විධිවිධාන හා නීතිරීති වලින් බැහැරව කටයුතු කිරීම තුළින් ප්‍රායෝගික ගැටළු මතු වී ඇති බැවින් නියමිත ක්‍රමවේදයන් තුල පිහිටා තීරණ ගැනීම සඳහා අවධානය යොමු කිරීම.
- සේවක තෘප්තිය වැඩිදියුණු වන ආකාරයෙන් මානව සම්පත උපයෝජනය කරගැනීම.
- සේවකයින්ගේ වාර්ෂික ක්‍රියාකාරීත්ව ඇගයීම් ක්‍රමය වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෘ නියමිත පරිදි කාර්ය මණ්ඩල ඇගයීම

සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරීන් දැනුවත් කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම.

- සේවක දුක්ගැනිවිලි සම්බන්ධයෙන් නිරන්තරයෙන් විමසා බලමින් ඒ සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම.
- නිරන්තරයෙන් සේවක පුහුණු වැඩසටහන් හා කුසලතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සේවක ඵලදායිතාවය වැඩිදියුණු කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා සේවකයන් තුල තොරතුරු තාක්ෂණය පිළිබඳ වැඩිදියුණු කිරීමට අදාල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම. තවද ආයතින සංස්කෘතියට ගැලපෙන ආකාරයෙන් සේවක ආකල්ප වෙනස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

පාලන අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පාලන අංශය ප්‍රධාන කාර්යාලය ඇතුළු සියළුම දිස්ත්‍රික් කාර්යාල හා උප කාර්යාලවල පරිපාලන චක්‍රලේඛ නිකුත් කිරීම, අතිකාල, සංයුක්ත දීමනා, ගමන් වියදම් දීමනා, ගෙවල් කුලි දීමනා ඇතුළු අනෙකුත් දීමනා අනුමත කිරීම හා කාර්යාල කළමනාකරණ හා සියළුම පරිපාලනමය කටයුතු මෙහෙයවීම සිදුකරයි. කාර්යාල කළමනාකරණයට අදාල සියළුම දැනුවත් කිරීම චක්‍රලේඛ පාලන අංශයෙන් සිදුවන අතර ප්‍රධාන කාර්යාලය මඟින් දෛනික මෙහෙය වියයුතු තැපෑල, දෛනික පැමිණිම, පිටවීම හා සමස්ථ කාර්ය මණ්ඩලය සෘජුව සම්බන්ධීකරණය කිරීම සිදුවේ. මීට අමතරව කාර්ය මණ්ඩලයේ පරිපාලනයට අදාල පහත සඳහන් කාර්ය භාරයන් පාලන අංශයෙන් මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ සිදුකරනු ඇත.

පාලන අංශය යටතේ ක්‍රියාත්මක සේවාවන්

- කාර්යාල කළමනාකරණයට අදාල සියළුම චක්‍රලේඛ, ලිපි, ලේඛණ, කාර්යාල නියෝග හා විශේෂ දැන්වීම් ලිපි නිකුත් කිරීම හා ගොනු පවත්වා ගැනීම.
- ප්‍රධාන කාර්යාලයේ සමස්ථ කාර්යය මණ්ඩලයේ පැමිණිම හා සම්බන්ධ රාජකාරි කටයුතු
- වෛද්‍ය ප්‍රතිලාභ
- ආපදා ණය වැඩ සටහන
- මාණ්ඩලික නිවාස ණය වැඩ සටහන (සමස්ථ කාර්ය මණඩලය සඳහා)
- රාජකාරි හැඳුනුම්පත් නිකුත් කිරීම හා නැවත භාර ගැනීම
- ඇඟිළි සළකුණු යන්ත්‍ර පවත්වා ගැනීම හා ඊට අදාල සේවාවන්
- සන්නිවේදන පහසුකම් හා සම්බන්ධ කටයුතු
- දෛනික තැපෑල කටයුතු
- දිස්ත්‍රික් කාර්යාල/ කලාප කාර්යාලවල රාජකාරි කටයුතු හා ප්‍රධාන කාර්යාල ගෙවීම් කටයුතු
- ඉංජිනේරුවන්, ඉංජිනේරු සහකාරවරුන් හා තාක්ෂණ නිලධාරීන් ඇතුළු ක්ෂේත්‍ර නිලධාරයන්ගේ යතුරු පැදි සැතපුම් කුලි දීමනා ඉල්ලිම් කටයුතු
- දිස්ත්‍රික් කාර්ය මණ්ඩල දුෂ්කර සේවා ස්ථාන නිවාස කුලි දීමනා ගෙවීම් කටයුතු
- දිස්ත්‍රික් කාර්යාල/ කලාප කාර්යාලවල සනිපාරක්ෂක කටයුතු හා සම්බන්ධ කටයුතු
- ප්‍රධාන කාර්යාලය ඇතුළු කාර්යාල ගොඩනැගිලි බදු / කුලි, රක්ෂණ කටයුතු, බදු ගෙවීම් කටයුතු
- කාර්යාල අලුත්වැඩියාවන් හා භාණ්ඩ මිලදි ගැනීම් හා අදාල කටයුතු
- ප්‍රධාන කාර්යාලයේ සමස්ථ කාර්යය මණ්ඩලයට අවශ්‍ය තේ සැපයීම්
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ලේඛණාගාරයන් පවත්වා ගැනීම
- නිවාස කොමසාරිස්/ නිවාස දෙපාර්තමේන්තුව සතු ලේඛණාගාරය පවත්වා ගැනීම හා ඊට අදාල කටයුතු
- ආයතනික ආපනශාලාව පවත්වා ගෙන යැම

- ආයතනික ආරක්ෂක සේවාවන්ට අදාල බිල්පත් පරීක්ෂා කර ගෙවීම් සඳහා යොමු කිරීම හා ආරක්ෂක සේවාවන් සපයා ගැනීමේ කටයුතු
- සියළු විදුලි සෝපාන කටයුතු
- බාහිර අමුත්තන් පිළිගැනීම හා සේවා අවශ්‍යතාවය හදුනා ගෙන අදාල ස්ථානයන් වෙත යොමු කිරීම
- දුරකථන පණිවුඩ හුවමාරු මධ්‍යස්ථාන කටයුතු හා අභ්‍යන්තර දුරකථන පද්ධති කටයුතු සිදු කිරීම
- ප්‍රධාන කාර්යාලයේ 5 මහලේ පිහිටි සභා ශාලාවේ කටයුතු
- ප්‍රධාන කාර්යාලයේ අදාල අංශයන් වෙත පුවත්පත් සැපයීම
- සුළු මුදල් පොත පවත්වා ගැනීම
- භාණ්ඩ ඇනවුම් කිරීම හා ලේඛණ පවත්වා ගෙනයාම
- වට්ටෝරු ලේඛණය පවත්වා ගෙන යාම
- වෘත්තිය සමිති සම්බන්ධ කටයුතු
- මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශයෙහි අන්තර්ජාල,පරිගණක කටයුතු කිරීම

මෙම අංශය තුල පහත සඳහන් අයුරින් සේවකයින් අනුයුක්තව සේවය කරනු ලබයි.

තනතුර	සේවා කාණ්ඩය	සේවක සංඛ්‍යාව
කළමනාකරු	MM 1-1-1	01
පරිපාලන නිළධාරි	JM 1-1 -II	04
පිළිගැනීමේ නිළධාරි	JM 1-1 -II	-
ල.ය.ලේ./පුද්ගලික සහකාර	JM 1-1 -II	01
කළමණාකරන සහකාර -02	MA1-II -I	03
පරිගණක ක්‍රියාකරු - 01		
කළමණාකරන සහකාර -04	MA1-II -III	05
දුරකථන ක්‍රියාකරු - 01		
කාර්යාල කාර්ය සහායක	PL 1 -III	01
කාර්යාල කාර්ය සහායක	PL 1 -III	05
(වෙනත් තනතුරු වල රාජකාරී ඉටුකිරීම/ආවරණය)		
කළමනාකරණ සහකාර රාජකාරී ආවරණ - 01		
ලේඛණ භාරකරු රාජකාරී ඉටු කිරීම - 01		
විදුලි සෝපානය ක්‍රියාකරු තනතුරේ - 01		
දුරකථන හුවමාරු මධ්‍යස්ථානය - 01		
පණිවිඩකරු රාජකාරී සඳහා - 01		
එකතුව		20

- 2022 වර්ෂයේ ප්‍රසාද දීමනා සේවකයින් වෙත ලබා දී ඇති අතර ආපදා ණය, යැපීම් දීමනා සංයුක්ත දීමනා ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම හා දිස්ත්‍රික් කාර්යාලවල කුලී දීමනා ගෙවීම් කටයුතු අනුමත කිරීමේ කටයුතු සිදුකර ඇත.

ආපදා ණය ඉල්ලුම් කර ඇති සේවකයන් ගණන	ආපදා ණය ගෙවූ මුදල
69	17,250,000.00

- ප්‍රධාන කාර්යාලයේ වැටුප් ලබන වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ සාමාජිකයින්ට පහත සඳහන් ආකාරයෙන් 2022 වර්ෂය සඳහා ගෙවීම් කර ඇත.

ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු	ප්‍රතිලාභ ලද සාමාජික ගණන	මුදල (රු)
බාහිර ප්‍රතිකාර	356	5,936,111.16
නේවාසික ප්‍රතිකාර පරීක්ෂණ හා වෛද්‍ය ගාස්තු	18	656,108.00
නේවාසික ප්‍රතිකාර ශල්‍යකර්ම හා වෛද්‍ය සේවා ගාස්තු	14	816,294.00
බරපතල සැත්කම් හා අබණ්ඩ ප්‍රතිකාර	8	1,516,008.00
රජයේ රෝහල් සඳහා නේවාසික ප්‍රතිකාර	16	42,826.00
බෝවන හා වසංගත රෝග	11	156,200.00
කා.නි. 2016/04 හි 08 ඡේදය අනුව ප්‍රතිලාභ	03	3,600.00

- 2022.12.31 දිනට වියදම්

කාර්යාලීය දුරකථන	3,493,596.00
තැපැල් වියදම	636,544.00
සීඝ්‍රගාමී තැපැල් - සුළු මුදල් වියදම් - **Petty Cash**	41,299.00
ප්‍රධාන කාර්යාල රක්ෂණ ආවරණය	1,899,319.39
මාතලේ දිස්. කාර්යාල කුළි	1,060,224.00
මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ රක්ෂණය	101,629.58
තේ සලාකය - සිනි කිලෝ 1 බැගින් 2310	517,166.00
තේ සලාකය - තේ කොළ ග්‍රෑම් 100 බැගින් 2310	244,529.25
2022 වර්ෂයට පුවත්පත් මිලදී ගැනීම සඳහා වියදම	365,590.00
සුළු මුදල් අග්‍රමය මඟින් 2022 වර්ෂය තුලදී මිලදී ගැනීම වෙනුවෙන් වැයවූ මුදල	1380.00
දුෂ්කර සේවා ගෙවල් කුළී දීමනාව ලබා දී ඇත	
දිස්ත්‍රික් කාර්යාල සඳහා යතුරු පැදි දීමනා ලබා දී ඇත	

මාණ්ඩලික නිවාස ණය අංශය

මෙම අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල ස්ථීර සේවයේ නියුතු (පරිවාස කාලය අවසන් කරන ලද) කාර්ය මණ්ඩලය සඳහා 4.2% ක පොලී ප්‍රතිශතය යටතේ පහත සඳහන් නිවාස අරමුණු සඳහා දේපළ උගස්කරයක් මත රු.1,500,000/-ක උපරිමයකට යටත්ව මාණ්ඩලික නිවාස ණය මුදල් ලබා දීම මෙම විෂයට අදාල කාර්යභාරය වේ. මෙහිදී මූලික වැටුප හා වයස අවු.60 දක්වා ඉදිරි සේවාකාලය පදනම් කරගෙන ණය ලබාදීම සිදුකරන අතර ණය අයකර ගැනීමේ උපරිම කාලසීමාව අවු.15 කි.

නිවාස ණය දෙනු ලබන අරමුණු

- නව නිවසක් ඉදිකිරීම
- නිවසක වැඩ අවසන් කිරීම/ පුළුල් කිරීම/ ප්‍රතිසංස්කරණය කිරීම
- නිවසක්/ඉඩමක් මිලයට ගැනීම
- නිවාස අරමුණක් සඳහා පිළිගත් මූල්‍ය ආයතන මගින් දේපළක් උගස්කර ලබා ගත් ණය මුදලක් බේරුම් කිරීම
- මෙම අධිකාරිය වෙතින් කුලී සින්න/ විකුණුම් පදනම මත ලබා ගත් නිවසක්/ මහල් නිවසක්/ ඉඩමක් මිලයට ගැනීම හෝ විකුණුම් මිලෙන් කොටසක් බේරුම් කිරීම

මාණ්ඩලික නිවාස ණය විෂයට අදාල තොරතුරු

සම්පාදනය කල ඉලක්ක

2022 වර්ෂයට ණය ලබාදී ඇති අරමුණු

අරමුණ	සංඛ්‍යාව
නව නිවසක් ඉදිකිරීම	03
නිවසක වැඩ අවසන් කිරීම/ පුළුල් කිරීම/ ප්‍රතිසංස්කරණය කිරීම	-
නිවසක්/ ඉඩමක් මිලයට ගැනීම	01
නිවාස අරමුණක් සඳහා මූල්‍ය ආයතනයකින් ලබාගත් ණය මුදලක් පියවීම	01

වැටුප් බාණ්ඩ පරාසය	ප්‍රධාන කාර්යාලය		දිස්ත්‍රික් කාර්යාලය		අනුමත කර ඇති මුළු මුදල (රුපියල්)
	සේවක සංඛ්‍යාව	මුදල (රුපියල්)	සේවක සංඛ්‍යාව	මුදල (රුපියල්)	
HM 2-1-MA 5-2	-	-	-	-	-
MA 2-2-MA 1-2	-	-	03	4,429,731.57	4,429,731.57
PL1-PL3	01	1,500,000.00	01	1,495,000.00	2,995,000.00
එකතුව	01	1,500,000.00	04	5,924,731.57	7,424,731.57

ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග

මෙම ආයතනයේ අයහපත් මූල්‍ය තත්වය මත 2022 වර්ෂයේ මුල සිටම මාණ්ඩලික නිවාස ණය ලබාදීම මන්දගාමීව සිදුවූ අතර මැයි මස සිට වර්ෂ අවසානය දක්වාම ණය ලබාදීම තාවකාලිකව නතර කර තිබූ බැවින්, ඉහත ලබා දී ඇති ණය මුදල් ද සුවිශේෂි හේතු මත ඉහළ කළමනාකරිත්වය වෙත කරුණු දක්වමින් ලබාදීමට කටයුතු කිරීම.

තවද ණය ලබාගැනීමට අපේක්ෂිත සේවකයින් විසින් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන නැවත ණය ලබාදීම ආරම්භ කරන ලෙස ඉල්ලමින් අවස්ථා කිහිපයකදී ඉහළ කළමනාකරිත්වයට ලිපිගොනු මඟින් කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

ඉලක්ක කරා ළඟාවීමේදි මුහුනපෑමට සිදුවූ ගැටළු

මෙම ආයතනයේ අයහපත් මූල්‍ය තත්වය මත 2022 වර්ෂයේ මුල සිටම මාණ්ඩලික නිවාස ණය ලබාදීම මන්දගාමීව සිදුවූ බැවින් හා මැයි මස සිට වර්ෂය අවසානය තෙක්ම ණය ලබා දීම තාවකාලිකව නතර කරන ලද බැවින් 2022 වර්ෂයේ ණය ලබාදීම පහත වැටීම.

පුහුණු අංශය

2022	වර්ෂය සඳහා අයවැය	(රු)
පුහුණු හා ශිෂ්‍යත්ව		1,500,000.00
පුහුණු ණය		4,500,000.00
එකතුව		6,000,000.00

වෙන් කිරීම් 2022				
අනු අංක	විස්තරය	2022අයවැය අනුව වෙන් කල මුදල (රු)	පුහුණු ඒකකය මඟින් වෙන් කල මුදල (රු:)	මුළු එකතුව
1	2022වර්ෂය සඳහා මුදල් වෙන් කිරීම්	1,500,000.00		
2	අභ්‍යන්තර පුහුණු වැඩ සටහන්		600,000.00	
3	බාහිර පුහුණු වැඩ සටහන් (දේශිය) (90%)		200,000.00	
4	ප්‍රධාන කාර්යාලය		200,000.00	
5	දිස්ත්‍රික් කාර්යාලය		200,000.00	
6	බාහිර පුහුණු වැඩ සටහන් - විදේශීය ශිෂ්‍යත්ව		500,000.00	1,500,000.00
7	පුහුණු ණය වැඩ සටහන	4,500,000.00		4,500,000.00
	2022වර්ෂයට පුහුණුව සඳහා වෙන් කල මුදල			6,000,000.00


2022 ප්‍රගතිය (2022-01-01 සිට 2022-12-31 දිනට)				
අනු අංක	වැඩ සටහන් විස්තරය	වැඩ සටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව	වියදම් වූ මුදල (රු:)
1	අභ්‍යන්තර පුහුණු වැඩසටහන්	2	90	45,000.00
2	බාහිර පුහුණු වැඩසටහන් (දේශිය) (90) ප්‍රධාන කාර්යාලය දිස්ත්‍රික් කාර්යාලය	3	16	183,150.00
3	බාහිර පුහුණු වැඩ සටහන් - (විදේශිය) ශිෂ්‍යත්ව			
4	ස්වාභිමන පුහුණු ණය වැඩ සටහන	3	6	300,000.00
	මුළු එකතුව	8	112	528,150.00

පුහුණු ඒකකයෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් වලට අදාල ඇස්තමේන්තු කළමනාකරණය කරගනිමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරින්/ සේවකයින්ට අදාල ක්ෂේත්‍රයන් සඳහා දේශිය හා විදේශිය දැනුමක් හා පුහුණුවක් ලබාදීම සඳහා මෙම පුහුණු ඒකකයෙන් සිදුකරනු ලැබේ.


විනය අංශය

යම් සේවකයකු ආයතනික මට්ටමින් නීතිරීති උල්ලංඝනය වන පරිදි සිදුකරන වැරදි සුළු හා බරපතල වැරදි ලෙස ගැනෙන අතර, සිදු කරන ලද වැරදි ස්වාභාවය අනුව විවිධ වූ දඩුවම් පැනවීම අවවාද කිරීම, සේවයෙන් ඉවත් කිරීම, අනිවාර්ය නිවාඩු යැවීම ලෙස වර්ගීකරණය කර ආයතනයේ විනය ව්‍යවස්ථාව අනුව සේවකයින් ගේ හැසිරීම ක්‍රියාකාරකම පාලනය කිරීම ඊට අදාල අනපනත් ක්‍රියාක්මක කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම විනය අංශය මඟින් සිදුකරනු ඇත.

එහෙත් 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ බරපතල විශමචාර ක්‍රියාවන් සම්බන්ධ සංඛ්‍යාත්මක විස්තර අනුව,



විනය කටයුතු අංශයේ 2022 වර්ෂය තුළ ක්‍රියාත්මත වූ සුළු විෂමාචාර ක්‍රියාවන් සම්බන්ධ සංඛ්‍යාත්මක විස්තර



ආරක්ෂක අංශය

ආරක්ෂක අංශයේ නිලධාරීන් සීමිත සංඛ්‍යාවක් සිටින බැවින් ආයතනය සතු චංචල/ නිශ්චල දේපල හා සම්පත් ආරක්ෂා කිරීම, ආයතනයේ කීර්තිනාමය හා සේවක විනය ආරක්ෂා කිරීමත් එහි කටයුතු කළමනාකරණය කරගනිමින් ආරක්ෂක කටයුතු නිසියාකාරව කිරීම ආරක්ෂක අංශයෙහි කාර්යය භාරයකී. ඒ අනුව ආරක්ෂක අංශය ඉලක්ක සපුරා ගැනීමට අදාල විස්තර පහත දැක්වේ.

සම්පාදනය කල ඉලක්ක:

- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආරක්ෂක අංශය, අධිකාරිය සතු චංචල/ නිශ්චල දේපල හා මානව සම්පත් ආරක්ෂා කිරීම, ආයතනික කීර්තිනාමය හා සේවක විනය ආරක්ෂා කිරීම සඳහා පුර්ණ ශක්තිය හා ක්‍රමවේදයන් යොදා කටයුතු කරනු ලැබීය.
- 2020 මාර්තු මස සිට රටපුරා පැවති කොවිඩ් 19 උවදුර හේතුවෙන් ආරක්ෂක පුරප්පාඩු පැවතියද අඛණ්ඩව ආරක්ෂක කටයුතු පවත්වාගෙන යන ලදී.
- 2022 ජනවාරි මස වනවිට ආරක්ෂක කාර්යය මණ්ඩලය 24 දක්වා අඩු වූ අතර තත්ත්වය එසේ තිබියදිත්, ආරක්ෂක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදුවිය.
- ප්‍රධාන කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන සේවා ස්ථාන කිපයක් සඳහා ආරක්ෂක නිලධාරීන් විවිධ ක්‍රම උපායන් යොදා ආරක්ෂාව තහවුරු කර ගැනීමට සිදුවිය.

ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග හා ප්‍රතිඵල

- ප්‍රධාන කාර්යාලය හා නිවාස මහ ලේකම් කාර්යාල ගෙඩනැගිල්ලේ පිහිටි කාර්යාල සඳහා පැමිණෙන වාහන/ පුද්ගලයින්, ගමන්මලු ආදීය පරීක්ෂාවට ලක් කිරීම හා අදාල අංශ වෙත යොමු කිරීම.
- ආරක්ෂක නිලධාරීන් වෙත උපදෙස් පංති පැවැත්වීම, දිස්ත්‍රික් කාර්යාල හා සියළුම සේවා ස්ථාන සඳහා අවශ්‍ය රාජකාරී උපදෙස් ලිඛිතව නිකුත් කිරීම, එකී උපදෙස් සම්බන්ධව අංශ ප්‍රධානීන් හා දිස්ත්‍රික් කළමනාකරුවන් දැනුවත් කිරීම, ආරක්ෂක නිලධාරීන් සතු වගකීම් හා කාර්ය භාරය සම්බන්ධව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම හා දැනට අනුමත පුද්ගලික ආරක්ෂක සේවා යොදාගෙන ඇති දිස්ත්‍රික් කාර්යාලවල ආරක්ෂක කටයුතු පවත්වාගෙන හා අධික්ෂණය සම්බන්ධයෙන් එම කාර්යාල වල පාලන අංශය දැනුවත් කිරීම.
- සේවක/ සේවිකාවන්ගේ රාජකාරී පැමිණීම හා පිටවීම සම්බන්ධව සටහන් පවත්වාගෙන යාම හා වේලා සටහන් යන්ත්‍ර ආරක්ෂාව සඳහා පියවර ගැනීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කීර්තිනාමයට හානිකර කටයුතු වැලැක්වීම හා වංචනික ක්‍රියා හා අලාභ කිරීමේ චේතනායෙන් කෙරෙන ක්‍රියාවන් සොයා බලා වාර්තා කිරීම හා විනය පවත්වාගෙන යාමට සහායවීම.
- කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානය මුලිකව පවත්වාගෙන යනු ලබන අධි ආරකෂිත කලාපයෙහි පිහිටි ආයතන, ආරක්ෂක කමිටු රැස්වීම නියෝජනය කිරීම හා එහිදී ගනු ලබන තීරණ හා උපදෙස් පරිදි කටයුතු කිරීම, ඒ සම්බන්ධව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම.
- නිවාස මහලේකම් ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා ගිණි අවි සන්නද්ධ ආරක්ෂක පිරිස් යෙදවීම.
- ආරක්ෂක කටයුතු පහසු කිරීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම යොදා ගැනීම සුදුසු බැවින් CCTV කැමරා පද්ධතියක් කාර්යාල පරිශ්‍රයේ සවිකිරීම සිදුකර කර ඇති අතර, ආරක්ෂක කටයුතු වලදී එය ඉතා වැදගත් වේ.
- අධිකරණ නියෝග ලබාගත් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමේ මෙහෙයුම සඳහා ආරක්ෂක නිලධාරීන් සහභාගි කරවීම හා හිස් භුක්තිය භාරගත් නිවාස වලට නැවත ඇතුල්වීම වැලැක්වීම සඳහා අවශ්‍ය ආරක්ෂක කටයුතු සංවිධානය හා ක්‍රියාවට නැංවීම මුලික විමර්ශන වාර්තා සැකසීම.

ඉහළ කළමනාකාරිත්වය විසින් ආරක්ෂක අංශයේ පවතින පිරිස් බල ඌණතාවයට පහත සඳහන් ක්‍රියා මාර්ග ගන්නා ලදි.

- දිවයින පුරා සේවයේ යොදවා සිටින ආරක්ෂක පිරිස් තෝරාගත් දිස්ත්‍රික් කාර්යාල කිහිපයකට යොමු කරමින් පුරප්පාඩු පවතින දිස්ත්‍රික් කාර්යාලයන්හි ආරක්ෂක රාජකාරි අනුමත පුද්ගලික ආරක්ෂක සේවාවකට පැවරීම.
- මෙම කාර්යාල වෙනුවෙන් ආරක්ෂක අධීක්ෂණය කිරීම සඳහා පරිපාලන ආරක්ෂක නිලධාරියෙකු යෙදවීමට සැළසුම් සකස් කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ආරක්ෂක පිරිස් බඳවා ගැනීමක් සම්බන්ධයෙන් වාර්තා සකස් කර ඉහළ කළමනාකාරීත්වය මඟින් අදාල අංශ දැනුවත් කිරීමට පියවර ගැනීම.

ජා. නි. සං. අධිකාරියේ පුස්තකාලය

නිවාස විෂය පථයට අදාල ආයතනික කටයුතු මෙසේ දැය වෙනුවෙන් ඉටුවෙද්දී, 1987 වසරේ අප අධිකාරිය තුල ද එහි නිළධාරීන් හා සේවකයන්ගේ ප්‍රයෝජනයට මෙන්ම විශ්ව විද්‍යාල සිසුන් හා ආචාර්යවරුන්, රජයේ හා පුද්ගලික ආයතන වල සේවකයන්ගේ ද ප්‍රයෝජනය උදෙසා නිවාස විෂයට අදාල විශේෂ පුස්තකාලයක් පිහිටුවන ලදි.

පුස්තකාල සේවාවක මූලික අරමුණ වන්නේ පාඨකයාගේ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඔවුන් යොමු කිරීම වන අතර, වෙනත් අයුරකින් කිවහොත් තොරතුරු අවශ්‍යතාවයෙන් සිටින පාඨකයාට අදාල තොරතුරු ලබා දීම පුස්තකාලයක මූලික අරමුණයි.

පුස්තකාලයක වටිනාකම අපගේ පැරැන්නන් විසින් ද දැන සිටි අතර, මෙම පුස්තකාල ඉතිහාසය සමඟ ලේඛන මාධ්‍ය ඉතිහාසයත් එක හා සමානව ගමන් කරනු ලැබීය. ඒ අනුව සමාජයේ සෙසු ආයතන මෙන්ම පුස්තකාලය" ද ඈත අතීතයේ සිටම කාර්ය භාර්යක් ඉටු කළ සමාජ සංස්ථාවක් වශයෙන් පෙන්වා දිය හැකිය.

එමෙන්ම මිනිසාගේ බුද්ධිමය ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවන තොරතුරු ඔස්සේ අනාගත පරපුරට අවැසි දෑ ප්‍රයෝජනවත් අයුරින් ලබා ගැනීම, සකස් කර තිබීම, ගබඩා කිරීම, නිවැරදි තොරතුරු බෙදා හැරීම හා සන්නිවේදන කටයුතු ආදි සියලු දේ සඳහා පරිපූර්ණ ඒකකයක් වශයෙන් ද පුස්තකාලයක් හැඳින්විය හැක.

ඒ අනුව සමාජයේ සෙසු ආයතන තුල මෙන්ම අප අධිකාරිය සතු පුස්තකාලය තුලින් ද වර්තමානය වන විට ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය තුලින් ද පාඨකයාට අවැසි තොරතුරු ද කඩිනමින් සොයා ගැනීමේ හැකියාව ඇති අතර, මෙම පුස්තකාලය තුල නිවාසකරණයට සම්බන්ධව විෂයන්ට අදාලව අන්තර්ගත කොට ඇති ප්‍රකාශන අතරෙහි නිවාස, ගොඩනැගිලි හා සම්බන්ධිත ඉදිකිරීම්, ඉංජිනේරු, ගෘහ නිර්මාණ, ප්‍රමාණ සමීක්ෂණ, ඉඩම් මෙන්ම ඒ යටතේ ඇති අනු විෂයන් සඳහා ද එකතුවක් ගොනු කොට ඇත.

එමෙන්ම තොරතුරු එක් රැස් කර ගැනීමේදී සම්ප්‍රදායික පොත-පතට පමණක් සීමා නොවී අවැසි විෂයන්ට සම්බන්ධ සඟරා, පුවත් පත් කැපුම් ද, අධිකාරියේ නිවාස යෝජනා පිළිබඳ ඵල වූ තොරතුරු මෙන් ම ඒවාට අමතරව නීති වාර්තා, රජයේ අණ-පනත් ආදි එකතුවකුත් ද මෙහි ගබඩා වී ඇත. තවද

වැඩිදුර අධ්‍යාපනයක් ලබනා නිවාස අධිකාරියේ කාර්ය මණ්ඩලයට ද මෙම පුස්තකාලය තුලින් ඉමහත් සේවාවක් සිදුවන බව නම් නොරහසකි.

පුස්තකාලයෙහි ඇති තොරතුරු හා පොත පත නිවාස සංවර්ධන අධිකාරියේ සේවයේ නිරත ස්ථිර නිළධාරීන් හා සේවකයන් හට බැහැර ගෙනයාමට අවස්ථාව ලබාදෙන අතර, සෙසු පාඨකයින් හට ද සතියේ දින 05 තුල පුවත්පත් බැලීමට මෙන් ම සිය අවැසි පත-පොතට අයත් විමර්ශන කටයුතු සඳහා පුස්තකාලය විවෘතව පවතී.

මේ වන විටත් වටිනා ග්‍රන්ථ 7000 ක පමණ එකතුවකින් සමන්විත අප ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් පුස්තකාලය, 2020-02-06 දින සිට ප්‍රධාන කාර්යාලයේ 09 වන මහලෙහි ස්ථාපිත කර ඇත.

මුදල් කොට්ඨාශය

මුදල් පරිපාලන පහසුව පිණිස අංශ 9 ක් යටතේ මුදල් අංශය සමන්විත වී ඇත.

1. අයවැය හා අයවැය පාලන අංශය
2. අවසන් ගිණුම් අංශය
3. ආයතනික ගෙවීම් අංශය
4. අභ්‍යන්තර පාලන අංශය
5. සංවර්ධන ගෙවීම් අංශය
6. සම්පත් කළමනාකරණ අංශය
7. ගබඩා හා ගබඩා ගිණුම් අංශය
8. තොරතුරු තාක්ෂණ අංශය
9. විශේෂ ව්‍යාපෘති අංශය

මුදල් කොට්ඨාශයේ කාර්යභාරය

භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අභ්‍යන්තර උත්පාදන සංවර්ධන කටයුතු සඳහා දිස්ත්‍රික් කාර්යාල වෙත මුදල් නිදහස් කිරීම සහ සියලුම පුනරාවර්තන වියදම් අයවැය ඇස්තමේන්තුව අනුව විධිමත් පාලනයක් සහිතව පවත්වා ගෙනයාම සහ අයකිරීම් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග තුලින් අයකිරීම් වර්ධනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.

නීති කොට්ඨාශය

නීති අංශය මගින් සිදුකරනු ලබන කාර්යයන්,

- ඉඩම් හා නිවාස සඳහා සින්නක්කර ඔප්පු ලබාදීම.
- මහල් නිවාසවල ඔප්පු ලබාදීම සඳහා අවශ්‍ය වන සභාධිපත්‍ය ප්‍රකාශන සකස් කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාළ දේපළ සම්බන්ධයෙන් පොදුවේ සමාජයට අගතියක් වන පැමිණිලිවලට අදාළව කටයුතු කිරීම.
- අවශ්‍ය අවස්ථාවන්හී දී යම් යම් පුද්ගලයන්ට හා ආයතනවලට එරෙහිව නීති කටයුතු කරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම් හා නිවාස අනවසරයෙන් භුක්තිවිඳින අයට එරෙහිව නඩු පවරා නිරවුල් සන්තකය ලබාගැනීම.
- බාහිර පාර්ශවයන් විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට එරෙහිව ගොනුකර ඇති නඩු කටයුතු මෙහෙයවීම.
- නඩු කටයුතු මෙහෙයවීමේ දී නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥවරු සහ බාහිර නීතීඥ සහාය ලබාගන්නා නීතිඥවරු වෙත අවශ්‍ය සහාය ලබාදීම.
- අදාළ අවස්ථාවන්හී දී බාහිර පාර්ශවයන් හා මෙම අධිකාරිය අතර කොන්ත්‍රාත් ගිවිසුම් සකස් කිරීම හා අනෙකුත් ගිවිසුම් සකස් කිරීම සහ ඊට අදාළ සියලුම නඩු කටයුතු මෙහෙයවීම.
- සියලුම දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ආවරණය වන පරිදි අවශ්‍ය නීති උපදෙස් ලබාදීම.
- ණය හා කුළී වාරික නොගෙවන හිඟ ණය වාරික හිමියන්ට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගනිමින් අධිකාරියට අයවිය යුතු මුදල් ලබාගැනීමට කටයුතු කිරීම.
- නීති නිවේදන හා නෙරපීමේ නියෝග නිකුත් කරමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අයකරීම් සඳහා දායකත්වය ලබාදීම.
- මානව හිමිකම් පැමිණිලි සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ධූරයට අදාළ රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය නියෝජනය ලබාදීම සහ සියලුම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සඳහා අවශ්‍ය නීති නිර්දේශ ලබාදීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙනත් කමිටු සඳහා අවශ්‍ය නීති නිලධාරී නියෝජනය ලබාදීම.
- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නම්කළ නිලධාරී තනතුරට අදාළ සියලු රාජකාරී කටයුතු සිදු කිරීම.

ඔප්පු නිකුත් කිරීමේ ප්‍රගතිය

දිස්ත්‍රික්කය	ඔප්පු සංඛ්‍යාව
කොළඹ	225
කොළඹ නගර (දකුණ)	115
කොළඹ නගර (උතුර)	63
සොයිසාපුර	23
කලුතර	22
ගම්පහ	160
කෑගල්ල	07
මහනුවර	57
මාතලේ	06
නුවරඑළිය	02
බදුල්ල	02
රත්නපුර	22
ගාල්ල	35
මාතර	47
හම්බන්තොට	18
මොණරාගල	01

දිස්ත්‍රික්කය	ඔප්පු සංඛ්‍යාව
කුරුණෑගල	30
පුත්තලම	12
අනුරාධපුරය	14
පොළොන්නරුව	-
ත්‍රිකුණාමලය	-
වවුනියාව	-
අම්පාර	39
මඩකලපුව	-
මන්නාරම	01
කිලිනොච්චිය	-
මුලතිව්	-
යාපනය	01
මවුන්ට් ක්ලිෆර්ඩ්	405
ග්‍රීන්වැලි	180
එඩිමන්ටන්	122
එකතුව	1609

සැලසුම් හා ප්‍රගති කොට්ඨාශය

සැලසුම් හා ප්‍රගති අංශය

තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගනිමින් පවත්නා රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව ඉදිරි පස් අවුරුදු කාල සීමාව තුල ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අරමුණු හා අරමුණු ඉටුකර ගැනීම සඳහා අනුගමනය කිරීමට බලාපොරොත්තු වන උපාය මාර්ග සැලසුම් හා ඉලක්ක ඇතුලත් සංයුක්ත සැලැස්ම සැකසීම, මධ්‍යකාලීන සැලැස්ම අනුව වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් වලට අදාල භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමත්, වර්ෂය ආරම්භ වීමට පෙර සිදුකරනු ලබයි.

ප්‍රගති සමාලෝචනය හා මෙහෙයවීම

සකස් කළ ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් හා ඉලක්ක දිස්ත්‍රික් කාර්යාල මඟින් ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය සෑම මාසයක් අවසානයේම ලබාගෙන ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය හා ඉලක්ක සපුරා නොගත් අවස්ථා පිළිබඳ ඉහළ කළමනාකාරීත්වය වෙත හා අමාත්‍යාංශය, භාණ්ඩාගාරය ඇතුළු භාහිර පාර්ශව වෙත වාර්තා කිරීම මෙම කොට්ඨාශය මඟින් සිදු කරනු ලබයි. එසේම වර්ෂය තුල ආයතනයේ ක්‍රියාකාරීත්වය, ඉටුකළ කාර්යභාරය ඇතුළත් වර්ෂික වාර්තාව සැකසීම, මහ බැංකු වාර්තාව සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ තොරතුරු ලබාදීම. අයවැය විවාද අවස්ථාව සඳහා අවශ්‍ය තොරතුරු පාර්ලිමේන්තුව වෙත ලබාදීම සිදුකරනු ලබයි.

පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න හා පිළිතුරු

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අසනු ලබන වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු සාරාංශ ලබාදීම, පාර්ලිමේන්තු උපදේශක සභාවේදී හා ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම්වලදී පැන නැගෙන ප්‍රශ්න වලට පිළිතුරු ලබාදීමත් මෙම කොට්ඨාසය මඟින් කරනු ලබන රාජකාරී අතර වේ.

සෙවණ ලොතරැයි අලෙවි ප්‍රවර්ධනය

සෙවණ ලොතරැයි අලෙවි ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය පියවර ගැනීම සිදුකරන අතර, සෙවණ අරමුදලට ලැබෙන මුදල් යෙදවීම සම්බන්ධ අනුමැතියන් ලබාගැනීමට සෙවණ පාලක මණ්ඩලය කැඳවීම හා ඒ සඳහා පාලක මණ්ඩල පත්‍රිකා අදාළ කොට්ඨාස වෙතින් ලබාගෙන පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම මෙම කොට්ඨාසය මඟින් සිදුකෙරේ. 2022 වර්ෂය තුල රටෙහි පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ සෙවණ පාලක මණ්ඩල රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා ඇති අතර, දුගී දුප්පත් පවුල් 94 සඳහා සෙවණ අරමුදල් යටතේ නිවාස අවශ්‍යතාවය සපුරා තිබේ. ලොතරැයි අලෙවියෙන් රු.මි. 27.50 ක මුදලක් සෙවණ අරමුදල වෙත බැරකර ඇත.

ව්‍යාපෘති යෝජනා

ඉදිරි වර්ෂ සඳහා අයවැය ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම සඳහා වැඩසටහන් ඇස්තමේන්තු හා ව්‍යාපෘති යෝජනා සකස් කර සැලසුම් දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම මෙම කොට්ඨාසය මඟින් සිදුකරනු ලබන රාජකාරි අතර වේ.

1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය

මීට අමතරව 1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍ර සඳහා ආයතනයට අදාළ තොරතුරු ලබාදෙමින් එම තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය මෙම කොට්ඨාසය මඟින් ඉටුකරන රාජකාරි අතර වේ.

ජනතාවගේ තොරතුරු ලබාගැනීමේ අයිතිය තහවුරු කිරීම

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් කටයුතු හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ ශ්‍රී ලාංකීය ප්‍රජාව විසින් විමසනු ලබන තොරතුරු ලබාදීමේ තොරතුරු නිලධාරී ලෙස සැලසුම් හා ප්‍රගති කොට්ඨාසයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කටයුතු කරන ලබයි. ඒ අනුව 2022 වර්ෂය තුළ මහජන ඉල්ලීම් හා ඒ සඳහා කටයුතු කළ ආකාරය පහත පරිදි වේ.

2022 වර්ෂය

මුළු ඉල්ලීම් ගණන	-	55
පිළිතුරු ලබාදුන් ගණන	-	37
අභියාචනා සඳහා ඉදිරිපත් කළ ගණන	-	01

සංචාරක බංගලා වෙන් කිරීම හා පරිපාලන කටයුතු

සේවක සුභ සාධනය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු සංචාරක බංගලා 14 ක් පවතින අතර, මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ සංචාරක බංගලා 9 ක් පවතී. සංචාරක බංගලාව අයත් දිස්ත්‍රික් කාර්යාල මඟින් ඒවායේ සෘජු අධීක්ෂණය හා පරිපාලන කටයුතු සිදුකරන අතර, සංචාරක බංගලා වෙන්කිරීම හා ඒවාට අවශ්‍ය පහසුකම් සැපයීම සම්බන්ධ කටයුතු සැලසුම් හා ප්‍රගති කොට්ඨාසය මඟින් සිදුකරනු ලබයි.

ඊට අමතරව කොළඹ නගර කාර්යාලය මඟින් පරිපාලනය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිකරන ලද නිවාස ක්‍රමවල පීවත්වන ප්‍රජාවගේ විශේෂ උත්සව අවස්ථා සඳහා සහනදායී මිලට ලබාදීම සඳහා ප්‍රීදීපා ශාලා 04ක් පවත්වාගෙන යනු ලබයි.

සැමට නිවහන සංවර්ධන වැඩසටහන -2022/12/31 දිනට කාර්යසාධනය

වැඩසටහන	වාර්ෂික ඉලක්කය			ප්‍රගතිය		
	ඒකක සංඛ්‍යාව	නිම කිරීම්	ඇස්තමේන්තු මුදල (රු. මිලි)	ඒකක සංඛ්‍යාව	නිම කිරීම්	වියදම (රු. මිලි)
අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස වැඩසටහන						
1. ආධාර - නව වැඩසටහන	1485	-	169.450	1465	28	214.850
- අවිච්ඡේද වැඩසටහන	-	2228	887.257	-	1821	622.477
2. මිහිඳු නිවහන - නව	77	21	39.35	73	6	16.525
- අවිච්ඡේද වැඩසටහන	-	265	92.225	-	218	84.995
3. ණය වැඩසටහන - නව				5	3	1.750
- අවිච්ඡේද වැඩසටහන	-	2242	296.22	-	2090	272.893
4. අභ්‍යන්තර ප්‍රතිපාදන ණය වැඩසටහන - නව	1000	450	280.0	473	400	147.185
- අවිච්ඡේද වැඩසටහන	-	1143	179.0	-	1161	192.122
5. සෙවණ ආධාර	100	28	35.0	92	10	27.92
6. විශේෂ අවශ්‍යතා සහිත වූවක් සඳහා වූ නිවාස වැඩසටහන	-	381	83.67	-	118	37.81
7. විරු සුමිතුරු	-	417	31.828	-	446	39.783
8. ඉන්දියානු ආධාර නිවාස	-	1468	690.0	-	151	174.548
උප එකතුව	**2662**	**8643**	**2487.78**	**2108**	**6452**	**1832.85**
9. සින්නක්කර ඔප්පු	1000	1000	-	1609	1609	-
10. නිවාස ආශ්‍රිත සහාය සේවා						
1. නගමු පුරවර	-	-	25.0	-	-	25.0
2. ඉඩම් වන්දි	-	-	10.0	-	-	10.0
මධ්‍යම පාන්තික නිවාස වැඩසටහන						
1. පෙර විකුණුම්						
▪ තංගල්ල, හම්බන්තොට	30				97%	30.935
▪ සොයිසාපුර, මොරටුව	30				52%	26.663
▪ රංපොකුණගම, ගම්පහ	72				22%	40.165

ප්‍රවාහන අංශය

- අභ්‍යන්තර කාර්ය මණ්ඩලය - 09
- රියදුරු - 36
- රිය සහයක - 01
  46

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ රියදුරු තනතුරේ සේවයේ නියුතු සේවක තොරතුරු

විස්තර	ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික් කාර්යාලය	එකතුව
ස්ථිර	18	33	51
කොන්ත්‍රාත්	20	14	34
එකතුව	**38**	**47**	**85**

2022 - 12 -31 දිනට ප්‍රවාහන සංචිතය

විස්තරය	කාර්	ජීප්	ඩබල් කැබ්	වෑන්	ලොරි	කෲ කැබ්	එකතුව
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වාහන	05	05	48	03	07	02	70
මුදල් අමාත්‍යාංශයට අයත් වාහන		01					01
මාසික කුලී පදනමට ලබාගත් වාහන	01	03	15	01			20
එකතුව	06	09	63	04	07	02	91

- සංචිත වාහන ප්‍රමාණවත් නොවන බැවින් රාජකාරී කටයුතු සඳහා කුලී පදනමින් වාහන ලබාගැනීමට සිදුවී ඇත. ඒ අනුව කුලී පදනමට යටතේ ලබාගත් ජීප් රථ 03ක් හා කාර් රථ 01ක් ප්‍රධාන කාර්යාලයේ ඉහල කළමණාකාරීත්වයේ රාජකාරී සඳහා යොදවන ලද අතර කැබ් රථ 15ක් සංවර්ධන කටයුතු සඳහා යෙදවීමේ අරමුණින් දිස්ත්‍රික් කාර්යාල සඳහා අනුයුක්ත කර ඇත. මෙම වාහන සඳහා 2022 වර්ෂය තුල බදු කුලිය ලෙස රු. 4,532,915/-ක මුදලක් වැයවී ඇත.
- 2022 වර්ෂය සඳහා වාහන අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු. 3,402,388.00ක් වැය කර වාහන 30ක් අලුත් වැඩියාකර ධාවනයට එක්කර ඇත.
- වාහන රක්ෂණ කිරීම සඳහා රක්ෂණ වාරික මුදල් ලෙස රු. 905,469.51ක් වැය කර ඇති අතර 2022 වර්ෂය තුලදී රක්ෂණ වන්දි මුදල ලෙස රු. 370,955.00 ක් ලබාගෙන ඇත.
- 2022 - 2023 වර්ෂය සඳහා ප්‍රවාහන සංචිතයේ ඇති යතුරු පැදි ද ඇතුලුව සියළුම වාහන බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් රු. 397,899.00ක් වැය කර ඇත.
- 2022 වර්ෂය සඳහා සංචිත වාහන වලට ඉන්ධන සැපයීම සඳහා අයවැය ප්‍රතිපාදන රු.මි. 60,857ක් වෙන්වී ඇති අතර 2020 වර්ෂයේදී රථ ධාවනයේ යොදවා ගැනීම වෙනුවෙන් ඉන්ධන සැපයීම සඳහා රු.මි. 60,857ක් වෙන්වී ඇති අතර 2020 වර්ෂයේදී රථ ධාවනයේ යොදවා ගැනීම වෙනුවෙන් ඉන්ධන සැපයීම සඳහා රු.13,886,613/- ක මුදලක් වැය වී ඇත.
- වාහන වාර සේවා කිරීමේදී දළ වශයෙන් ධාවන කි.මී. 4000කට පසුව වාර සේවාව සිදු කරනු ලබන අතර ප්‍රධාන කාර්යාලයේ රාජකාරී යොදවා ඇති වාහන පමණක් වාර සේවා කිරීම සඳහා 2022 වර්ෂයේදී රු. 1,758,297.25ක් වැයකර ඇත.
- ප්‍රවාහන අංශයේ වාහන අළුත්වැඩියා සහ අනෙකුත් නඩත්තු වියදම් සඳහා රු. 40,000.00ක් බැගින් අක් මුදල් අග්‍රිමයක්

පවත්වා ගෙන යනු ලැබේ. 2022 වර්ෂයේදී අක් මුදල් ලෙස රු. 1,024,387.00ක් වියදම් කර ඇත. ප්‍රවාහන අංශයේ ගරාජය සඳහා රු. 5000.00ක උපරිමයට යටත්ව අමතර කොටස් මිලදී ගැනීම හා සුළු අළුත්වැඩියා සිදු කිරීම, වාහන දුම් වාර්තා ලබා ගැනීම හා අධීවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් ලද බිල්පත් පියවීමත් අක් මුදලින් සිදුකර ඇත.

- සුළු අළුත්වැඩියාවන් ප්‍රවාහන අංශයේ ගරාජයේ සිදුකිරීම මගින් අළුත්වැඩියා වියදම අවම කර ගැනීමට කටයුතු කර ඇත.
- අළුත්වැඩියා හා නඩත්තු වියදම ඉහලයාම හා ඉන්ධන කාර්යක්ෂමතාව අඩුවීම නිසා ඉතා පාඩු සහගත පැරණි වාහන 16ක් අපහරණය කිරීමට කටයුතු කර ඇත. වාහන විකුණුම් ආදායම ලෙස රු. 9,320,737/- ලබාගෙන ඇත.
- ප්‍රවාහන සංචිතය සතු වාහන ඉතා පැරණි වාහන බැවින් ප්‍රවාහන සේවා කාර්යක්ෂම කර ගැනීම හා කුලී වාහන ලබා ගැනීම අවම කරගැනීම සඳහා අවම අවශ්‍යතාවය මත අළුතින් වාහන මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු කලද අදාල චක්‍රලේඛන අවලංගුවීම හා රජයේ ප්‍රතිපත්තිමය තීරණ නිසා 2022 වර්ෂයේදීද අළුතින් වාහන මිලදී ගැනීමට නොහැකිවිය.
- එබැවින් ප්‍රවාහන සංචිතය සතුව පවතින වාහන ඉතා පැරණිවූවද, අළුතින් වාහන එකතු නොවීම නිසා පැරණි වාහන අපහරණය කිරීම ප්‍රමාද වී ඇති අතර අපහරණය සඳහා වෙන්කර තිබූ කැබ් රථ 04ක්ද නැවත අළුත්වැඩියා කිරීමට කටයුතු කර ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වාහන සංචිතය වයස් ප්‍රමාණය අනුව වර්ගීකරණය

වාහන වර්ගය	05ට අඩු	5-10	10-15	15-20	20ට වැඩි	එකතුව
කාර්රථ	-	-	-	04	01	05
ජීප් රථ	-	-	-	-	-	05
වෑන් රථ	-	-	-	01	02	03
ඩබල් කැබ් රථ	-	-	17	-	26	48
ලොරි රථ	-	-	-	-	07	07
කෲ කැබ් රථ	01	-	01	-	-	02
	01	-	18	05	36	70

- සංචිත සතුව පවතින වැඩි වාහන ප්‍රමාණයක් අවුරුදු 15,20 ඉක්මවා ඇති බැවින් ප්‍රවාහන සේවා සැපයීමේදී බොහෝ ගැටළු වලට මුහුණ දීමට සිදුවී ඇති අතර ආයතනයේ සංවර්ධන කාර්යයන් වලදී ද බලපා ඇත.
- මෙම පැරණි වාහන රාජකාරී සඳහා යෙදවීමේදී ඉතා අකාර්යක්ෂම බැවින් දුර බැහැර රාජකාරී හා නිළධාරීන්ට ප්‍රවාහන සේවා සැපයීම සඳහා කුලී පදනමින් වාහන ලබා ගැනීමට සිදුවී ඇත. ඒ අනුව කුලී වාහන සඳහා වැඩි වියදමක් දැරීමට සිදුවී ඇත.

සැපයුම් අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සැපයුම් අංශය මගින්, ආයතනයේ නොයෙකුත් අංශ හා දිස්ත්‍රික් කාර්යාල වලට අවශ්‍ය කරන සියලුම ක්‍රියාවලීන් ඇතුළුව භාණ්ඩ හා සේවා ගලායාම කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි. ඒ සඳහා අපගේ වාර්ෂික ලියාපදිංචි සැපයුම් කරුවන් මෙන්ම විවෘත වෙළඳපොලේ ස්ථාපිත කර ඇති ආයතන/ සමාගම් අතර අන්තර් සම්බන්ධීකරණය සිදු කරනු ලැබේ.

මෙම අංශය තුල පහත සඳහන් අයුරින් සේවකයන් අනුයුක්තව සේවය කරනු ලබයි.

තනතුර	සේවා කාණ්ඩය	සේවක සංඛ්‍යාව
පරිපාලන නිලධාරි	JM 1-1-(1)	02
එක් අයෙක් කළමනාකරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට පත් කර ඇත.	MA 1-11-(1)	01
කළමනාකරණ සහකාර	MA 1-11-(11)	01
කළමනාකරණ සහකාර	MA 1-11-(111)	02
කළමනාකරණ සහකාර	PL 1-1	01
ලේඛනාගාර භාරකරු	PL 1-111	01
එකතුව		08

2022 වර්ෂය තුල ලැබී ඇති භාණ්ඩ හා සේවා සැපයීමේ ඉල්ලීම් 1206 කි.

ඉන් පහත දැක්වෙන කාණ්ඩ යටතේ භාන්ඩ හා සේවා සැපයීම සිදු කර ඇති අතර, වැය කරන ලද මුදල් පහත පරිදි වේ.

1. මිළ කැඳවීම් සිදු කරන ලද භාණ්ඩ හා සේවා පහත පරිදි වර්ග කර ඒ සඳහා වැය වූ මුදල

• පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා	-	රු.	462,613.30
• නඩත්තු ද්‍රව්‍ය හා උපාංග මිළදී ගැනීම සඳහා	-	රු.	2,356,513.67
• තේ සලාක හා නිළ ඇඳුම් මිළදී ගැනීම සඳහා	-	රු.	816,941.75
• ලිපි ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා	-	රු.	7,828,680.08
• විදුලි උපකරණ හා උපාංග සඳහා	-	රු.	2,507,007.06
• ටෝනර්/රිබන්/කාට්‍රිජ් මිළදී ගැනීම සදහා	-	රු.	2,978,405.00
• බැටරි/ටයර් හා අමතර කොටස් මිළදී ගැනීම සඳහා	-	රු.	2,489,494.95
• යන්ත්‍ර හා උපාංග මිළදී ගැනීම සඳහා	-	රු.	8,169,335.60
• කාර්යාලයීය භාණ්ඩ හා උපකරණ මිළදී ගැනීම සඳහා	-	රු.	3,993,688.20

2. සංග්‍රහ වියදම් වෙනුවෙන් සපයන ආහාර පාන මිළදී ගැනීම වෙනුවෙන් වැය වූ මුදල රු. 811,750.43 කි.
3. අත්තිකාරම් මගින් සිදු කරනු ලබන මිළදී ගැනීම් වෙනුවෙන් වැය වූ මුදල රු. 142,472 කි.
4. සුළු මුදලින් කරනු ලබන මිළදී ගැනීම් වෙනුවෙන් වැය වූ මුදල රු.283,624.33 කි.

ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග

වර්ෂයේ මුල් කාර්තුව තුල ශ්‍රී ලංකාවේ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් සේවකයන් ඛණ්ඩනය කරමින්, රාජකාරි සඳහා වාර්තා කරන ලද අතර, කාර්යාලයේ සැපයීම් කටයුතු නිසි ලෙස පවත්වා ගැනීම සඳහා එලෙස සේවකයන් කඩින් කඩ සේවයට කැඳවීම නොසලකා කණ්ඩායමක් ලෙස භාණ්ඩ හා සේවා සැපයීමේ කටයුතු සිදු කරන ලදී.

එසේම සැපයුම්කරුවන් හට ලෝක ආර්ථික අර්බුදය හමුවේ භාණ්ඩ සැපයීමේ ගැටළුවක් පැවතියද, සැපයුම්කරුවන් සමග නිරන්තර සහයෝගයෙන් කටයුතු කර එම භාණ්ඩ සැපයීමට කටයුතු කරන ලදී.

ඉලක්ක කරා ළඟාවීමේදී මුහුණ පෑමට සිදු වූ ගැටළු

මුල් කාර්තුවේදී කාර්ය මණ්ඩලය වරින් වර බන්ධනය කරමින් සේවයට කැඳවීම නිසා මිළදී ගැනීමේ නිර්දේශ ලබාදීමේ කමිටු නිළධාරීන් කැඳවීමේ අපහසුතා පැවතීම.

ශ්‍රී ලංකාවේ භාණ්ඩ ආනයනය කිරීමට වාරණ නිකුත් කර තිබීම හේතුවෙන්, වෙළඳපොල භාණ්ඩ හිඟකමක් පැවති අතර. යම් කාලසීමාවක් ගත වුවද, භාණ්ඩ සැපයීම සිදු කර ඇත.

සේවකයන්ට පරිගණක පළපුරුද්ද නොමැතිකම නිසා නියමිත වේලාවට ලිපි නිකුත් කිරීමේ ප්‍රමාදය පැවතීම.

අභ්‍යන්තර විගණක කොට්ඨාශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආරම්භයේ සිට අභ්‍යන්තර විගණන අංශය පවතින අතර පසුකාලීනව එයට විමර්ශන අංශය ද ඒකාබද්ධ කර ඇත. මෙම අංශය වාර්ෂික විගණන සැලැස්මක් මත කටයුතු කරනු ලබන අතර ඊට අමතරව පැවරෙන විශේෂ රාජකාරි සහ විමර්ශන කටයුතු සිදු කරනු ලබයි. එහි ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- කළමනාකරණය විසින් හඳුන්වා දී ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවල පවත්නා ප්‍රමාණාත්මක බව හා ඵලදායකත්වය සම්බන්ධයෙන් ස්වාධීන අඛණ්ඩ ඇගයීමක් පවත්වාගෙන යාම.
- අදාල තොරතුරු සම්පාදනය කරීමට දායක වෙමින් ඉහළ සහ පහළ කළමනාකාරීත්වය අතර සම්බන්ධීකාරකවරයෙකු වශයෙන් කටයුතු කිරීම.
- 2022 වසර තුල වාර්ෂික විගණන සැලැස්ම අනුව පහත සඳහන් කටයුතු මෙම අංශය මඟින් ඉටුකර ඇත.

විගණන විමසුම්

- රජයේ විගණන විමසුම් - 44
- අභ්‍යන්තර විගණන විමසුම් - 35
- රජයේ විගණන අංශය වෙත තොරතුරු ලබා දීම - 40
- විමසුම් නොවන කළමනාකාරීත්වයට ඉදිරිපත් කළ වාර්තා - 03

විමර්ශන කටයුතු පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම

- හදිසි අනතුරු සම්බන්ධයෙන් විමර්ශන කටයුතු - 05
- විෂමාචාර හා විමර්ශන කටයුතු - 08

දේපළ බැහැර කිරීමේ ක්‍රියාකාරීත්වය

- පරීක්ෂා කළ ඔප්පු සංඛ්‍යාව - 1776
- පරීක්ෂා කළ 8.1 වගන්ති සංඛ්‍යාව - 1613

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ රැස්වීම් - 02
- නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශයේ රැස්වීම් - 04

වෙනත් විගණන රාජකාරි

- 2022 පාරිතෝෂික දීමනා වලට අදාල ගෙවීම් පරීක්ෂා කිරීම - 50
- දිස්ත්‍රික් ආදායම් මෙහෙයුම් කමිටු හා ප්‍රසම්පාදන කටයුතු වල දී නිරීක්ෂයෙකු වශයෙන් සහභාගි වී කටයුතු කිරීම.
- වාර්ෂික තොග සමීක්ෂණය සියලු දිස්ත්‍රික්ක වලට අදාලව මුදල් සත්‍යාක්ෂණය සිදු කිරීම.
- 2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට පිලිතුරු වාර්තා සකස් කිරීම

තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය

සෙවණ මාධ්‍ය ඒකකය

- 2022 වසරේදී සෙවණ මාධ්‍ය සේවය විසින් ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, සී/ස ඕෂන්වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම සහ මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන කඩිනම් වැඩසටහන ඇතුළු ආයතනවල විවිධ පුවත්පත් දැන්වීම් පළකිරීම සිදු කරන ලදී.

- 2022 වසරේදී සෙවණ මාධ්‍ය සේවයෙහි වාර්ෂික ඇස්තමේන්තුගත ලාභය රු. මිලියන 4.0 කි. 2022 දෙසැම්බර් දක්වා ලැබූ ආදායම රු. මිලියන 5.805 ක් වන අතර ලාභය රු. මිලියන 0.795 කි.

- සෙවණ මාධ්‍ය සේවයේ සියලු ඉපැයීම් "සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය" නමින් වූ වෙනම ගිණුමකට බැරකරනු ලබන අතර, මෙම අරමුදල් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා යොදාගනු ලැබේ.

2022 ආදායම් සහ ලාභ

මාසය	ආදායම රු.	ලාභය රු.
ජනවාරි	323,224.80	45,352.50
පෙබරවාරි	920,994.00	129,251.25
මාර්තු	815,064.90	114,416.25
අප්‍රේල්	651,132.90	91,451.25
මැයි	225,161.10	31,623.75
ජූනි	85,625.40	11,655.00
ජූලි	196,278.03	26,721.00


මාසය	ආදායම රු.	ලාභය රු.
අගෝස්තු	274,320.86	37,339.50
සැප්තැම්බර්	194,099.13	25,822.50
ඔක්තෝබර්	1,051,416.30	139,878.00
නොවැම්බර්	295,630.50	39,330.00
දෙසැම්බර්	772,185.50	102,405.00
එකතුව	5,805,133.42	795,246.00

2022 වර්ෂය සඳහා ආදායම් ඉලක්කය - රු. මි. 4.0















මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

05

නිවාස සංවර්ධනය

	නව / වැඩිදියුණු කිරීම්	නිවාස වැඩසටහන		නිවාස සංඛ්‍යාව	ප්‍රතිපාදන වෙන් කිරීම් රු.මිලියන	සම්පූර්ණ කරන ලද නිවාස සංඛ්‍යාව	වියදම රු.මිලියන	සම්පූර්ණ කර නොමැති නිවාස සංඛ්‍යාව	අවශ්‍ය මුදල් ප්‍රමාණය රු.මිලියන
1	නව	ඔබට ගෙයක් රටට හෙටක් ණය වැඩසටහන		484	159.920	391	149.050	93	10.870
2	නව	ඔබට ගෙයක් රටට හෙටක් ආධාර වැඩසටහන		1485	946.720	17	171.401	1468	775.319
3	නව	මිහිඳු නිවහන ආධාර වැඩසටහන		77	39.500	8	14.865	69	24.635
4	නව	සෙවණ ආධාර වැඩසටහන		94	58.900	1	31.335	93	27.565
		උප එකතුව		**2140**	**1,205.040**	**417**	**366.651**	**1723**	**838.389**
1	අවිච්ඡේද	ඔබට ගෙයක් රටට හෙටක් ණය වැඩසටහන			448.110	3377	439.435	64	8.675
2	අවිච්ඡේද	ඔබට ගෙයක් රටට හෙටක් ආධාර වැඩසටහන			2,589.782	1800	388.021	6353	2,201.761
3	අවිච්ඡේද	මිහිඳු නිවහන ආධාර වැඩසටහන			173.215	209	94.480	348	78.735
4	අවිච්ඡේද	විරුසුමිතුරු ආධාර වැඩසටහන			387.420	891	250.002	55	137.418
5	අවිච්ඡේද	ග්‍රාම ශක්ති විසිරි (පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට ලක්වූ විඳිතයන් වෙනුවෙන්)			8.706	25	8.076	3	-
6	අවිච්ඡේද	බෝගස්වැව නිවාස වැඩසටහන			3.421	600	3.421	-	-
7	අවිච්ඡේද	ඉන්දියානු ආධාර	ඉන්දියානු ආධාර	1623	423.755	173	145.220	1364	278.535
			භාණ්ඩාගාර ප්‍රතිපාදන	-	-	-	40.420	-	118.150
		උප එකතුව		**15348**	**4,034.409**	**7075**	**1,369.075**	**8187**	**2,823.274**
		මුළු එකතුව		**17488**	**5,239.449**	**7492**	**1,735.726**	**9910**	**3,661.663**

අයකිරීම් ක්‍රියාකාරිත්වය

නිවාස ණය - උපහාර ණය හා විසිරි ණය-2022

	දිස්ත්‍රික්කය/ කාර්යාලය	උපහාර ණය			විසිරි ණය			සමස්තය		
		ඉලක්කය	ලඟාවීම	%	ඉලක්කය	ලඟාවීම	%	ඉලක්කය	ලඟාවීම	%
1	කොළඹ නගර(උ)	-	-		47.844	13.167	28	47.844	13.167	28
2	කොළඹ නගර(ද)	1.260	0.545	43	41.280	13.073	32	42.540	13.618	32
3	කොළඹ දිස්ත්‍රික්	406.860	136.910	34	533.032	179.406	34	939.892	316.316	34
4	ගම්පහ	176.448	67.384	38	320.728	149.386	47	497.176	216.770	44
5	කලුතර	267.396	78.794	29	312.180	92.372	30	579.576	171.166	30
6	මහනුවර	75.756	43.596	58	317.392	151.239	48	393.148	194.835	50
7	මාතලේ	35.220	21.123	60	186.324	114.762	62	221.544	135.885	61
8	නුවරඑළිය	34.080	16.844	49	234.328	79.371	34	268.408	96.215	36
9	ගාල්ල	70.008	33.986	49	228.216	98.0362	43	298.224	132.022	44
10	මාතර	73.560	44.073	60	225.448	112.239	50	299.008	156.312	52
11	හම්බන්තොට	44.964	24.420	54	720.016	224.15	31	764.980	248.570	32
12	කුරුණෑගල	48.204	31.315	65	636.668	273.286	43	684.872	304.601	44
13	පුත්තලම	24.816	12.473	50	260.000	76.99	30	284.816	89.463	31
14	අනුරාධපුරය	43.284	21.675	50	378.456	146.477	39	421.740	168.152	40
15	පොළොන්නරුව	18.816	11.488	61	243.168	93.313	38	261.984	104.801	40
16	බදුල්ල	81.816	15.992	20	255.840	80.421	31	337.656	96.413	29
17	මොණරාගල	55.008	23.050	42	183.972	83.28	45	238.980	106.330	44
18	රත්නපුර	21.084	17.374	82	180.652	93.386	52	201.736	110.760	55
19	කෑගල්ල	56.904	28.049	49	222.084	115.577	52	278.988	143.626	51
20	මඩකලපුව	24.744	13.780	56	122.964	80.07	65	147.708	93.850	64
21	අම්පාර	31.980	12.627	39	283.732	121.918	43	315.712	134.545	43
22	ත්‍රිකුණාමලය	27.216	13.209	49	136.956	93.738	68	164.172	106.947	65
23	යාපනය	13.236	9.578	72	73.956	70.813	96	87.192	80.391	92
24	මන්නාරම	6.204	3.980	64	47.448	33.269	70	53.652	37.249	69
25	වව්නියාව	30.084	15.045	50	64.824	36.811	57	94.908	51.856	55
26	මුලතිව්	17.664	10.085	57	65.376	43.341	66	83.040	53.426	64
27	කිලිනොච්චි	25.740	13.451	52	47.328	35.545	75	73.068	48.996	67
	මුළු එකතුව	**1712.352**	**720.846**	**42**	**6370.212**	**2705.436**	**42**	**8,082.564**	**3,426.282**	**42**

ග්‍රාමීය කුලී/ නාගරික කුලී/ දේපල ආදායම් - 2022

	දිස්ත්‍රික්කය / කාර්යාලය	ග්‍රාමීයකුලී			නාගරික කුලී			දේපල ආදායම්			එකතුව		
		ඉලක්කය	ලාභාවිම	%	ඉලක්කය	ලාභාවිම	%	ඉලක්කය	ලාභාවිම	%	ඉලක්කය	ලාභාවිම	%
1	කොළඹ නගර (උ)				42.365	42.351	100	12.000	26.700	223	54.365	69.051	127
2	කොළඹ නගර (ද)				36.370	84.454	232	18.000	18.754	104	54.370	103.208	190
3	කොළඹ දිස්ත්‍රික්	0.612	0.196	32	23.706	14.719	62	29.086	16.713	57	53.404	31.628	59
4	ගම්පහ	3.108	0.093	3	47.997	22.94	48	42.131	8.902	21	93.236	31.935	34
5	කලුතර	1.068	0.023	2				3.037	1.450	48	4.105	1.473	36
6	මහනුවර	3.072	0.073	2	15.466	14.247	92	9.411	14.586	155	27.949	28.906	103
7	මාතලේ	0.060	-	-				0.741	0.034	5	0.801	0.034	4
8	නුවරඑළිය	3.192	0.232	7				3.039	2.529	83	6.231	2.761	44
9	ගාල්ල	1.452	0.185	13				2.821	2.799	99	4.273	2.984	70
10	මාතර	0.528	0.092	17	7.783	1.288	17	8.397	6.865	82	16.708	8.245	49
11	හම්බන්තොට	0.936	0.081	9				10.765	0.491	4.56	11.701	0.572	5
12	කුරුණෑගල	0.792	0.027	3				0.273	0.187	68	1.065	0.214	20
13	පුත්තලම	1.188	0.598	50				12.735	2.758	22	13.923	3.356	24
14	අනුරාධපුරය	-	-	-				0.408	-	-	0.408	-	-
15	පොළොන්නරුව	0.336	0.691	206				0.041	0.060	146	0.377	0.751	199
16	බදුල්ල	0.444	0.972	219				1.702	0.360	21	2.146	1.332	62
17	මොණරාගල	1.128	2.034	180				0.132	0.572	433	1.260	2.606	207
18	රත්නපුර	0.288	0.007	2				0.204	0.109	53	0.492	0.116	24
19	කෑගල්ල	0.084	0.081	96				3.294	0.410	12	3.378	0.491	15
20	මඩකලපුව	0.084	0.068	81				-	-	-	0.084	0.068	81
21	අම්පාර	10.692	0.553	5	2.116	1.593	75	-	2.902	-	12.808	5.048	39
22	ත්‍රිකුණාමලය	1.020	0.472	46				-	0.079	-	1.020	0.551	54
23	යාපනය	0.096	0.105	109	3.528	1.290	37	0.204	0.230	113	3.828	1.625	42
24	මන්නාරම	0.324	0.203	63				-	-		0.324	0.203	63
25	වව්නියාව	2.760	1.819	66				-	-		2.760	1.819	66
26	මුලතිව්	-	-	-				-	-		-	-	-
27	කිලිනොච්චි	0.096	-	-				-	-		0.096	-	-
	මුළු එකතුව	**33.360**	**8.605**	**26**	**179.331**	**182.882**	**102**	**158.421**	**107.490**	**68**	**371.112**	**298.977**	**81**

මූල්‍යමය ප්‍රකාශන

06

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ පරිපාලිත සමාගම
2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තක්ස්වය පිළිබඳ වාර්තාව

	2022 ජා.නි.ස.අ.	සටහන්	2022 ඒකාබද්ධ	2021 ජා.නි.ස.අ.	2021 ඒකාබද්ධ නැවත ප්‍රකාශිත	2022 අයවැයගත ජා.නි.ස.අ.
	රු. ශත		රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත
වත්කම්						
ජංගම නොවන වත්කම්						
ස්ථාවර වත්කම්						
ඉඩම් හා ගොඩනැගිලි	455,329,472.81	(02)	455,329,472.81	488,707,324.85	488,707,324.85	-
ආයෝජන දේපළ	-		3,214,000,001.00	-	2,822,400,001.00	-
දේපළ පිරියත හා උපකරණ	28,821,527.02	(03- 1)	47,733,067.02	32,008,602.78	54,003,985.78	601,108,000.00
හිමිකරු පදිංචි දේපළ	-		40,000,000.00		28,600,000.00	-
අස්පාෂ්‍ය වත්කම්	-	(03-11)	-	-	-	100,000.00
විලම්බිත ආදායම් බදු වත්කම්	-		692,864.00	-	758,871.00	-
	484,150,999.83		3,757,755,404.83	520,715,927.63	3,394,470,182.63	601,208,000.00
සංවර්ධන වත්කම්	1,082,281,395.84	(04)	1,082,281,395.84	1,077,980,107.34	1,077,980,107.34	1,366,681,834.46
ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") සහ එහි පරිපාලිතයෙහි ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම,** 29 (අ) ඡේදය සහ පරිශ්ලයේ විස්තර කර ඇති පරිදි මූල්‍ය වාර්තාකරණයෙහි ගුණාත්මක ලක්ෂණ අනුව විශ්වාසනීය තොරතුරු ප්‍රමාණාත්මක වැරදි වලින් හා පක්ෂග්‍රාහී බවින් තොරව ඉදිරිපත් කල යුතු වේ. එසේ වුවද, අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලවල නිවාස ණය එකතු කිරීමේ දී සිදු කර තිබූ වංචාවලට අදාලව අයකර ගත යුතු රු. මිලියන 1.33 ක් මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ යටතේ ගිණුම්ගත කර තිබුනමුත් ඒ පිළිබඳ විස්තර හෙලිදරව් කර නොතිබුණි. තව ද , විගණනයට හෙලිදරව් වූ තොරතුරු අනුව කළුතර දිස්ත්‍රික්කයේ රු. මිලියන 7.21 ක වංචාවක් සහ තවත් දිස්ත්‍රික්ක 3 ක ණය අයකිරීමේදී සිදු වී තිබූ වංචා පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2022 දෙසැම්බර් 31 දිනට නිවාස ණය ගැනි ශේෂය රු. මිලියන 10,496.5 ක් වූ අතර ණය ලාභීන් සංඛ්‍යාව 350,000 ක් පමණ විය. මෙම ණය වර්ෂ 5 ,10,15 ආදී වශයෙන් දීර්ඝ කාලීනව ලබා දෙන ලද වාරික වශයෙන් අයකරගත යුතු වේ. එසේවුවද, ණය ලබා දීම සහ අයකර ගැනීමවලට අදාල තොරතුරු විධිමත්ව වාර්තා කිරීමට තොරතුරු පද්ධතියක් නොමැතිවීම නිසා ණය සම්බන්ධයෙන් අදාල නිවැරදි තොරතුරු විගණනයට ලබාගත නොහැකිවිය. තවද, පවත්නා පද්ධතියේ දත්ත වෙනස් කිරීම සහ මූල්‍ය වංචාවන් දිගින් දිගටම දිස්ත්‍රික් කාර්යාල වලින් වාර්තා වීම හේතුවෙන් ණය ශේෂ හා ණය ශේෂ කපා හැරීම් වල නිවැරදිභාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 - දේපළ , පිරියත හා උපකරණ,**

(i) ප්‍රමිතියෙහි 65 වන ඡේදය පරිදි වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අවම වශයෙන් සෑම වර්ෂයකට වතාවක් සමාලෝචනය කර අපේක්ෂිත තත්වයන් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 - ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කල යුතු වේ. එසේ වුවද 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් රුපියල් මිලියන 28.82 ක්වූ දේපළ , පිරියත හා උපකරණ සම්බන්ධයෙන් එබදු සමාලෝචනයක් කර නොතිබුණි. තව ද පිරිවැය රු. මිලියන 218.85 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද අඛණ්ඩව භාවිත කරමින් පැවතුනි. එම වත්කම්වල ඵලදායී ජීව කාලය හා සාධාරණ වටිනාකම නැවත තක්සේරු කර ගිණුම්ගත කර ඉහත රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 සහ 3 පරිදි ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයෙහි 27 හා 47 ඡේද අනුව ඉඩම් වටිනාකම් සාධාරණ අගයට ගිණුම්ගත කල යුතු වුවද 1987 හා 1988 වර්ෂවලදී අත්පත් කරගෙන තිබූ හන්තාන නිවාඩු නිකේතනයට අයත් පර්චස් 17.43 ක් වූ ඉඩම අත්පත් කරගෙන වසර 30 කට අධික කාලයක් ඉක්මවා ගොස් තිබුණද , සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එහි වටිනාකම් රු.2,520 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම්**, 47 ඡේදය පරිදි අසම්භව්‍ය බැරකම් හඳුනාගෙන එයින් සියයට 60 ක් හෝ සියයට 90 ක ප්‍රමාණයක් ප්‍රතිපාදනය කළ යුතු වේ. එසේවුවද, අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්ති 8.1 හි සඳහන් කර තිබූ පරිදි අධිකාරියට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් අධිකරණවල ගොනුකර තිබූ නඩු 26 ක් සම්බන්ධයෙන් අසම්භාව්‍ය වන්දි ලෙස හඳුනාගත් රු. මිලියන 2118.2 ක මුදලින් සියයට දහයක් පමණක් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 - අගය හුවමාරු ගණුදෙනුවලින් පැන නගින අයභාර**

(i) ප්‍රමිතයෙහි 16 වන ඡේදය අනුව අගය හුවමාරු ගණුදෙනුවලින් පැන නගින අයභාර මුදල් හෝ මුදල්වලට සමාන දෑ ගලා ඒම විලම්භිත කරන විටක ප්‍රතිශ්‍යාවේ සාධාරණ වටිනාකම ලැබූ හෝ ලැබිය යුතු වූ නාමික මුදල් ප්‍රමාණයට වඩා අඩු වන විට ආරෝපිත පොලී අනුපාතයක් (imputed rate of interest) භාවිතා කරමින් සියළුම අනාගත ලැබීම් වට්ටම් කිරීමෙන් ප්‍රතිශ්‍යාවේ සාධාරණ වටිනාකම නිශ්චය කල යුතු වේ. තවද ප්‍රතිශ්‍යාවේ සාධාරණ වටිනාකම හා නාමික අගය අතර, වෙනස ප්‍රමිතියේ 33 හා 34 වන ඡේදය පරිදි පොලී අයභාර ලෙස හඳුනා ගත යුතු වේ. එසේ වුව ද අධිකාරිය විසින් වාරික වශයෙන් අයකර ගැනීමේ පදනම මත සහනදායී පොලී අනුපාත යටතේ දීර්ඝ කාලීන බදු පදනමින් ලබා දී ඇති නිවාස හා ඉඩම්වලට අදාලව අයකරන වාරික හා පොළී සම්බන්ධයෙන් අධිකාරිය එපරිදි කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයෙහි 87 B ඡේදය ප්‍රකාරව සමූහයේ ගිණුම්, ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල බව සහතික කිරීමට අධිකාරියේ සහ පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවලට සුදුසු ගැලපීම් කිරීම කල යුතු වුව ද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පරිපාලිත සමාගම් වන ඕෂන්විව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අනුගමනය කර තිබියදී එයට අදාළ ගිණුම්කරණ පිළිවෙත් ඒකාකාරීව ගැලපීම් නොකර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 -** හුවමාරු නොවන ගනුදෙනුවලින් වන අයභාරය, 44 ඡේදය දක්වා ඇති විධිවිධානවලට පටහැනිව හුවමාරු නොවන ගණුදෙනුවලින් සමාලෝචිත වර්ෂයේ දී අධිකාරියට ලැබුණු රු. මිලියන 346.19 ක් වූ රාජ්‍ය ප්‍රදාන, අයභාර ලෙස හඳුනා ගත යුතු වුවත් එසේ හඳුනා නොගෙන සංචිත යටතේ දක්වා තිබුණි.

(ඊ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 12 - කල්බදු,** 59 වන ඡේදය අනුව කල්බදු දීමනාකරුවන්ගේ මූල්‍ය ප්‍රකාශන තුල මූල්‍ය කල්බදු සම්බන්ධයෙන් හෙළිදරව් කල යුතු වුවත් අධිකාරිය විසින් කුලී පදනම මත ලබා දී තිබූ මහල් නිවාස වල වටිනාකම රු.මිලියන 81.62 ක් මූල්‍ය කල්බදු ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.

(උ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 - ආයෝජන දේපළ ,** 7 වන ඡේදය අනුව බදු කුලී ඉපයීම් හෝ ප්‍රාග්ධන වටිනාකම් වැඩි වීම් සඳහා හෝ ඒ අරමුණු දෙකම සඳහා තබා ගෙන ඇති ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් හෝ යන දෙකම ආයෝජන දේපල ලෙස සැලකිය යුතු වුවත් අධිකාරිය සතු කුලී / බදු පදනම් මත ලබා දී ඇති රු. මිලියන 1024.23 ක් වූ නිවාස ,දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. එසේම පිරිවැය රු.මිලියන 3.81 ක් වූ කුලී / බදු පදනම් මත ලබා දීමට අපේක්ෂිත නිවාස හා කඩ සාප්පු 5 ක් ආයෝජන දේපල ලෙස ගිණුම්ගත නොකර තොගය ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, අධිකාරියේ කුලී/බදු පදනමට ලබාදී තිබූ කඩසාප්පු 1809 ක වටිනාකම හා කුලී / බදු පදනම් මත ලබාදීමට හඳුනාගෙන තිබූ කඩකාමර 37 ක වටිනාකමද ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 14 - සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම,** 16 ඡේදය අනුව අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ හෙළිදරව් කලයුතු ප්‍රමාණාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(එ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 17 - බාණ්ඩ වාර්තාකරණය,** 9 වන ඡේදය අනුව අස්පීත්වයක එහි අරමුණු ඉටුකර ගැනීමේහිලා අතීත කාර්යසාධනය ඇගයීම් සහ අනාගත සම්පත් වෙන්කිරීම් පිලිබඳ තීරණ ගැනීමට, මූල්‍ය තොරතුරු වෙන්වෙන්ව වාර්තා කිරීම් සඳහා අස්පීත්වයේ වෙන්කොට දැක්විය හැකි ක්‍රියාකාරකම් හඳුනාගත යුතු වුවත්, අධිකාරියට එලෙස වෙන් වෙන්ව හඳුනාගත හැකි නිවාස විකුණුම්, ඉඩම් විකුණුම් හා බදුදීම්, නිවාස ණය ලබාදීම්, නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම්, සේවාදායක ව්‍යාපෘති යනාදී ක්‍රියාකාරකම් වෙන්ව හඳුනාගෙන කාර්යසාධනය ඇගයීම් කර නොතිබුණි.

(ඒ) අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් අංක 13 අනුව මුදල් ගෙවීමකින් තොරව නිවාස ඉදිකිරීමේ අරමුණින් රජයේ ඉඩම් අත්පත් කර ගැනීමේ දී ඉඩමේ වෙළඳපොල වටිනාකම හා මූලික වියදමට සමාන මුදලක් 2013 වසරේ සිට ගිණුම් වල දැක්විය යුතු අතර සංචිත ලෙස හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඔ) අධිකාරිය සතු හෙක්ටයාර් 473.15 ක් වූ ඉඩම් කොටස් 8,286 ක වටිනාකම සහ 2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. මිලියන 436.59 ක් වූ අධිකාරියේ කාර්යාල හා කුලී පදනම මත ලබා දෙන ලද ගොඩනැගිලි පිහිටි ඉඩම් ප්‍රමාණයන් නිවැරදිව හඳුනාගෙන එම ඉඩම් වටිනාකම් තක්සේරුකර ගිණුම් ගතකර නොතිබුණි.

(ඕ) කොළඹ දිස්ත්‍රික් කාර්යාල මූල්‍ය ප්‍රකාශනයට අනුව සමාලෝචිත වර්ෂයේ ඉඩම් විකුණුම් වටිනාකම රු.මිලියන 19.86 ක් වුවද, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.මිලියන 13.03 ක් විය. මේ අනුව ඉඩම් විකුණුම් වටිනාකමේ රු.මිලියන 6.83 ක වෙනසක් නිරීක්ෂණය වූ නමුත් එයට හේතු අනාවරණය නොවුණි.

(ක) විගණනයට ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛණ අනුව වර්ෂය සඳහා අඩමාණ ණය වෙන්කිරීම් රු. මිලියන 368.56 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි එය රු. මිලියන 370.82 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු. මිලියන 2.26 කින් ඌනගණනය වී තිබුණි.

(ග) මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේ දී අධිකාරිය විසින් බදු පෙර අලාභය රු. මිලියන 1,287.41 ක් ලෙස දක්වා තිබුණ ද, විස්තීරණ ආදායම් ප්‍රකාශයට අනුව නිවැරදි බදු පෙර අලාභය වනුයේ රු. මිලියන 1,196.26 ක් විය. ඒ අනුව මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. මිලියන 91.15 න් අධිගණනය වී තිබුණි.

තවද, මුදල් නොවන වෙනස් වීම් යටතේ මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ලාභ / අලාභ ගණනයේ දී ගැලපිය යුතු වූ අඩමාණ ණය හා පාරිතෝෂික සඳහා වෙන් කිරීම් පිළිවෙලින් රු. මිලියන 370.82 ක් හා රු. මිලියන 53.84 ක් නියමිත පරිදි ගලපා නොතිබුණි. මේ හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. මිලියන 424.66 ක් වැඩියෙන් දක්වා තිබුණි. එසේම විගණනයට ඉදිරිපත් කරන ලද විස්තර අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රදාන ලැබීම් රු. මිලියන 1,576.52 ක් වුවද මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබූ ප්‍රදාන ලැබීම් රු. මිලියන 1,678.29 ක් වූයෙන් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු. මිලියන 101.77 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ව) නිවාස දෙපාර්තමේන්තුව පැවති කාලවකවානුවේදී සිදු කර තිබූ නිවාස පවරා ගැනීමකදී එම නිවාස හිමියන් වෙත නිකුත් කර තිබූ ඇප කර මත ගෙවිය යුතු රු. මිලියන 13.54 ක් ජංගම නොවන වගකීම් යටතේ CHP ලෙස දක්වා තිබූ නමුත් ඊට අදාල විස්තර ඇතුලත් ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඡ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ටෙන්ඩර් තැන්පතු රු. මිලියන 5.11 සඳහා වයස් විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.මේ හේතුවෙන් කල් ඉකුත් වූ තැන්පතු පැවතියේ දැයි විගණනයේ දී නිශ්චය කල නොහැකි විය.

(ඩ) 2022 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය රු. මිලියන 104.35 ක් ද ගෙවිය යුතු ශේෂය රු. මිලියන 52.51 ක් ද ලෙස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේ වුව ද නාගරික සංවර්ධන අධිකාරියේ ලෙජර ගිණුම් අනුව එදිනට අධිකාරිට ගෙවිය යුතු ශේෂයක් නොතිබූ අතර ලැබිය යුතු ශේෂය රු. මිලියන 41.83 ක් ලෙස දක්වා තිබීම නිසා අධිකාරියට ලැබිය යුතු ශේෂයේ රු. මිලියන 104.35 ක් ද ගෙවිය යුතු ශේෂය රු. මිලියන 10.63 ක් ද වෙනස්ව පැවතිණි. එම වෙනස්කම් වලට අදාල හේතු විගණනයට අනාවරණය නොවුණි.

(ක) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 - දේපල පිරියත හා උපකරණ,** 50,51 ඡේද ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අවම වශයෙන් සෑම වර්ෂයකට වතාවක් සමාලෝචනය කර අපේක්ෂිත තත්වයන් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කල යුතු වේ. එසේ වුවද 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ පරිපාලිත සමාගම් වූ ඕෂන්වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් රු. මිලියන 45.97 ක්වූ දේපළ , පිරියත හා උපකරණ සම්බන්ධයෙන් එබදු සමාලෝචනයක් කර නොතිබුණි. තවද, රු.මිලියන 28.20 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ අතර කවදුරටත් භාවිතා කරමින් පැවති නමුත් එම වත්කම්වල ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීම සම්බන්ධයෙන් සුදුසු පියවර ගෙන නොතිබුණි.

(ද) ආදායම් බද්දට යටත් වන තාවකාලික වෙනස් වීම් ගණනයේ දී බදු වර්ෂය තුල අත්පත් කර ගත් වත්කම් වලට අදාලව ඉදිරියේදී ඉඩදෙන ප්‍රාග්ධන දීමනාව රු. මිලියන 4.55 ක් ද්විගණනය වීම් නිසා සමාලෝචිත වර්ෂයේ සමාගමේ විලම්භිත වගකීම් රු. මිලියන 1.54 කින් ඌනගණනය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ

වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමූහයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමූහයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම් වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම්, අධීක්ෂණය හා කාර්යසාධනය සඳහා මා වගකිව යුතුය. මෙම විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ අ, ආ ,ඉ,ඊ,උ ලෙස දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති, විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනතේ I කොටසේ 3 (1) වගන්තිය	අධිකාරියට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 6 දෙනෙකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර එක් සාමාජිකයකු මුදල් විෂය භාර අමාත්‍යාංශයේ නියෝජිතයකු විය යුතු වේ. 2023 මැයි 19 දිනැති මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අංක MF1/01/16/01/117-NHDA/02 දරණ ලිපියට අනුව වර්ෂ දෙකක කාලය තුළ අධිකාරියට භාණ්ඩාගාර නියෝජිතයන් ලෙස ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තිදෙනෙකු පත්කර තිබූ නමුත් අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ කටයුතු කිරීම අපහසු බව දන්වා ඔවුන් ඉල්ලා අස්වී තිබූ බව ලේකම්වරයා වෙත දන්වා තිබුණි. තවද මෙම ඉල්ලා අස්වීම් සම්බන්ධයෙන් අධිකාරියේ සභාපතිවරයා සමඟ සාකච්ඡා කර ගත හැකි පියවර පිළිබඳ දැනුම් දෙන ලෙස දන්වා තිබුණද එබඳු දැනුම්දීමක් 2023 අගෝස්තු 15 දක්වා සිදු කර නොතිබුණි. මේ අනුව 2022 වර්ෂයේ ඔක්තෝම්බර් සිට 2023 අගෝස්තු දක්වා මුදල් අමාත්‍යාංශ නියෝජනයක් නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා ඉඩම් පැවරීම්, නිවාස ව්‍යාපෘති වෙනස් කිරීම් නිලධාරීන් බදවා ගැනීම් සම්බන්ධයෙන් තීරණ ගෙන තිබුණු අතර මෙම තීරණවල විධිමත්භාවය පිළිබඳ ගැටලු සහගත

කත්ත්වයක් පැවතුණි.

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
I	මුදල් රෙගුලාසි 135	මූල්‍ය බලතල පැවරීම යම් නිශ්චිත කාලයකට වරක් ප්‍රතිශෝධනය කළ යුතු වුවත් අධිකාරිය විසින් 2016 වර්ෂයෙන් පසු මූල්‍ය බලතල පැවරීම ප්‍රතිශෝධනය කර නොතිබුණි.
II	මුදල් රෙගුලාසි 369	අධිකාරිය සතු බැංකු ගිණුම් වලින් නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ එකතුව රු. මිලියන 2.062 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි අනුව කටයුතු කර නොතිබූ අතර එකතුව රු.77,666 ක් වූ චෙක්පත් 2 ක් වසර 28 ක සිට නිරවුල් වී නොතිබුණි.
(ඇ)	2003 මැයි 30 දිනැති අංක 12 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.4 ඡේදය	ආයතනයක සේවකයන් රේඛීය අමාත්‍යාංශයට හෝ වෙනත් ආයතනයක් වෙත කැඳවීමේ අනුමැතියකින් තොරව මුදාහැරිය නොහැකි වන අතර එසේ විධිමත් අනුමැතියක් මත මුදාහරින්නේ නම් එම කාලය තුල කිසිදු ගෙවීමක් සිදු නොකළ යුතුවේ. එහෙත් එයට පටහැනිව අධිකාරියේ නිලධාරීන් 09 දෙනෙක් අමාත්‍යාංශ, සංස්ථා සහ සමාගම් වෙත මුදාහැර තිබුණු අතර එයින් නිලධාරීන් 07 දෙනෙකුට වර්ෂය තුළදී අධිකාරිය විසින් ගෙවා තිබූ රු. මිලියන 3.6 ක් වූ වැටුප් සහ දීමනා ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි මාර්ගෝපදේශ	
I	2.3 ඡේදය	අධිකාරී සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කර නොතිබුණු අතර අධිකාරිය සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛණය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

II	3.4 ඡේදයේ (ix) වගන්තිය	වැඩ බැලීමේ පත් කිරීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර, තනතුරට පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීම් නොපමාව කළයුතු වන අතර පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නොවේනම් අනෙක් නිලධාරීන් අතර රාජකාරී බෙදාදිය යුතුවේ . එහෙත් තනතුරු 19 ක් සඳහා වැඩ බැලීම වසර 01 සිට වසර 03 දක්වා දීර්ඝකාලීනව සිදුවන බව නිරීක්ෂණය විය.
III	4.2 ඡේදයේ "එවි"වගන්තිය	අඩුම තරමින් කාර්තුවකට වතාවක් විගණන කළමනාකරණ කමිටුව රැස්විය යුතු අතර එහි නිර්දේශ සහිත වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත්කළ යුතු වුවද අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.
(ඉ)	2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 3 වගන්තිය	රාජ්‍ය ආයතන මඟින් පවත්වන උත්සව, විවෘත කිරීම්, සම්මන්ත්‍රණ ඇතුළු අත්‍යවශ්‍ය නොවන හා ප්‍රමුඛ නොවන වියදම් අත්හිටුවා ඒවා සඳහා රාජ්‍ය මුදල් භාවිතා නොකරන ලෙස නියම කර තිබූ නමුත් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය එම චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ උත්සව කටයුතු වෙනුවෙන් රු.මිලියන 2.272 ක් වැයකර තිබුණි.
(ඊ)	2022 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙළ කර විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත් අධිකාරිය 2019,2020 හා 2021 යන වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා 2023 සැප්තැම්බර් 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) අධිකාරිය සතු හෙක්ටයාර 125.18 ක පැවති ඉඩම් කැබලි 3,110 ක් අනවසර පදිංචිකරුවන් විසින් භුක්ති විඳින අතර, එම ඉඩම් නියමානුකූල කිරීමට අවශ්‍ය නීතිමය කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) අධිකාරිය සතු කොළඹ 10 ඩාර්ලි පාරේ පිහිටි අක්කර 01 යි පර්චස් 26.5 ක ඉඩමේ නිවාස සහ වෙළඳ සංකීර්ණයක් සහිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා ප්‍රසිද්ධ මිල කැඳවීමකින් තොරව 2005 නොවැම්බර් 09 දිනැති කැබිනට් අනුමැතිය මත BAY SAT MBH (Pvt) LTD විදේශ සමාගමට ලබාදී තිබුණි. එම සමාගම සමග 2006 ජූනි 23 දින ඵලඹී ගිවිසුම් ප්‍රකාරව ඉඩමේ වටිනාකම රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ රු. මිලියන 650 ක තක්සේරුව මත අයකිරීමටත් , වසර 06 ක් තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු රු.මිලියන 162 ක ලාභාංශයක් අධිකාරියට ලබාදීමටත් එකඟවී තිබුණි. නමුත් BAY SAT MBH (Pvt) LTD සමාගම යෝජිත සංවර්ධන කාර්යයන් ඉටු නොකර 2006 වර්ෂයේදීම ඉන් ඉවත්වී තිබූ අතර එම කාර්යය L & T Infrastructure Development සමාගමට පවරා දී තිබුණි මෙම නව සමාගම සමග අධිකාරිය 2016 දී ගිවිසුම් ගතවීමේදී ඉඩම් සඳහා නව තක්සේරු වාර්තාවක් ලබා නොගෙන වසර 10 කට පෙර එනම් 2006 වර්ෂයේදී ලබාගන්නා ලද තක්සේරු වටිනාකම වූ රු. මිලියන 650 වටිනාකමට පවරා දී තිබුණි. 2016 මැයි 05 දින ගිවිසුම් යටතේ මුදල් ගෙවීමට පෙර අංක 983 දරන ඔප්පුව මඟින් 2016 මැයි 05 දිනදීම මෙම ඉඩමේ අයිතිය සමාගමට පවරා දී තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව රු.මිලියන 712 විදේශීය මුදලින් ගෙවිය යුතු විය. එහෙත් එයට පටහැනිව ඉඩමේ කැබලි අංක 2,3,4 යන බිම් කොටස් 3 සම්පත් බැංකුවට උගස්කර ලබාගන්නා ලද රු.මිලියන 800 ක මුදලින් 2016 මැයි 05 දිනැති සම්පත් බැංකු චෙක්පත් දෙකක් මඟින් ශ්‍රී ලංකා රුපියල්වලින් අධිකාරියට ගෙවීම් කර තිබුණි.

කෙසේ වුවද 2017 ඔක්තෝබර් 31 දින දක්වාම L & T Infrastructure Development සමාගම විසින් ද යෝජිත සංවර්ධන කාර්යයන් ඉටුකර නොතිබුණි. මේ අතර සමාගම විසින් OAK නැමැති සමාගම වෙත මෙම ඉඩමේ කැබලි අංක 05 කොටස ඔප්පුවක් මඟින් විකුණා තිබූ අතර OAK Street (PVT) සමාගම එම ඔප්පුව මහජන බැංකුවේ උකස්කර රු.මිලියන 950 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. අධිකාරිය විසින් විකුණුම්කර ඔප්පුව අවලංගු කර තිබූ අතර OAK Street (PVT) සමාගම අධිකාරියට එරෙහිව නඩු 3ක් ශ්‍රේෂ්ඨාධිකරණයේ , දිසා අධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ගොනුකර තිබූ අතර ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් නඩු තීන්දුවක් ලබාදෙන තෙක් ඉඩමේ භුක්තිය OAK සමාගම වෙත ලබාදී තිබුණි. ඉහත කරුණු අනුව අධිකාරිය විසින් සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම් ලබා දීමේ දී සංවර්ධන කාර්යයන් ඉටු නොකරන පාර්ශවයන් සම්බන්ධයෙන් එළඹෙන ගිවිසුම් වල කොන්දේසි පරිදි කටයුතු කර නොමැති බවත් අධිකාරිය සමඟ ගිවිසුම්ගත වන පාර්ශවයන්ට පක්ෂපාති ලෙසත් කටයුතු කර ඇති බවත් නිරීක්ෂණය විය.

(ඇ) අධිකාරිය සතු නාවල පරංගියා කුඹුර නැමති අක්කර 05 පර්චස් 10 ක ඉඩම කැබිනට් තීරණයකට අනුව 2004 වර්ෂයේදී වසර 03 ක් ඇතුළත නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා Eco Home Lanka Ltd සමාගම සමග ගිවිසුම්ගත වී තිබුණු අතර ඉඩමේ රජයේ තක්සේරු වටිනාකම වූ රු.මිලියන 75 කට කොන්දේසි සහිත සින්නක්කර ඔප්පුවක් මගින් පවරාදී තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති කාර්යයන් ඉටු නොකිරීමේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ කොන්දේසි ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි. තවද එම ඉඩම පැවරීමේදී 2004 වර්ෂයේ තක්සේරු වටිනාකම වූ රු.මිලියන 121.5 ක් වෙනුවට 2003 වර්ෂයේ තක්සේරු වටිනාකම වූ රු.මිලියන 75 කට පැවරීමට තීරණය කර තිබූ අතර එය 2004 තක්සේරු වටිනාකමට වඩා රු. මිලියන 46.5 කින් අඩු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, සමාගම විසින් ගිවිසුම්ගත පරිදි සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු වෙනුවට පවරා දෙන ලද ඉඩමෙන් පර්චස් 29.44 ක් රු.මිලියන 196.5 කට සෙලින්කෝ හොස්පිට්ල්ස් සර්විස් සමාගමට 2006 වර්ෂයේදී විකුණා තිබුණි. ඒ අතර ඉතිරි ඉඩම සෙලාන් බැංකුවට උගස් කර රු.මිලියන 697.5 ක් ද ලබාගෙන තිබුණි. 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනතේ 8 (1) වගන්තිය යටතේ 2020 ජූනි 26 දින අධිකාරිය විසින් ඔප්පුව අවලංගු කර තිබූ අතර සමාගම ඊට එරෙහිව නඩු පවරා තිබුණි.

තවද, 2020 සැප්තැම්බර් 01 දිනැති අංක 15/2020 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් මෙම ඉඩම ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් හා ගිවිසුමකින් තොරව පෞද්ගලික සමාගමකට රු.100,000 ක මාසික කුලියකට ජලසම්පාදන උපකරණ ගබඩාවක් පවත්වා ගෙන යාම සඳහා ලබා දී තිබුණු අතර 2022 ඔක්තෝබර් 01 දින සිට එහි මාසික කුලිය රු.500,000 දක්වා වැඩිකර කාලය 2023 ජනවාරි 31 දක්වා දීර්ඝකර තිබුණි. එහි ඉදිකිරීම් ද්‍රව්‍ය රැස් කිරීමට අමතරව විශාල කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් , බැකෝ යන්ත්‍රයක්, සහ ජෙනරේටරයක් වර්ෂ ගණනාවක සිට ඉඩමේ විනාශවීමට ඉඩහැර තිබුණු බව ද නිරීක්ෂණය විය.

අධිකාරිය විසින් ව්‍යාපෘති සඳහා ඉඩම් බැහැර කිරීමේදී නිසි පරිදි ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය නොකිරීම, අවශ්‍ය කොන්දේසි ඇතුළත් කර නිවැරදිව ගිවිසුම් සකස් නොකිරීම, නියමිත තක්සේරු වටිනාකම් ලබා නොගැනීම හා නිසි අධික්ෂණයකින් යුතුව කටයුතු නොකිරීම යන කරුණු හේතුවෙන් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. එහෙත් අධිකාරිය විසින් අදාල කරුණු සඳහා වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) අධිකාරිය සතු වූ දඹුල්ලේ රංගිරිගම පිහිටි අක්කර 154 පර්චස් 38 ක ඉඩමෙන් අක්කර 5 ½ ක් කඩදාසි කර්මාන්ත ශාලාවක් ඉදි කිරීමට විධිමත් අනුමැතියකින් තොරව 2007 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී තිබූ අතර, ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණි. 2012 වර්ෂයේ දී කඩදාසි කර්මාන්තය සඳහා යොදා ගත් ඉඩම අක්කර 2 ක් බැවින් ඉතිරි අක්කර 3 ½ නැවත අධිකාරියට ලබා දෙන ලෙස අධිකාරිය විසින් දඹුල්ල ප්‍රාදේශීය ලේකම් වෙතින්

ඉල්ලා තිබුණි. මෙම ඉඩමේ ගොඩනැගිල්ල ඉදි කිරීමට අත්තිවාරම පමණක් යොදා තිබූ අතර, කඩදාසි කර්මාන්තයට අමතරව පරිසර හිතකාමී සංචාරකකරණය, ඓන්ද්‍රික වගාවන් සහ ස්වකැමැත්තෙන් සිදු කරන ව්‍යාපෘති සිදු කිරීමට නියමිත බව එම සමාගම විසින් 2013 දී අධිකාරියට දන්වා තිබුණු නමුත් එවැනි ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දී නොතිබුණි. එසේ වුවත් 2016 දී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අක්කර 5 ½ ක් සඳහා රු. මිලියන 2.13 ක තක්සේරු වාර්තාවක් සහ බදු කුලිය රු.85,000 ලෙස වාර්තාවක් ලබා ගෙන එම කුලී වටිනාකම් අයකර ගැනීමට සමාගම සමඟ 2019 දී ගිවිසුමකට එළඹී තිබුණි. බදු ගිවිසුමේ 7 වන කොන්දේසිය අනුව කඩදාසි කර්මාන්තය හැර වෙනත් කාර්යයක් සඳහා බදු දේපළ භාවිතා කළ නොහැකි වුවත් බදුකරු විසින් කඩදාසි කර්මාන්තය වෙනුවට කාමර 12 ක් සහිත හෝටල් ගොඩනැගිල්ලක් බදු ඉඩමේ ඉදිකර තිබුණු අතර බදු ගිවිසුමේ 18 වගන්තිය අනුව ගිවිසුමේ කොන්දේසි කඩ කරන විටෙක නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වුවත්, අධිකාරිය විසින් නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම විගණනයේ දී මතභේදාත්මක විය.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) අධිකාරිය සතු හෙක්ටයාර 335.58 ක හිස් ඉඩම් කැබලි 4199 ක් පැවතිය ද ඒවා ආයෝජන දේපළ ලෙස හඳුනාගෙන ආදායම් උත්පාදනය කර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ආ) "ඔබට ගෙයක් රටට හෙටක්" යන නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයට අනුව තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් වෙත එක් නිවසක් සඳහා උපරිම අධාර මුදල රු.600,000 ක් වන ලෙස ඉදි කිරීමේ ප්‍රගතිය මත අදියර 5 කින් ලබා දෙන අතර, පළමු ආධාර වාරිකය ලැබී දින 60 තුල ඉදි කිරීම් අවසන් කල යුතු වේ. එසේ වුවද නියදි පරීක්ෂාවකට අනුව මාතලේ, ගම්පහ, නුවරඑළිය, කුරුණෑගල, අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල ආධාර ලබා දීමට තෝරා ගත් ප්‍රතිලාභීන් 767 ක් වෙත සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අධිකාරිය විසින් ලබා දී තිබුණේ පළමු වාරිකය වූ රු.ලක්ෂය බැගින් පමණක් බැවින් නිවාසලාභීන් නිවාස ඉදිකිරීම් ආරම්භ කර තිබුණ ද එම කටයුතු අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) මාළිගාවත්ත දිස්ත්‍රික් කාර්යාලයට අයත් රථ ගාල් 6 ක් පැවති අතර, එම A,B,C,D රථගාල්වලින් 2014 ජනවාරි සිට මැයි දක්වා රු.මිලියන 1.308 ක් අය විය යුතුව තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයටත් එම මුදල අය කරගෙන නොතිබුණි. 2016 සිට 2020 දක්වා වරින්වර විවිධ පුද්ගලයන් විසින් රථගාල් පවත්වා ගෙන ගොස් තිබූ නමුත් ඒ වෙනුවෙන් බදු ගිවිසුම්වලට එළඹී නොතිබුණි. එමෙන්ම 2020 සිට රථගාල් 05 ක් අනවසරයෙන් පරිහරණය

කර තිබුණි. තක්සේරු වාර්තාව අනුව මේ හේතුවෙන් අධිකාරියට අහිමි වී තිබූ ආදායම රු.මිලියන 46.5 ක් විය. තව ද, කුළී ලිපිගොනු නිවැරදිව හා ආරක්ෂිතව පවත්වා නොගැනීම නිසා නිහ මුදල් අය කර ගැනීමට නොහැකි වී තිබුණු බවද නිරීක්ෂණය විය. අධිකාරිය විසින් මෙම රථගාල් විධිමත් පරිදි පවත්වා ඉහල ආදායමක් උපයා ගත හැකිබව නිරීක්ෂණය වුවද එසේ නොකිරීම මතභේදාත්මක විය.

(ඇ) අධිකාරියේ මාතලේ දිස්ත්‍රික් කාර්යාලයට අයත් දඹළුගම පිහිටි හෙක්ටයාර 10.52 ක ඉඩමෙන් හෙක්ටයාර 0.146 ක් ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ද, හෙක්ටයාර 2.21 ක් මාතලේ ප්‍රාදේශීය සභාවට ද, හෙක්ටයාර 0.7763 ක් නාගරික සංවර්ධන අධිකාරියට ද, හෙක්ටයාර් 0.1014 ක් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට ද කාර්යාල පවත්වා ගෙන යාම සඳහා ලබා දී තිබූ නමුත් කිසිදු බදු කුලියක් අය කර නොතිබුණි.

(ඉ) අධිකාරියේ මාළිගාවත්ත දිස්ත්‍රික් කාර්යාලය යටතේ ප්‍රදීපා උත්සව ශාලා 04 ක් සහ ප්‍රජා ශාලා 06 ක් පවත්වා ගෙන යනු ලබන අතර, 2020 වර්ෂයේ සිට වරින් වර එම උත්සව ශාලා හා ප්‍රජා ශාලා පොලිසිය, ගුවන් හමුදාව, යුධ හමුදාව, වකුගඩු බද්ධ කිරීමේ ආයතන වෙත නවාතැන් දී තිබුණ ද, ගාස්තු අය කර නොතිබූ අතර ඒ හේතුවෙන් රු.මිලියන 3.6 ක ආදායමක් අහිමි වී තිබුණි. තවද එම ආයතන සමඟ ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබූ බැවින් ජල, විදුලි බිල්පත් ද අධිකාරියට දැරීමට සිදු වී තිබුණි. එමෙන්ම 2022 ජනවාරි සිට ජූනි දක්වා මෝදර ප්‍රදීපා ශාලාව සහ ප්‍රජා ශාලා 05 ක් නිශ්කාර්යව පැවති අතර මාළිගාවත්ත ප්‍රදීපා ශාලා 2 ක් සමාලෝචිත වර්ෂයේ ජනවාරි - මැයි දක්වා ආදායම් උපයා නොතිබූ අතර රු.237,435 ක් නඩත්තු කටයුතු වෙනුවෙන් වැයකර තිබුණි.

(ඊ) 2022 දෙසැම්බර් 31 දින වන විට අධිකාරිය පෞද්ගලික ආයෝජකයන් සමග එක්ව නිවාස ව්‍යාපෘති 10ක් ආරම්භ කර තිබූ අතර ඒ සඳහා ඉඩම් ලබා දීම වෙනුවෙන් රු.මිලියන 180.70ක් අධිකාරියට ලැබී තිබූ අතර එයින් රු. මිලියන 167.36ක් 2013-2017 අතර කාලය තුළ ලබා දුන් ඉඩම් වෙනුවෙන් ලැබී තිබුණි. මේ අනුව ඉඩම් ලබා දී වසර 5කට වැඩි කාලයක් ගත වුවත් ව්‍යාපෘති 08 ක කර්යයන් අවසන් කර නොතිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් අත්තිකාරම් ලෙස අධිකාරිය ලබා දී තිබූ රු මිලියන 291.47 ක අත්තිකාරම්වලින් රු මිලියන 233.48 ක් ලබාදී වර්ෂ දෙකක් ද රු මිලියන 57.61ක් ලබාදී වර්ෂ 5කටත් වැඩි කාලයක් ගත වී තිබුණද කොන්ත්‍රාත් කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් මෙම අත්තිකාරම් මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2016 ඔක්තෝබර් 14 දිනැති අංක 16/2040/701/032 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂය තුළදී එක් ගම්මානයකට නිවාස 25 බැගින් නිවාස 12,500 කින් සමන්විත නිවාස ව්‍යාපෘති 500 ක් රු. මිලියන 6,250 ක ඇස්තමේන්තුගත

පිරිවැයකට ඉදි කිරීමට තීරණය කර තිබුණි. 2022 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය ආරම්භ කර වසර 05 ක් ගතවුවත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉදිකර අවසන් කර තිබූ ආදර්ශ ගම්මාන සංඛ්‍යාව 368 ක් වූ අතර ඒ යටතේ ඉදිකළ යුතු නිවාස ඒකක ගණන 10,070 ක් වී තිබූ නමුත් පදිංචියට සුදුසු මට්ටමේ නිවාස සංඛ්‍යාව 7577 ක් පමණක් විය. ඒ වෙනුවෙන් වැයකරන ලද මුදල රු.මිලියන 4,798 ක් වී තිබුණි. මෙම ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය යටතේ ඉදිකරමින් පැවති නිවාස ඒකක 2,430 ක් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී වෙන් කර නොතිබූ බැවින් එම ව්‍යාපෘති යටතේ ඉදිකිරීම් සිදු කර නොතිබුණි.

(ආ) 1984 – 1989 කාලයේ දී ක්‍රියාත්මක කර තිබූ නිවාස දස ලක්ෂය වැඩසටහන යටතේ ලබා දී තිබූ ණය මුදල් සඳහා 2022 දෙසැම්බර් 31 දිනට වසර 33 ක් ගත වී තිබුණත් එයින් රු. මිලියන 291.9 ක මුදලක් ද 1990 සිට 1992 දක්වා වර්ෂ තුල ක්‍රියාත්මක කරන ලද නිවාස පහලොස් ලක්ෂයේ වැඩසටහන යටතේ ලබා දුන් ණය මුදල් සඳහා වසර 30 ක් ඉක්ම ගොස් තිබුණද රු. මිලියන 192.5 ක මුදලක් ද අයකර ගැනීමට නොහැකිවී පැවතුණි.ණය අයකර ගැනීම සඳහා නිසි පරීක්ෂාවක් සිදු කර ණය අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග නොගැනීම මේ තත්ත්වයට සෘජුව බලපා තිබුණි.

(ඇ) අධිකරියේ ආරක්ෂක සේවයේ නිලධාරින් ගම් උදාව වැඩසටහන් වලදී වෙනත් ආයතන වල ප්‍රදර්ශන කුටි සඳහා ආරක්ෂාව සැපයීම වෙනුවෙන් සේවයේ යෙදවීමෙන් අධිකාරියට ලැබිය යුතු රු. මිලියන 6.32 ක ශේෂයක් විවිධ ණයගැතියෝ යටතේ පැවතුණි. එයින් රු. මිලියන 2.99 ක් අයවිය යුතු ආයතන පිළිබඳ තොරතුරු ද විගණනයට ඉදිරිපත් නොවූ අතර ඉතිරි මුදල වූ රු. මිලියන 3.3 අදාල ආයතනවලින් අයකර ගැනීමට ද නොහැකිව පැවතුණි. අධිකාරිය විසින් ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම මේ සඳහා හේතු වී තිබුණි.

(ඈ) 2022 දෙසැම්බර් 31 දිනට ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයෙන් ලැබිය යුතු රු. මිලියන 230.8 ක ශේෂයක් පැවති අතර ඒ තුල වර්ෂ 15 කට පෙර සිට පැවත එන රුපියල් මිලියන 44.86 ක ශේෂයක්ද පැවතුණි. එම ශේෂ කිසිවක් අයකර ගැනීමට නොහැකිව පැවති අතර ශේෂ තහවුරු කිරීමද විගණනයට ඉදිරිපත් නොවුණි. සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු සම්බන්ධයෙන් එකඟතාවයන්ට නොඑළඹීම මෙම තත්වයට හේතු වී තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල රඳවා ගත් තැන්පතු ලෙස සඳහන් රු. මිලියන 208.56 ක් තුල දිස්ත්‍රික් කාර්යාල 05 ක තැන්පතු එකතුව වූ රු. මිලියන 1.49 ක් වසර 3 සිට 31 අතර කාල පරාසයන් අතරද එකතුව රු. මිලියන 175.32 ක් වසර 2 ක් අතරද පැවති නමුත් මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගෙන නොතිබුණි. ව්‍යාපෘති කටයුතු කාලීනව ඉටු නොකිරීම මේ තත්වයට හේතු වී තිබුණි.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 2,164 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 1,716 ක් විය. එසේ වුවද එක් එක් තනතුරු විශ්ලේෂණයේදී පුරප්පාඩු 728 ක් හා අතිරික්තතා 181 ක් පැවතුණි.

(උ) නිවාස සංකීර්ණ අළුත්වැඩියා කිරීම සඳහා කොන්ත්‍රාත් 72 ක් වෙනුවෙන් ලබාදී තිබූ රු. මිලියන 504.50 ක් වූ අත්තිකාරම් මුදල් වලින් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 300.37 අවුරුදු 3 සිට අවුරුදු 5 දක්වා කාල පරාසයන් තුල ද රු. මිලියන 204.1 ක් වසර 5ට වැඩි කාල පරාසයන් තුළද පැවති නමුත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙයින් රු. මිලියන 145.21 ක් ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ද රු. මිලියන 176.51 ක් රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව වෙතද රු. මිලියන 182.82 ක් වෙතත් ආයතන හා පුද්ගලයින් වෙත ද ලබා දී තිබුණි. කොන්ත්‍රාත් කටයුතු කාලීනව ඉටු නොකිරීම හා දුර්වල ව්‍යාපෘති අධීක්ෂණය මේ තත්ත්වයට හේතු වී තිබුණි.

(ඌ) අධිකාරිය සතු නිවාස යෝජනා ක්‍රමවලට යාබදව පවතින නිවාස සකස් කිරීමට යොදාගත නොහැකිව ඉතිරි වී තිබූ කුඩා යාබද ඉඩම් ලෙස එකතුව හෙක්ටයාර 3415.76 ක් වූ ඉඩම් කැබලි 977 ක් පැවතිය ද එම ඉඩම් ඵලදායී කටයුතු සඳහා යෙදවීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කටයුතු කර නොතිබුණි.

(එ) අත්පත් කර ගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීම ප්‍රමාද වන අවස්ථාවලදී ප්‍රමාද පොලී ගෙවීමට අධිකාරියට සිදු වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එසේ ගෙවිය යුතු වන්දි මුදල රු.මි.41.2 ක් සඳහා ගෙවිය යුතු ප්‍රමාද පොළී මුදල රු.මි.93.50 ක් වී තිබුණි. මේ අනුව ඉඩම් අත්පත් කර් ගැනීමේ දී වන්දි ගෙවීමට ප්‍රමාද වීම නිසා ගෙවිය යුතු වන්දි මුදල මෙන් දෙගුණයකටත් වඩා වන්දි පොළී මුදලක් ගෙවීමට සිදු වීමෙන් අධිකාරියට පාඩු සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට විවිධ ණයහිමි ශේෂය ලෙස දක්වා තිබූ රු.මි.1,554.3 ක් තුළ පශු සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.මිලියන 13.31 ක් ද පැවති අතර, එය වසර 13 ක් ගත වී ඇතත් ගෙවීමට හෝ විධිමත් අනුමැතියකින් ආදායමට ගැලපීමට කටයුතු කර නොතිබුණි. මහනුවර වතු නිවාස ගිණුමේ පැවති රු.මි.75.51 ක ණයහිමි ශේෂය නිරවුල් කිරීමට වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණු අතර එම ශේෂය 2017 සිට 2021 දක්වා ඉහළ ගොස් පැවතුණු අතර මේ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කර තිබූ නිවාස ණය හා ආධාර වැඩසටහන් අතර "ඔබට ගෙයක් රටට හෙටක්" "ආධාර වැඩසටහන යටතේ 2021 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද නිවාස 8,153 ක ඉදි කිරීම් කටයුතු සඳහා රු. මිලියන 2,589 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. 2022 වර්ෂයේදී රු. මිලියන 388 ක් වැයකර නිවාස 5,878 ක් ඉදි කර තිබූ අතර නිවාස 6353 ක ඉදිකිරීම් ආරම්භ කල ද අවසන් කර නොතිබුණි. එසේ පැරණි ඉදිකිරීම් අවසන් නොකර

2022 දී අළුතින් මෙම වැඩසටහන යටතේ නිවාස 1485 ක් සඳහා ආධාර ලබා දීමට සැලසුම් කර තිබූ අතර එයින් නිවාස 19 ක පමණක් ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණි. 2022 වර්ෂයේ දී අභ්‍යන්තර මුදල් ප්‍රතිපාදන යටතේ අළුතින් ආරම්භ කළ නිවාස ණය වැඩසටහන සඳහා රු. මිලියන 600 ක ප්‍රතිපාදන වෙන් කර නිවාස 1000 ක් ඉදි කිරීමට සැලසුම් කර තිබුණද රු. මිලියන 147.42 ක් වැය කර නිවාස 391 ක් පමණක් ඉදි කර තිබුණි.

(ඕ) "මිහිදු නිවාස" වැඩසටහන යටතේ 2021 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද නිවාස 557 ක වැඩ 2022 වර්ෂයේ දී රු. මිලියන 92.23 ක් වැය කර අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද නිවාස 210 ක් පමණක් ඉදිකර තිබුණි. 2022 වර්ෂයේ දී අළුතින් නිවාස 77ක වැඩ ආරම්භ කිරීමටත් ඉන් නිවාස 21 ක් ඉදිකිරීම අවසන් කිරීම සඳහාත් රු. මිලියන 39.5 ක් වෙන් කර තිබුණද රු. මිලියන 17.83 ක් වැය කර නිවාස 08 ක් පමණක් ඉදිකර තිබුණි.එමෙන්ම සෙවණ ආධාර වැඩසටහන යටතේ 2022 වර්ෂය තුල රු. මිලියන 75 ක් වෙන්කර නිවාස 100 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණ ද රු. මිලියන 32.18 ක් වැය කර නිවාස 94 වැඩ ආරම්භ කර තිබුණ අතර එක් නිවසක ඉදිකිරීම් පමණක් අවසන් කර තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය තුළදී කෑගල්ල දිස්ත්‍රික්කයේ ආබාධිත පුද්ගලයන් සඳහා නිවාස 346 ක් ඉදි කිරීමට රු. මිලියන 84 ක් වෙන් කර තිබුණද රු. මිලියන 37.8 ක් වැය කර නිවාස 118 ක් පමණක් ඉදිකර තිබුණි. තව ද "විරු සුමිතුරෝ" නිවාස වැඩසටහන යටතේ රු. මිලියන 1027.5 ප්‍රතිපාදන මත නිවාස 946 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණ ද රු. මිලියන 890.75 ක් වැය කර නිවාස 850 ක් පමණක් ඉදිකර තිබුණි.

(ග) 2017 සහ 2019 වර්ෂ වලදී ආරම්භ කර තිබූ ඉන්දියානු නිවාස ආධාර වැඩසටහන යටතේ නිවාස 2400 ක් රු. මිලියන 1200 ක ප්‍රතිපාදන මත ඉදි කිරීමට සැලසුම් කර තිබුණි. ඒ යටතේ 2022 වර්ෂයේ දී රු. මිලියන 242 ක ප්‍රතිපාදන මත නිවාස 820 ක් ඉදිකිරීම් සඳහා සැලසුම් කර තිබුණද රු. මිලියන 41.67 ක් වැය කර ඉදිකර තිබුණේ නිවාස 138 ක් පමණි. තව ද පැරණි නිවාස සංකීර්ණ අළුත්වැඩියා කිරීම යටතේ ගම්පහ හිඹුටු උයන නිවාස සංකීර්ණයේ මළ පද්ධතිය අළුත්වැඩියා කිරීමට වෙන් කර තිබූ රු. මිලියන 76 ක ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසානයට අතර ඉන් රු. මිලියන 51 ක් ජල සම්පාදන මණ්ඩලය වෙත ගෙවා තිබුණද අළුත්වැඩියා කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ච) 2012 වර්ෂයේ දී අධිකාරියට මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ අධිකාරියට ලැබී තිබූ රු.මිලියන 7.50 වටිනා අංක PE 1538 දරන වාහනය 2014 වර්ෂයේ දී අනතුරට ලක් වී නැවත භාවිතා කල නොහැකි වනසේ අලාභ හානියට පත්ව තිබූ අතර එය රක්ෂණ සංස්ථාව වෙත බාර දී තිබුණි. මෙම වාහනය සඳහා සම්පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගෙන තිබියදීත් ශ්‍රී ලංකා රාජ්‍ය සංස්ථාවෙන් 2021 වර්ෂයේ දී වන්දි මුදල ලෙස රු. මිලියන 5.74 ක් පමණක් ලැබී තිබුණි. මෙම වාහන අනතුරින් වූ පාඩුව ගණනය කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර

ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබූ අතර ලැබූ රක්ෂණ වන්දි මුදල් වාහනයක් මිලදී ගැනීමට වැය නොකර අධිකාරියේ පුනරාවර්ථන වියදම් සඳහා වැය කර තිබුණි. තව ද මෙම වාහනය සඳහා කල්බදු ගෙවීම් අයවැය දෙපාර්තමේන්තුවෙන් සිදු කල බවත් එම මුදල් නැවත එම දෙපාර්තමේන්තුවට ගෙවීම් කරන ලෙස අංක BD/GPS/130/09/Com/2020 හා 2023 මැයි 20 දිනැති ලිපිය මගින් දන්වා තිබුණ ද අධිකාරිය එම මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ජ) 2030 තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයට අනුව, අධිකාරිය විසින් සිය විෂය පථයට අදාල තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා දර්ශක හඳුනාගෙන නොතිබුණි.

(ට) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුල ප්‍රධාන ව්‍යාපෘති 7 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 4458.39 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද සත්‍ය වශයෙන් රු. මිලියන 3352.92 ක් පමණක් ලැබී තිබුණි. සැලසුම් කල සියපත ව්‍යාපෘති 2 ක කිසිදු කටයුත්තක් සිදු කර නොතිබූ අතර ව්‍යාපෘති 2ක ඉදිකිරීම් කටයුතු සියයට 22 හා 29 මට්ටමක පැවති අතර තවත් ව්‍යාපෘති 3 ක ප්‍රගතිය සියයට 5 ත් 8 ත් අතර පරාසයක් තුළ පැවතුණි.

(ඩ) හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබූ ග්‍රාම ශක්ති , විරුසුමිතුරෝ , පවිත්‍රතා සහ පානීය ජලය , ජනසෙවන යන ව්‍යාපෘති සඳහා 2018 , 2019 වර්ෂ වල වැය කර තිබූ එකතුව රු. මිලියන 61.47 ක් භාණ්ඩාගාරයෙන් ලබා දෙන බවට ලිඛිතව කිසිදු සඳහනක් කර නොමැති වුවද මහාභාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ණ) 2022 දෙසැම්බර් 31 දිනට හිඟ නිවාස කුලී ආදායම රු. මිලියන 216.76 ක් වූ අතර එයින් රු. මිලියන 192.59 ක් හෙවත් 88% ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවති අතර මේ තුල ප්‍රධාන කාර්යාලයේ ණය ශේෂ රු. මිලියන 25.05 ක් ද විය. අවුරුදු 3 ත් 5 ත් අතර කාලයක සිට අයවිය යුතු ශේෂය රු. මිලියන 5.51 ක් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති



නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02